# පටුන

පිටු අංකය


| | |
|---|---|
| කොමිෂන් සභා තොරතුරු | 04 |
| දැක්ම හා මෙහෙවර | 05 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව | 06 |
| හැඳින්වීම | 09 |
| තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය | 10 |
| කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය | 13 |
| පාලන හා මුදල් අංශය | 15 |
| සැලසුම් හා පර්යේෂණ අංශය | 26 |
| පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය | 36 |
| ජාතික වෘත්තීය සුදුසුකම් අංශය | 44 |
| තොරතුරු පද්ධති අංශය | 68 |
| මූල්‍ය ප්‍රකාශ | 79-98 |
| මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය | 79 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 80 |
| ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය | 81 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 82 |
| ශේෂ පත්‍රය සටහන් | 83 |
| මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ සටහන් | 85 |
| මූල්‍ය තත්ව ප්‍රකාශ සටහන් | 88 |
| මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශ උප සටහන් | 90 |
| මූල්‍ය තත්ව ප්‍රකාශ උප සටහන් | 93 |
| මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම | 95 |
| විගණකාධිපති වාර්තාව | 99 |
| විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු | 109 |

# உள்ளடக்கம்

பக்கஇல.

| | |
|---|---|
| ஆணைக்குழுத் தகவல்கள் | 116 |
| தொலைநோக்கு மற்றும் செயற்பணி | 117 |
| பணிப்பாளர் நாயகத்தின் அறிக்கை | 118 |
| அறிமுகம் | 121 |
| மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழுவின் அமைப்புக்கட்டமைப்பு | 122 |
| மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழுவின் பதவியணி | 125 |
| நிர்வாகம், நிதிப் பிரிவு | 127 |
| திட்டமிடல், ஆராய்ச்சிப் பிரிவு | 140 |
| பாடநெறி உரித்துச்சான்றளிக்கை, பயிற்சி நியமங்கள் பிரிவு | 150 |
| தேசிய தொழிற்திறன் தகுதிகள் பிரிவு | 158 |
| தகவல் முறைமைகள் பிரிவு | 182 |
| நிதிக் கூற்று | 193 - 212 |
| நிதிச் செயலாற்றுமைக் கூற்று | 193 |
| நிதி நிலைமைக் கூற்று | 194 |
| தேறிய சொத்துக்களில் மாற்றம் பற்றிய கூற்று | 195 |
| காசுப் பாய்ச்சல் கூற்று | 196 |
| நிதிக் கூற்றின் குறிப்புகள் | 197 |
| நிதி செயலாற்றுமைக் கூற்றின் குறிப்புகள் | 199 |
| நிதி நிலைமைக் கூற்றின் குறிப்புகள் | 202 |
| நிதி செயலாற்றுமைக் கூற்றின் உப குறிப்புகள் | 204 |
| நிதிக் கூற்றின் உப குறிப்புகள் | 207 |
| நிதி நிலைமைக் கூற்றிற்கான அட்டவணைகள் | 209 |
| கணக்காய்வு தலைமை அதிபதியின் அறிக்கை | 213 |
| கணக்காய்வு தலைமை அதிபதியின் அறிக்கைக்கான விளக்கம் மற்றும் விடைகள் | 223 |

# Content


| Content | Page No. |
|---|---|
| Information of the TVEC | 233 |
| Vision and Mission of the TVEC | 234 |
| Director General's Message | 235 |
| Introduction | 238 |
| Organization structure of the TVEC | 239 |
| Staff of the TVEC | 242 |
| Administration and Finance Division | 244 |
| Planning and Research Division | 255 |
| Standards and Accreditation Division | 265 |
| National Vocational Qualifications Division | 273 |
| Information Systems Division | 296 |
| Financial Statement | 307 - 326 |
| Statement of Comprehensive Income | 307 |
| Statement of Financial Position | 308 |
| Changes in Equity | 309 |
| Cash Flows Statement | 310 |
| Notes to the Financial Statement | 311 |
| Notes for the Statement of Comprehensive Income | 313 |
| Notes for the Statement of Financial Position | 316 |
| Sub Notes for the Statement of Comprehensive Income | 318 |
| Sub Notes for the Statement of Financial Position | 321 |
| Financial Highlights | 323 |
| Report of the Auditor General | 327 |
| Audit Answers | 337 |

# කොමිෂන් සභා තොරතුරු

| | |
|---|---|
| ආයතනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| අමාත්‍යාංශය | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| ලිපිනය | තුන්වන මහල, නිපුණතා පියස,<br>354/2 ඇල්විටිගල මාවත,<br>කොළඹ - 05. |
| ඊමේල් ලිපිනය | info@tvec.gov.lk |
| වෙබ් අඩවිය | www.tvec.gov.lk |
| දුරකථන අංකය | 011 - 5849291 |
| ෆැක්ස් අංකය | 011 - 2555007 |
| විගණකවරු | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>නිදහස් චතුරශ්‍රය,<br>කොළඹ - 07. |
| බැංකු කරුවන් | මහජන බැංකුව,<br>වයි. එම්. බී. ඒ. ශාඛාව,<br>බොරැල්ල. |

# දැක්ම

රැකියා වෙළඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට වෘත්තීය පුහුණුව ලැබීම අපගේ දැක්ම වේ.

# මෙහෙවර

අභියෝගාත්මක ලෝක වෙළඳ අවශ්‍යතා හා සමාජ ආර්ථික අරමුණු ඉටුවන කාර්යක්ෂම,
ඵලදායී හා ගුණාත්මකභාවය සහතික කළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිතකර පවත්වාගෙන යෑම අපගේ මෙහෙවර වේ.

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකා ආර්ථිකයට පිටුවහලක් වන්නා වූ වෘත්තීය හා කාර්මික අධ්‍යාපනයක් උදෙසා, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එහි සේවාලාභීන්ගේ අපේක්ෂා ඉටු කරමින් ඵලදායී හා ගුණාත්මකභාවයෙන් යුත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වාගෙන යාමේ කාර්යභාරය ඉටුකිරීමේදී 2015 වර්ෂයේදී අභියෝග මධ්‍යයේ වුවද සාධනීය ලෙස සහ අරුත්බරව කටයුතු කිරීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමි. 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ හා එහි සංශෝධිතයන් වන 1999 අංක 50 දරණ පනත කොමිෂන් සභාවේ මාර්ගෝපදේශකයා ලෙස සලකනු ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ආරම්භ වූ 2005 වර්ෂයේ සිට පසුගිය වසර 10 ක් මුළුල්ලේ කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක විය. මෙම ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් නිරීක්ෂණ පනත සංශෝධනය කිරීමේ කමිටුව විසින් විමසුමට ලක් කරන ලද අතර, කමිටුවේ අදහස් හා යෝජනා නැවත වතාවක් එම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. මෙම සාකච්ඡාමය ක්‍රියාවලිය අවසන් වූ විගස සංශෝධිත පනත පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

2013 වර්ෂයේ ආරම්භ කළ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන (SSDP) ක්‍රියාත්මක කිරීම 2014 වර්ෂයේ දී ආරම්භ විය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ඉවහල්වූ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය හා කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින් පුළුල් ලෙස ඉටුකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව මෙම වැඩසටහන සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යංශය සමග කොමිෂන් සභාව සහයෝගී ව කටයුතු කරමින් සිටී. රටේ ජනගහනය වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස සැලකෙන "විශ්වවිද්‍යාල විද්‍යායතන" (Univesity College) ස්ථාපිත කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රමුඛතම අරමුණයි. විදේශ රටවල හා ශ්‍රී ලංකාවේ රැකියා ඉල්ලුම ඇති ක්ෂේත්‍රයන්හි ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටමේ පාඨමාලා මෙම උසස් අධ්‍යාපන ආයතනයන්හි පැවැත්වීමට නියමිතය. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමයේ මූලධර්ම අනුව අදාළ පාඨමාලා ස්ථාපිත කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය කොමිෂන් සභාව විසින් එම වැඩසටහනට ලබාදෙන ලදි.

ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීමේ ඒකකය මගින් 2015 වර්ෂය තුළදී NVQ සහතික 44,148ක් නිකුත් කිරීමට හැකි විය. ඒ යටතේ පෞද්ගලික අංශයේ පුහුණු ආයතන වලට වැඩිම සහතික සංඛ්‍යාවක් නිකුත් කරන ලදී. 2015 වර්ෂය අවසාන වන විට සමස්ථ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය 165,508ක් දක්වා වැඩි වී ඇත. පසුගිය වර්ෂවල සහතික නිකුත් කිරීමේ සංඛ්‍යාලේඛන විමර්ශනය කිරීමේදී සහතික සඳහා ඉල්ලුම 50% කින් පමණ ඉහළගොස් ඇති බව පෙනී යයි.

සැලසුම් හා පර්යේෂණ අංශයේ කටයුතු අතරින් ලියාපදිංචි පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර සැපයීම මෙම වර්ෂයේ දී සිදු විය. ඒ යටතේ රුපියල් මිලියන 2.57 ක් රාජ්‍ය, පෞද්ගලික රාජ්‍ය නොවන හා පීඩාවට පත්වූ තරුණ තරුණියන්හට වෘත්තීය පුහුණුව ආයතන 14 ක පාඨමාලා 16 ක් සඳහා බෙදා හරිනු ලැබීය. ඒ යටතේ අදාල පාඨමාලා ප්‍රතිඵලයෙන් අනතුරුව ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීමට හැකියාව ලැබෙනු ඇත. පෙර වර්ෂවල ලබාදුන් මූල්‍යාධාර නිසිලෙස භාවිතාකර ඇත්දැයි විමර්ශනය කිරීමේ වැඩසටහනක් ද 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී.

අදාල පළාත් සභා සමග ඒකාබද්ධව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ඌව සහ මධ්‍යම පළාත් සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කරන ලදී. මෙලෙසම උතුරුමැද පළාත සඳහා ද සැලැස්මක් සකස් කිරීමට නියමිත අතර දැනට එහි කෙටුම්පත් සැකසෙමින් පවතී. මේ වන විට පළාත් 7 ක් සඳහා සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

වෘත්තීය පුහුණුවේ ගුණාත්මකභාවය ආරක්‍ෂා කිරීමේ වැඩසටහන යටතේ නව පුහුණු ආයතන 350 ක් 2015 වර්ෂයේදී ඇගයීම් කිරීමට සැලසුම් කර ඇති අතර 297 ක් ඇගීම් කරන ලදී. ඉන් ආයතන 152 ක් ලියාපදිංචි කරන ලදී. අපේක්‍ෂා කරන ඉලක්කය පුහුණු ආයතන 400 ක් ලියාපදිංචිය අලුත් කිරීමයි සැලසුම්කර ඇති ලියාපදිංචිය අලුත් කිරීම යටතේ පුහුණු ආයතන 343 ක් ඇගයීම්කර පුහුණු ආයතන 297 ක ලියාපදිංචිය අලුත්කිරීමට 2015 වර්ෂයේදී හැකි විය. සුපුරුදු පරිදි, පුහුණු ආයතන ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාල වැඩමුළු පැවැත්වීම හා ජාතික පුවත්පත්වල දැන්වීම් පළකරමින් මහජනතාවට නිසි මග පෙන්වීමද 2015 වර්ෂයේදී සිදු කරන ලදී. පාඨමාලා ප්‍රතීතන වැඩසටහන් යටතේ පාඨමාලා 611 ඇගයීම්කර එයින් පාඨමාලා 392ක් ප්‍රතීතනය කිරීමට 2015 වර්ෂයේ දී හැකි විය. ඒ අනුව ප්‍රතීතනය කරන ලද පාඨමාලා සංඛ්‍යාව 2015 වර්ෂය අවසාන වනවිට 2291ක් දක්වා ඉහළ යන ලදී. පෙර වර්ෂවලදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා 177 ක ප්‍රතීතනය අලුත් කරන ලදී. විදේශ රැකියා අවශ්‍යතාවය සඳහා පුහුණු ආයතනවල ලියාපදිංචිය සනාථ කිරීමේ ලිපි 2400 ක් 2015 වර්ෂයේ දී නිකුත් කරන ලදී. තනතුරු සඳහා බඳවා ගැනීමේදී අවශ්‍යවන වෘත්තීය පුහුණු සහතික සනාථ කිරීමේ ලිපි 475 ක් ද, 2015 වර්ෂයේ දී නිකුත් කරන ලදී. ආදායම් උත්පාදනය කිරීම යටතේ සමස්ථයක් ලෙස ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත් අලෙවියෙන්, පාඨමාලා ප්‍රතීතන හා ආයතන ලියාපදිංචිය තුළින් 2015 දී රු.මිලියන 6.1 ක් උපයා ගැනීමටද කොමිෂන් සභාවට හැකි විය.

ජාතික වෘත්තීය සුදුසුකම් (ඇගයීම්) ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අන්තර් ආයතන මෙහෙයුම් කමිටු රැස්වීම් 2015 වර්ෂයේදී 06 ක් පවත්වා වෘත්තීය පුහුණු ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමග තීරණවලට එළඹෙන ලදී. ජාතික වෘත්තීය සුදුසුකම් ලබා දීමට ඇගයුම් නිළධාරීන්ගේ සංචිතයක් පවත්වාගෙන යන අතර ඒ සඳහා 2015 වර්ෂයේදී 224 දෙනෙකු එම සංචිතයට බඳවාගත් අතර මේ වන විට මුළු සංචිතයන් ප්‍රමාණය 1945 දක්වා වර්ධනය වී ඇත.

තවද NVQ ඇගයීම් පැවැත්වීමේ සංගතභාවය ඇති කිරීම සඳහා අඛණ්ඩ විගණන කටයුතු සිදු කරන අතර ඒ අනුව 2015 වර්ෂයේදී විගණන කටයුතු 10ක් සිදුකර ඇත. රූපලාවන්‍ය හා හිසකෙස් ක්ෂේත්‍රයේ NVQ සහතික ලබාදීම සඳහා ඇගයීම් කිරීමට පෙර ලිඛිත පරීක්‍ෂණයක් පැවැත්විය යුතු අතර 2015 වර්ෂයේදී අයදුම්කරුවන් 9497 දෙනෙකු සඳහා මධ්‍යස්ථාන 53 කදී ලිඛිත විභාගයක් පවත්වා ඇත.

ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමට මෙන්ම තීරණ ගැනීම පහසු කිරීම පිණිස අවශ්‍ය වන ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු අඩංගු අර්ධ වාර්ෂික ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය හා වාර්ෂිකව නිකුත් කරන වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ඇතුලත් වෘත්තීය පුහුණුවට මග (TVET Guide 2015) ප්‍රකාශනය නිකුත් කිරීමට කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයට හැකිවිය. ඒ අතරම, කොමිෂන් සභාවේ පුවත්ලිපිය (News Letter) සකස් කිරීමටත් අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන සකස් කිරීමට 2015 වර්ෂයේදී තොරතුරු පද්ධති අංශයට හැකිවිය.

ඒ අතරම, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමටත් අනෙකුත් අංශවලට අවශ්‍ය පරිගණක පද්ධති සංවර්ධනය කිරීම හා පරිපාලනය කිරීමද ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමද 2015 වර්ෂයේදී තොරතුරු පද්ධති අංශය විසින් ඉටුකරන ලදී.

ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපනයේ නියාමන ආයතනය ලෙස කොමිෂන් සභාව ජාත්‍යන්තර නියෝජිත ආයතන සමග ඵලදායී සබඳතා පවත්වන අතර ඒ තුලින් ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට හැකිවන සබඳතා පැවැත්වීමට 2015 වර්ෂයේදී ද හැකි විය.

අවසාන වශයෙන් 2015 වර්ෂය තුළදී සියලුම කාර්යය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ සක්‍රීය දායකත්වය තුලින් පුහුණු ආයතනයන්හි, වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ අපේක්ෂා සාක්ෂාත්වන පරිදි කොමිෂන් සභාවේ කටයුතු ඉටුකිරීමට හැකිවීම පිළිබඳව මා ඉතාමත් සතුටට පත්වන අතර ඔවුන්ගේ වෘත්තීමය තෘප්තිය (Job Stisfaction) නැංවීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග නොමඳව, පුද්ගලිකවම සපුරාලීමට මා ඉදිරියටත් කටයුතු කරන බව සඳහන් කරමි. එසේම කාර්යය මණ්ඩලයේ දායකත්වය වෙනුවෙන් මාගේ අවංක ගෞරවාදරය ඔවුන්ට මින් පිරිනමමි.



මල්කාන්ති ජයවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

## 1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1990 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතා වලට සරිලන අයුරින් සියළුම මට්ටම්වල තාතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම

(ආ) සහතිකපත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

(ඇ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්ප ආයතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියළු ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

## 2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ

2015 වසර තුල කොමිෂන් සභා සංයුතිය

පනතේ 6 (1) (උ) වගන්තිය යටතේ කර ඇති පත්වීම් (2015 ජුනි 26 - 2015 ඔක්තෝබර් දක්වා)

| | | |
|---|---|---|
| 1 | මහාචාර්ය එන්.ආර්. අර්ථනායක මහතා<br>තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | - සභාපති |
| 2 | පූජ්‍ය බටුවංගල විජිත හිමි<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 3 | මහාචාර්ය යු.පී.ඒ පුස්සවල මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 4 | කේ.අයි. සෙනෙවිරත්න මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 5 | ආචාර්ය එම්. එම්. ගුණතිලක මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 6 | විජය ද අල්විස් මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 7 | කේ.වි. සරත් මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 8 | ප්‍රේමරත්න තිරාණගම මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 9 | ආචාර්ය ලක්ෂමන් වෙඩික්කාරගේ මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |
| 10 | චන්දන කස්තුරිආරච්චි මහතා<br>ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත | - සාමාජික |

පනතේ 6 (1) (අ) සිට (උ) වගන්ති යටතේ කර ඇති පත්වීම්

අ) මල්කාන්ති ජයවර්ධන මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්

ආ) ආචාර්ය එච්.එල්. ඔබේසේකර මහතා - සාමාජික
සභාපති
ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) ආචාර්ය ලයනල් පින්ටෝ මහතා - සාමාජික
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) ජේ.ඒ. රංජිත් මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව

ඉ) ආචාර්ය හිලරි ඊ සිල්වා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) පී.ඩබ්.ඩී.පී. සේනානායක මහතා - සාමාජික
මුදල් අමාත්‍යංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

උ) එම්.එච්. ආනන්ද වික්‍රමනායක මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

පනතේ 6(1)(ඌ) වගන්තිය යටතේ කර ඇති නව පත්වීම් (2015 දෙසැම්බර් 23)

1) මහාචාර්ය රජීව විජේසිංහ මහතා - සභාපති
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

2) කමල් බී. සිරිවර්ධන මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

3) ආර්.ඒ.ඩී. ආර්.මාලනී පීරිස් මහත්මිය - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

4) ආචාර්ය පූජ්‍ය කිරින්දේ අස්සජි හිමි - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

5) නිර්මලී වී හෙට්ටිආරච්චි මහත්මිය - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

6) බුද්ධික රුවන් මඩිහහේවා මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

7) ඩී. මහින්ද ගම්මන්පිල මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

8) ගරු.එන්.ඇන්තනී හියුමර් පින්ටෝ පියතුමා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

9) වඩිවෙල් පුත්තිරසිගමනී මහතා - සාමාජික
ගරු ජනාධිපතිතුමා පත් කරන ලද නියෝජිත

පනතේ 6 (1) (අ) සිට (උ) වගන්ති යටතේ කර ඇති පත්වීම්

අ) මල්කාන්ති ජයවර්ධන මහත්මිය - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්

ආ) ජේ.ඒ. පීරිස් මහතා - සාමාජික
සභාපති
ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) මේජර් ජනරල් ගාමිණි හෙට්ටිආරච්චි මහතා - සාමාජික
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) ජේ.ඒ. රංජිත් මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තුමේන්තුව

ඉ) ආචාර්ය හිලරි ඊ සිල්වා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) පී.ඩබ්.ඩී.පී. සේනානායක මහතා - සාමාජික
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

# 3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යකෂවරුන් පස් දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු ඇතුළු 88 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් 2015 වසර තුලදී කොමිෂන් සභවේ කාර්යභාර්ය ඉටු කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කර ගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශ පාඨමාලා
- ජාතික වෘත්තීය සුදුසකම් අංශය
- තොරතුරු පද්ධති අංශය

කළමණාකරන සේවා දෙපර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව කොමිෂන් සභාව සඳහා 114 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත් 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය 88 දෙනෙකුගෙන් සමන්විත විය. විස්තර පහත දක්වා ඇත.

| තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2015/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවන සංඛ්‍යාව |
|---|---|---|
| 01 අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 02 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 03 අධ්‍යක්ෂ | 06 | 04 |
| 04 අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 |
| 05 ශ්‍රම වෙළඳපොල විශ්ලේෂක | 01 | 01 |
| 06 නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ | 33 | 14 |
| 07 නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂන) | 01 | 01 |
| 08 සහකාර අධ්‍යක්ෂ (නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | 01 | 01 |
| 09 නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 |
| 10 සංඛ්‍යාලේඛණඥ | 01 | 01 |
| 11 පුස්තකාලායාධිපති/ප්‍රලේඛන නිළධාරි | 01 | 01 |
| 12 පරිපාලන නිළධාරි | 01 | 01 |
| 13 භාෂා පරිවර්තක (සිංහල/දෙමල/ඉංග්‍රිසි) | 01 | - |
| 14 සංවර්ධන නිළධාරි | 19 | 17 |

| තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2015/12/31 දිනට සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 15 තොරතුරු තාක්ෂණ නිළධාරී | 01 | 01 |
| 16 තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 02 |
| 17 පරිගණක යෙදවුම් සහායක | 06 | 05 |
| 18 පුස්තකාල/ප්‍රලේඛන නිළධාරී | 01 | - |
| 18 කළමණාකරන සහකාර (I ශ්‍රේණිය/II ශ්‍රේණිය/III ශ්‍රේණිය) | 16 | 16 |
| 19 රියදුරු (I ශ්‍රේණිය/II ශ්‍රේණිය/III ශ්‍රේණිය) | 12 | 12 |
| 20 කාර්යාල කාර්ය සහායක | 07 | 07 |
| එකතුව | 114 | 88 |

පුවත්පත් දැන්වීම් මගින් පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යක්ෂ තනතුරු 11ක් සඳහා අයදුම්පත් කැඳවූ අතර එයින් සුදුසුකම් සපිරූ 140ක් පමණ අයදුම්කරුවන්ට මූලික සම්මුඛ පරීක්ෂණයක් 2015.05.25,26,27,28 වන දිනයන්හි පවත්වන ලදී. මහමැතිවරණ කටයුතු පැවතීම හේතුවෙන් අවසන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම කල් දමන ලදී. අවසන් සම්මුඛ පරීක්ෂණයක් ඉදිරියේදී පැවැත්වීමට කටයුතු මේ වන විට සම්පාදනය කරමින් පවතී. 2015.05.29 වන දින සංවර්ධන නිළධාරී 08 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අයදුම්කරුවන් හත් දෙනෙකු තෝරා පත් කර ගන්නා ලදී.පරිගණක යෙදවුම් සහායක පුරප්පාඩු 03 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ 2015.05.29 වන දින පවත්වන ලද අතර එයින් සුදුසුකම්ලත් අයදුම්කරුවන් දෙදෙනෙකු තෝරා පත් කර ගන්නා ලදී. කළමණාකරන සහකාර තනතුර සඳහා ද 2015.05.29 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එක් නිළධාරියෙකු බඳවා ගන්නා ලදී. තවද අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන) හා (තත්ත්ව සම්මත ප්‍රතීතන) යන තනතුරු සඳහාද සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යක්ෂ(තතත්ව සම්මත ප්‍රතීතන) යන තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරන ලදී.

තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන තනතුරු නැවතත් පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර එම තනතුර සඳහා 2016 ජනවාරි මස 01 වැනි දින පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් මේ වන විට කැඳවා ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

නව සභාපතිතුමා සේවයට වාර්ථා කල වහාම ඔහුගේ රියදුරු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

# 4.0 පාලන හා මුදල් අංශය

කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍ය වන මානව හා මූල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළුව යටිතල පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිළධාරීන් 2015 වසර තුළදී කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ලදී.

## 4.1 2015 වසරේ පත්වීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එස්.එන්. වේරගල මෙනවිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| ඩී.ඩී. රාජවසම් මෙනවිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| ඒ.එච්.එන්. සඳමාලි මෙනවිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| එච්.ඒ.ඩී. දර්ශනිකා මෙනවිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| කේ.එච්.ඒ.ඊ. දීප්ති මිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| එල්.කේ. කොහොම්බන් මෙනවිය | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| එන්.එච්.එස්. දර්ශන මයා | සංවර්ධන නිළධාරී | 2015.06.05 |
| එස්.බී. කරුණානායක මයා | පරිගණක යෙදවුම් සහායක | 2015.06.05 |
| බී.එල්.කේ.පී. සංදීපනී මෙනවිය | කළමණාකරන සහකාර | 2015.06.08 |
| යු.පී.එල්. චන්දිම මයා | සංවර්ධන නිළධාරී | 2015.06.30 |
| අයි.එම්.පී.එච්. ලක්මාල් මයා | කාර්යාල කාර්ය සහායක | 2015.06.08 |
| එච්.එම්.වී.එන්. හේරත් මෙනවිය | පරිගණක යෙදවුම් සහායක | 2015.07.22 |
| ආර්.පී.තරිඳු හර්ෂනාත් මයා (කොන්ත්‍රාත් පදනම මත) | රියදුරු | 2015.11.11 |

## 4.2 2015 වසරේ සේවයෙන් ඉල්ලා අස්වීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ටි.ඩි.ආර්. වනිගසේකර මයා | සංවර්ධන නිළධාරී | 2015.06.19 |

## 4.3 2015 වර්ෂය තුල ක්‍රියාත්මක වු වැඩ බැලීමේ/වැඩ ආවරණය කිරීමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තේරී පත් වූ නිළධාරීන්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එස්.යු.කේ. රූබසිංහ මයා | අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන) වැඩ බැලීම සඳහා | 2015.10.28 |
| එම්.එල්.එන්.එස්. එදිරිසූරිය මිය | අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) වැඩ බැලීම සඳහා | 2015.04.01 |
| සුමින්ද අරුණකීර්ති මයා | පරිපාලන නිළධාරී වැඩ ආවරණය කිරීම | 2015.09.07 |
| එච්.බී. ඉන්දික සම්පත් මයා | ප්‍රධාන ලිපිකරු | 2015.09.07 |

අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) අංශයෙහි අධ්‍යක්ෂ ආචාර්ය උපාධි සදහා විදේශගත වී ඇති බැවින් මෙම තනතුරේ වැඩ බැලීම සඳහා ශ්‍රම වෙළඳපළ විශ්ලේෂක පත්කර ඇත. පරිපාලන නිළධාරි ලෙස කටයුතු කල නිළධාරිනිය අග්‍රාමාත්‍ය කාර්යාලයට අනියුක්ත කිරීම හේතුවෙන් මෙම තනතුර සඳහා වැඩ ආවරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාරවරයකු පත්කරන ලදී.

දේශීය හා විදේශීය පුහුණු

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව නිළධාරීන් දේශීය හා විදේශීය පුහුණුවීම්/සම්මන්ත්‍රණ වලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශිය හා විදේශිය පුහුණුවීම්/සම්මන්ත්‍රණ වලට සහභාගී වූ නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

## 4.4 විදේශීය සම්මන්ත්‍රණවලට සහභාගි වීම

2015 වර්ෂයේදී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට ලැබු ආරාධනා මත කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පහත සඳහන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට සහභාගි වී ඇත.

| නම | තනතුර | Title of Traning | Country | Time Duration |
|---|---|---|---|---|
| මල්කාන්ති ජයවර්ධන මැණිකේ මිය | අධ්‍යක්ෂ ජනරාල් | International Education fair | Moldives | 05/06/2015 10/06/2015 |
| | | online Educa, Berlin (OEB), | Berlin, Germany | 01/12/2015 07/12/2015 |
| පී.සී.පී. ජයතිලක මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | International Education fair | Moldives | 05/06/2015 10/06/2015 |
| | | Univoc conference | Germany | 29/06/2015 to 05/07/2015 |
| | | TVET Leadership Capacity Development in Bonn, | Germany | 2015/11/15 to 2015/11/21 |

# දේශිය පුහුණු - 2015

කාර්ය මණ්ඩලය වෙත දේශිය පුහුණු ලබාදීම පහත සඳහන් ආකාරයන්ට සිදු කරන ලදී.

වගුව 4.5 දේශිය පුහුණු වැඩසටහන්

| අංකය | නම | තනතුර | Traning | Institute (*) | Time |
|---|---|---|---|---|---|
| 01 | මල්කාන්ති ජයවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල් | National Management conference 2015 | Institute of Management Sri Lanka | 9/29/2015 |
| 02 | පී.සී.පී.ජයතිලක මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | Results Based Project Management | NILS | 18/19 August 2015 |
| 03 | වජිර පෙරේරා මයා | අධ්‍යක්ෂ(ජාතික වෘත්තීය සුදුසුකම්) | Seminar on Enviroment and Human Health | Institute Of Chemistry Ceylon | 22 Jan 2015 |
| | | | Seminar on cosmetic chemistry | Institute Of Chemistry Ceylon | 6/3/2015 |
| | | | National Management conference 2015 | Institute of Management Sri Lanka | 9/29/2015 |
| 04 | ඩබ්.පී.එම්.පී. ප්‍රේමචන්ද්‍ර මයා | අධ්‍යක්ෂ (පාලන) | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 05 | ඒ.එස්.අමරසිංහ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) | National Management conference 2015 | Institute of Management Sri Lanka | 9/29/2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 06 | චන්ද්‍රානි ප්‍රේමරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 07 | එම්.එල්.එන්.එස්. එදිරිසූරිය මිය | ශ්‍රම වෙළඳපොළ විශ්ලේෂක | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 08 | ඩබ්.එම්.ටී.ඒ. වීරකෝන් මයා | පුස්තකාලයාධිපති /ප්‍රලේඛන නිළධාරි | Super 5s kaizen management | NILS | 22,23 & 24 July 2015 |
| | | | International Libraries confence | NLSD | 6/30/2015 |
| 09 | ආර්.ජේ.සමරවීර මයා | අභ්‍යන්තර විගණක | National Management conference 2015 | Institute of Management Sri Lanka | 9/29/2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 10 | මංජුල විදානපතිරණ මයා | සහකාර අධ්‍යක්ෂ | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | ඩබ්.කේ.ඩී. හරිස්චන්ද්‍ර මයා | සහකාර අධ්‍යක්ෂ | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 12 | යු.ජී.ප්‍රියන්ත ධර්මසේන මයා | සහකාර අධ්‍යක්ෂ | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| | | | Msc | University Of Sri Jayawardenapura | 2015 |
| 13 | එච්.පී.කේ.එන්. බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ | Workshop on Attitudes and kills development | IHRA | 26/06/2015 |
| | | | Entrepreneurs and Employability | SDFL | 26/03/2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 14 | ආර්.මාදන් මයා | සහකාර අධ්‍යක්ෂ | Super 5s kaizen management | NILS | 22,23 & 24 July 2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 15 | බී.සී.හදපාන්ගොඩ මෙනවිය | පරිපාලන නිළධාරි | Workshop on Attitudes and skills development | IHRA | 24/04/2015 |
| 16 | එල්.පී.කරුණාදාස මයා | තොරතුරු තාක්ෂණ නිළධාරි | Traning Programme on NCS Development. | SSDP | 10th May -2015 |
| 17 | බී.එස්.ජේ.විපුල්සි මිය | සංවර්ධන නිළධාරි | Leadership and Team build | NILS | 22,23 April 2015 |
| | | | Master of crop production | University of Ruhuna | 2014/2016 |
| | | | Traning Programme on NCS Development. | SSDP | 2015/12/14 to 18 |
| 18 | අයි.ජී. කල්ප උදාර මයා | සංවර්ධන නිළධාරි | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| 19 | ටී.ඩී.ආර්. වනිගසේකර මයා | සංවර්ධන නිළධාරි | Leadership and Team build | NILS | 22,23 April 2015 |
| 20 | සී.සී.කේ. සමරවික්‍රම මයා | සංවර්ධන නිළධාරි | Leadership and Team build | NILS | 22,23 April 2015 |
| | | | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| 21 | එච්.ආර්.එම්.යු.යු විජේබණ්ඩාර මිය | සංවර්ධන නිළධාරි | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| 22 | ප්‍රසංග මුතුකුමාරණ මයා | සංවර්ධන නිළධාරි | Advanced Ms- Excel for Data Analysis | AAT | 5/26/2015 |
| 23 | ඩී.එන්.අයි.ඩී.ද සිල්වා මයා | සංවර්ධන නිළධාරි | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 24 | පී.පේ. උඩවත්ත මෙනවිය | සංවර්ධන නිළධාරි | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| 25 | ටී.ඒ.ඩබ්. මධුෂානි මෙනවිය | සංවර්ධන නිළධාරි | Entrepreneurs and Employability | SDFL | 26/03/2015 |
| | | | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 26 | එච්.එන්. සදමාලි මෙනවිය | සංවර්ධන නිළධාරි | Super 5s kaizen management | NILS | 22,23 & 24 July 2015 |
| | | | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 27 | කේ.ඒ.එච්. ඊෂා දීප්ති මිය | සංවර්ධන නිළධාරි | Procument Capacity Development | SLIDA | 28 & 29 August 2015 |
| | | | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 28 | ලිලාන් චන්දිම මයා | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| | | | Traning Programme on NCS Development | SSDP | 2015/12/14 to 18 |
| 29 | එන්.එච්.එස්. දර්ශන මයා | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 30 | එල්.කේ. කොහොම්ඹන් මෙනවිය | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 31 | ඩී. රාජවසම් මෙනවිය | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 32 | එස්. නිරෝෂා මෙනවිය | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 33 | එච්.ඒ. දේවින්දි මෙනවිය | සංවර්ධන නිළධාරි | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| | | | Strengthening Of Computer base Accounting | SSDP | 2015/11/20,26 2015/12/04,11 |
| 34 | වයි.පී.එස්. උදයකාන්ති මිය | තොරතුරු තාක්ෂණ සහකාර | MBA In MIS Degree | University Of Sri Jayawardenapura | 2014/2016 |
| 35 | ඩබ්.පී. සුමින්ද අරුණකිර්ති මයා | කළමණාකරන සහකාර | BLE Degree Register fees | University of Colombo | 2015 Year |

| | | | | | |
|---|---|---|---|---|---|
| 36 | ආර්.එන්.පී.ද සිල්වා මයා | කළමණාකරන සහකාර | Strengthening Of Computer base Accounting | SSDP | 2015/11/20,26 2015/12/04,11 |
| 37 | ඩී.බී.රුවිනි මංජුලා මිය | කළමණාකරන සහකාර | BLE Degree Register fees | University of Colombo | 2015 Year |
| 38 | එච්.බී.ඉන්දික සම්පත් මයා | කළමණාකරන සහකාර | Advanced Ms- Excel for data Analysist | AAT | 5/26/2015 |
| 39 | එන්.ඩබ්.පී.නදීක පිවන්ත මයා | කළමණාකරන සහකාර | Advanced Ms- Excel for Data Analysis | AAT | 5/26/2015 |
| 40 | පී.කේ. හෑගොඩආරච්චි මිය | කළමණාකරන සහකාර | Development of Sectarial Skills | NILS | 27,28 April 2015 |
| | | | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| | | | NVQ level 4 | NAITA | 2015 |
| 41 | එම්.ඩී.චාමලී ද සිල්වා මිය | කළමණාකරන සහකාර | NVQ level 3 | NAITA | 2015 |
| | | | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 42 | එස්.චතුරංගනී මෙනවිය | කළමණාකරන සහකාර | Advanced Ms- Excel for data Analysist | AAT | 5/26/2015 |
| 43 | පී.සී.ජනක්ද සිල්වා මයා | කළමණාකරන සහකාර | Workshop on Attitudes and skills development | IHRA | 26/06/2015 |
| 44 | ටී.මධුෂිකා මිය | කළමණාකරන සහකාර | Advanced Ms- Excel for Data Analysis | AAT | 5/26/2015 |
| 45 | බී. එල්. කේ . සන්දීපනී මෙනවිය | කළමණාකරන සහකාර | Workshop on Office Management & office practice | SDFL | 17 & 18 september 2015 |
| 46 | කේ.ඩබ්.ඒ. අනුරුද්ධිකා මෙනවිය | පරිගණක යෙදවුම් සහායක | Development of Sectarial Skills | NILS | 27,28 April 2015 |
| 47 | ඩී.එම්.එස්.ජීවන් සිරිපාල මයා | පරිගණක යෙදවුම් සහායක | B Teach Degree | University of Vocational Training | 2015 |
| 48 | ආර්.පී.ඒ.ටී.කුමාර මයා | කළමණාකරන සහකාර | BLE Degree Rigister fees | University of Colombo | 2014/2015 Year |
| | | | NVQ level 4 | NAITA | 2015 |
| 49 | එන්.ඩී.විජේසේකර මිය | කළමණාකරන සහකාර | NVQ level 4 | NAITA | 2015 |

(*) නිළධාරීන් පුහුණුව ලද ආයතන වල නම්

SSDP - Skill Sector Development Project
NILS - National Institue of Labour Studies
NLSD - National Librarian and Documantation Services Board
IHRA - Institue of Human Resource Advancement
SDFL - Skills Development Found Limited
AAT - Association of Accounting Technicians of Sri Lanka
NAITA - National Apprentice and Industrial Training Authority
SLIDA - Sri Lanka Institute of Development Administration

## විදේශ පුහුණු - 2015

වගුව 4.5 විදේශ පුහුණු වැඩසටහන්

| නම | තනතුර | Title of Traning | Country | Time |
|---|---|---|---|---|
| මල්කාන්ති ජයවර්ධන මැණිකේ මිය | අධ්‍යක්ෂ ජනරාල් | International Education fair | Moldives | 05/06/2015 10/06/2015 |
| | | online Educa, Berlin (OEB), | Berlin, Germany | 01/12/2015 07/12/2015 |
| පී. සී .පී .ජයතිලක මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | International Education fair | Moldives | 05/06/2015 10/06/2015 |
| | | Univoc conference | Germany | 29/06/2015 to 05/07/2015 |
| | | TVET Leadership Capacity Development in Bonn, | Germany | 2015/11/15 to 2015/11/21 |
| ජේ.ඒ.ඩී.ජේ.ජයලත් මයා | අධ්‍යක්ෂ(තොරතුරු පද්ධති) | Doctoral programm | Thailand | 2015/01/06-2018/12/20 |
| එස්.යූ.කේ. රූබසිංහ මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Capacity Development Programme for the teachers of vocational training Institutions | Korea | 2015/11/08 to 2015/11/21 |
| අජිත් කුසුම් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | Doctoral programm | China | 2015/10/01-2018/10/01 |
| පී.ඒ.එම්.යූ. ගනේපොල මයා | සහකාර අධ්‍යක්ෂ | Vocational Education Institution Management | China | 2015/05/11 to 2015/06/02 |
| පී.එම්.සී.පී. ගුණතිලක මයා | සහකාර අධ්‍යක්ෂ | Vocational Education Institution Management | China | 2015/05/11 to 2015/06/02 |
| ප්‍රියංගා නානායක්කාර මිය | සහකාර අධ්‍යක්ෂ | Vocational Education Institution Management | China | 2015/05/11 to 2015/06/02 |
| ටී.සෙන්තුරන් මයා | සහකාර අධ්‍යක්ෂ | Capacity Development Programme for the teachers of vocational training Institutions | Korea | 2015/11/08 to 2015/11/21 |
| එච්.පී.කේ.එන්. බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ | Young Leaders Training Programme on Economic Administration | Japan | 2015/11/15 to 2015/12/03 |

| | | | | |
|---|---|---|---|---|
| ආර්.මාදන් මයා | සහකාර අධ්‍යක්‍ෂ | Capacity Development Programme at NITTTR | India | 2015/11/23 to 2015/12/04 |
| මංජුල විදාණපතිරණ මයා | සහකාර අධ්‍යක්‍ෂ | Vocational Education Institution Management | China | 2015/05/11 to 2015/06/02 |
| ඩබ්.ජේ.එල්. ඒ.දමයන්ති මිය | සංඛ්‍යා ලේඛනඥ | Doctoral programm | Japan | 2015/10/01 -2018/10/01 |
| ඩී.එන්. අයි.ඩී.ද. සිල්වා මයා | සංවර්ධන නිළධාරි | Asia - Pacific education & Training | Malaysia | 2015/08/03 to 2015/08/06 |
| අයි ජී කේ කල්ප උදාර මයා | සංවර්ධන නිළධාරි | Young Leaders Training Programme on Economic Administration | Japan | 2015/11/15 to 2015/12/03 |

වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශ පුහුණු

පහත නම් සඳහන් නිලධාරීන් දෙදෙනා වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍යාධාර ලබාගෙන වැටුප් සහිතව විදේශ ගත වී ඇත.

1. අජිත් පොල්වත්ත මහතා (ආචාර්ය උපාධියක් සඳහා චීනයට)
2. ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මහතා (ආචාර්ය උපාධියක් සඳහා තායිලන්තයට)

ඊට අමතරව සංඛ්‍යාලේඛනඥ නිලධාරි ලෙසට කටයුතු කල ඩබ්.ජේ.එල්.ඒ. දමයන්ති මහත්මිය ද ආචාර්ය උපාධිය හැදෑරීමට වැටුප් රහිත නිවාඩු ලබා ගෙන 2015/10/01 සිට2018/10/01 දක්වා ජපානයට ගොස් ඇත.

4.7 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභා නිළධාරින්ගේ වෘත්තීය ආයතනවල සාමාජික ගාස්තු ගෙවීම්දී පහත සඳහන් නිළධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කර ඇත.

1. ඩබ්.පී.එම්.පී. ප්‍රේමචන්ද්‍ර මයා අධ්‍යක්ෂ (පාලන) - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජිකගාස්තු
2. ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) - වරලත් පරිගණක ආයතනය බ්‍රිතාන්‍ය
3. එස්.යු.කේ. රූබසිංහ මයා අධ්‍යක්ෂ (පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත) - ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය
4. වජිර පෙරේරා මහතා අධ්‍යක්ෂ (ජාතික වෘත්තීය සුදුසකම්) - ශ්‍රී ලංකා කළමණාකරන ආයතනය
5. ඒ.එස්. අමරසිංහ මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
6. එම්.එල්.එන්.එස්. එදිරිසූරිය මිය වැ.බ. අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොල විශ්ලේෂණ) - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
7. ආර්.ජේ. සමරවීර මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක හා විමර්ෂණ) - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජික ගාස්තු
8. ඩබ්.එම්.ටී.එම්. අනුර වීරකෝන් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සේවා) - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

## 4.8 මූල්‍ය ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙනු ඇත.
2015 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදී.

පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 94 කි.
ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 10 කි.

මෙම ප්‍රතිපාදන වලින් 2015 වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 82.2 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 8.050 ක් ද නිදහස් කරන ලදී.

2015 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම් 2014 වර්ෂය සමග සැසඳීමේදී පුනරාවර්තන ඇස්තමේන්තුව 17% ක වැඩිවීමක් වන අතර ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව 37.5% අඩුවීමක් දක්නට ලැබේ.

2014 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් නිදහස්කර ඇති අරමුදල් පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී පහත පරිදි වේ.

පුනරාවර්තන වියදම් සැසඳීමේදී 15% වැඩිවීමක් ද ප්‍රාග්ධන වියදම් 33% අඩුවීමක්ද පෙන්නුම් කර ඇත. කොමිෂන් සභාව 2015 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී රුපියල් මිලියන 11 ආදායමක් අපේක්ෂා කළ අතර ආදායම හා සත්‍ය ආදායම පහත පරිදි වේ.

| | ඇස්තමේන්තුගත ආදායම | සත්‍ය ආදායම |
|---|---|---|
| වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රකාශන විකිණීමෙන් | 3291000.00 | 3240741.00 |
| ආයතන ලිපාපදිංචිකිරීමේ ගාස්තු | 1793000.00 | 1792200.00 |
| ආයතන ප්‍රතීතනය කිරීමේ ගාස්තු | 1689000.00 | 2097300.00 |
| ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත්කිරීම හා විගණන ගාස්තු | 3767000.00 | 4140790.00 |
| ඇගයුම්කරුවන්ගෙන් ගාස්තු අයකිරීම් | 46000.00 | 369250.00 |
| | 1100000.00 | 11640281.00 |

## 4.9 අභ්‍යන්තර විගණනය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත. පෙර වර්ෂ වලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, කොමිෂන් සභා පනත හා කොමිෂන් සභාවට අදාල වන වෙනත් නීතිරීති වලට අනුකූලවීම විමසමින් අභ්‍යන්තර විගණන කටයුතු ඉදිරියට ගෙන යන ලදී. විගණන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌනතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු අදාල වර්ෂයේදී සිදු කරන ලදී.

1. 2015 ජනවාරි මස 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා විගණන හා කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත විය.

- ජී.ඩබ්ලිව්.ඩී.පී. සේනානායක මයා - කමිටු සභාපති
- මහාචාර්ය යූ.පී.ඒ. පුස්වැවල - කමිටු සාමාජික
- ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ සිල්වා - කමිටු සාමාජික
- ඩී.වී. චන්ද්‍රලතා මහත්මිය - නිරීක්ෂක

2. විගණන හා කළමනාකරණ කමිටුව නිසි පරිදි 2015 වර්ෂය තුළ අවස්ථා හතරකදී රැස්වන ලදි. එනම් 2015/08/05, 2015/08/11, 2015/09/30 සහ 2015/11/04 දිනයන් හීදි රැස්වන ලදී.

3. විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරමින් සාකච්ඡා කරන ලද අතර අවශ්‍යය අදාල ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලදි.

- අභ්‍යන්තර විගණන වැඩසටහන හා කාර්යයන් පිළිබඳව
- කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තා හා වාර්ෂික වාර්තාව පිළිබඳව
- කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යය සාධනය පිළිබඳව
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලන හා විධි ක්‍රම පිළිබඳව

4. අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව සැලසුම් කරන ලද ප්‍රධාන විගණන ප්‍රදේශ 6 ට ආවරණ කරන ලද අතර අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව සැලසුම් නොකරන ලද විගණන විමර්ශනයන් ද අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදි.

## 4.10 නීති කටයුතු

පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත 1990 අංක 50 දරණ (සංශෝධන) පනත මඟින් සංශෝධන වී ඇත. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පනතට අන්තර්ගත කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් පසු අදාළ පනත තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, ඊට අදාළ මූලික පියවර ගෙන ඇති අතර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකසන ලද කෙටුම්පත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම කෙටුම්පත් විශ්ලේෂණය කිරීම සඳහා කොමිෂන් සභාවේ හිටපු සභාපති මහාචාර්ය එන්.ආර්. අර්ථනායක මහතාගේ ආරාධනයෙන් කමිටුවක් රැස්කරන ලදී. ඒ අනුව, කමිටුව අවස්ථා දහයක දී රැස්වී පනත් කෙටුම්පතේ කරුණු සමාලෝචනය කරන ලද අතර ඒ කමිටුවෙහි පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුක්ත විය.

- මහාචාර්ය එන්.ආර්. අර්ථනායක මහතා (සභාපති)
- මල්කාන්ති ජයවර්ධන මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)
- ආචාර්ය ටී.ඒ. පියසිරි (වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උප කුලපති හා හිටපු අධ්‍යක්ෂ ජනරාල් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)
- එස්.ඩී.ආර්. පෙරේරා මහතා (හිටපු අධ්‍යක්ෂ ජනරාල් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)
- ජේ.ඒ. රන්ජිත් මහතා (අධ්‍යක්ෂ ජනරාල් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව)
- ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා (හිටපු සභාපති තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)
- බී.එච්.එස්. සුරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)
- චම්පිකා ධර්මසේන මහත්මිය (සහකාර අධ්‍යක්ෂ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශය)

කමිටුව විසින් වෙනස්කම් සිදුකරන ලද කෙටුම්පත කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත යොමු කරන ලදුව ඔවුන්ගේ යෝජනාවන්ද ඇතුලත් කර 2015 ඔක්තොබර් 14 වන දින පැවති කොමිෂන් සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව විසින් අදාළ කෙටුම්පත සලකා බැලීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුත් තනි කමිටුවක් පත් කරන ලදී.

- ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා (සභාපති)
- නීතිඥ ප්‍රේමරත්න තිරානගම මහතා (තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජික)
- මහාචාර්ය යූ.පී.ඒ. පුස්වැවල මහතා (කොමිෂන් සභාවේ සාමාජික)
- නිලන්ති සුගතදාස මහත්මිය (අතිරේක ලේකම් වෘත්තීය පුහුණු)

එම අනු කමිටුව විසින්ද සලකා බලන ලද කෙටුම්පත ඉදිරි කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා මේ වන විට සකස් කර ඇත.

## ලියාපදිංචි නොවූ තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීමට ගන්නා ලද පියවර

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමෙන් තොරව පවත්වා ගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරය යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් ගනු ලැබිණ. ඒ අනුව, පුවත්පත් දැන්වීම් පලකරමින් ලියාපදිංචි නොකර  පවත්වා ගෙන යනු ලබන ආයතන වෙත දැනුවත් කිරීමේ ලිපි යැවීම මගින් අදාල ආයතන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අතර මේ වන විට 2015 වසර සඳහා එවැනි ලිපි 48 ක් පමණ යවා ඇත. ආයතන 35 ක් පමණ මේ සඳහා යහපත් ප්‍රතිචාර දක්වා ඇත.

## මූල්‍යාධාර නිසිලෙස භාවිතා නොකල ආයතනයන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04(ඊ) හා 04(උ) වගන්තිය යටතේ පෞද්ගලික අංශයේ/රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතීතනය නොවී පවත්වා ගෙන යනු ලබන ආයතනයක් මගින් එම ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමද සිදු කරන ලදී. එහිදී HICMA පුහුණු ආයතනය (අක්කරෙයිපත්තුව) හා SAKURA පරිගණක පුහුණු ආයතනය (හොරණ) සමථයක් ඇති කර ගැනීමට නොහැකි වූ බැවින් එම ආයතන වලට එරෙහි නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුව වෙත යොමු කරන ලදී. සකුරා වෘත්තීය පුහුණු ආයතනයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර ඇති අතර HICMA පුහුණු ආයතනයේ මේ වන විට ක්‍රියාකාරීත්වයක් නොපවතින බවට සොයා ගෙන ඇති බැවින් එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නඩු පැවරීම සහ එහි මූලික පියවරක් වශයෙන් ඔවුන් වෙත එන්තරවාසි නිකුත් කිරීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.

## විමර්ෂන පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙම ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වශයෙන්, විවිධ ක්ෂේත්‍රයන්ට අදාල පුහුණු මධ්‍යස්ථාන වල සිදුවන ගැටලු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට අදාල ආයතන, පුහුණුවන්නන් සහ ඇගයීම් නිලධාරීන්ද පෙළඹී තිබේ.

එහිදී අපක්ෂපාති මැදිහත්කරුවෙකු වශයෙන් එම ගැටලු සමථයකට පත්කිරීමත් ඊට අවශ්‍ය ඇතැම් පරීක්ෂණ පැවැත්වීමක් සිදුකරයි. ඒ අනුව 2015 වර්ෂයේදී අදාල ආයතන හයක් සම්බන්ධයෙන් විමර්ෂණ පැවැත්වීමට කටයුතු කරන ලදී.

## කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2015 වර්ෂය සඳහා 2015 ජුනි මස 06 වන දින සාමාජිකයන් පත් කළ අතර, ඒ අනුව 2015 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04ක් පවත්වන ලදී.

නැවත වරක් නව සභාපතිවරයෙක් පත් වීමෙන් අනතුරුව 2015 දෙසැම්බර් මස 15 වන දින නව කොමිෂන් සභා සාමාජිකයන් පත් කරන ලද අතර 2015 දෙසැම්බර් මස 23 වන දින කොමිෂන් සභා රැස්වීමක් පවත්වන ලදී.

## 5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතෙහි පළමු අරමුණ වූ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම සඳහා සක්‍රිය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම.
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම.
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම.
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම.

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් හා පර්යේෂණ අංශය කාර්යමණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අංශය අධ්‍යක්ෂකවරයෙකු, සහකාර අධ්‍යක්ෂකවරු තිදෙනෙකු, සංවර්ධන නිළධාරිනියක, පරිගණක යෙදවුම් සහයක සහ කාර්යාල කාර්ය සහායකු වනසේ සංවිධානය වී ඇත.

ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන වැඩසටහන් 2015 වසරේදී ක්‍රියාත්මක කර ඇත.

### 5.1 රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශණය කිරීම

රාජ්‍ය, පුද්ගලික අංශවල හා රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු ආයතනයන් හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොල අදාලත්වය දියුණු කිරීම සඳහා අවශ්‍යවන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මගින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ඒ තුලින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ.

2015 මූල්‍යාධාර වැඩසටහන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන තුලින් අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ අනුව, එවන ලද අයදුම්පත්‍ර අතුරින් තෝරාගන්නා ලද පුහුණු ආයතනයන් ඇගයීමට ලක්කර මූල්‍යාධාර ලබාදීමට කටයුතු කරනලදී. 2015 වර්ෂය තුලදී රාජ්‍ය, පෞද්ගලික සහ පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතන යන අංශයන්ට මූල්‍යාධාර ලබාදීම පිලිබඳ විස්තර අංශ අනුව පහත වගු අංක 5.1 සහ ප්‍රස්ථාර 5.1 මගින් දැක්වේ.

වගුව 5.1 ලබාදුන් මූල්‍යාධාර ආංශික ව්‍යාප්තිය - 2015

| අංශය | 2015 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන) | | සත්‍ය වියදමෙන් මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | ආයතන සංඛ්‍යාව | වැයවූ මුදල (රු. මිලියන) |
|---|---|---|---|---|---|
| | ආරම්භක | සංශෝධිත | | | |
| රාජ්‍ය අංශය | 1.2 | 1.324 | 6 | 6 | 1.314 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය | 1.5 | 0.840 | 6 | 6 | 0.796 |
| පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතන | 0.4 | 0.600 | 4 | 2 | 0.460 |
| එකතුව | 3.1 | 2.764 | 16 | 14 | 2.570 |

ප්‍රස්ථාරය 5.1 අංශ අනුව මූල්‍යාධාර ලබාදීම




මූල්‍යාධාර ප්‍රදානය පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

### 5.1.1 රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර සැපයීම

රාජ්‍ය අංශයට මූල්‍යාධාර ලබාදීම 1999 වර්ෂයේ සිට වසර 16 ක් අඛණ්ඩව සිදුකරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ කොමිෂන් සභාව විසින් සකස් කරන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් මගින් හා ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂණ මඟින් හඳුනාගත් පුහුණු වැඩසටහන් රාජ්‍ය අංශයේ පුහුණු ආයතන තුළින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මූල්‍යාධාර ලබාදීමයි. හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතිඵලදායක ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අවකාශ සැලසීම මෙහිදී සිදුවේ. මූල්‍යාධාර ලැබූ වෘත්තීය පුහුණු ආයතන රාශියක පාඨමාලාවන් ගුණාත්මකව පවත්වාගෙන යනු ලබයි.

2015 වර්ෂයේදීත් නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් පරිබාහිර රාජ්‍ය අංශයේ පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව, අමාත්‍යාංශයෙන් පරිබාහිර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි රාජ්‍ය අංශයේ පුහුණු ආයතන වලින් මූල්‍යාධාර ලබාදීමට අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ සඳහා ලද ප්‍රතිචාර මත ලැබුණු අයදුම්පත්‍ර 35 අතුරින් තෝරාගන්නා ලද පළාත් සභා වෘත්තීය පුහුණු ආයතන සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබාදෙන ලදී.

2015 වර්ෂයේ රාජ්‍ය  අංශය සඳහා මූල්‍යාධාර ලබාදීමට රුපියල් මිලියන 1.324 ක් (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව) වෙන්කර තිබුණි.

එමගින් පලාත්සභා මගින් ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන 06 ක පාඨමාලා 06 ක් සඳහා රු. මිලියන 1.314 ක් ප්‍රදානය කරන ලදී. 2015 වර්ෂයට අනුමත සංශෝධිත ප්‍රතිපාදන වලින් 99.24% ක් පමණ වැයකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය අංශයේ කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර  ව්‍යාප්තිය පිළිබඳ  විස්තර වගු අංක 5:2 හි සඳහන්වේ.

වගුව 5:2     කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ව්‍යාප්තිය - 2015

| අංකය | කර්මාන්ත ක්ෂේත්‍රය | පාඨමාලා ගණන | ප්‍රදානය කළ මුදල (රු.) | ප්‍රතිශතය (%) (ප්‍රදානය කල මුළු මුදලින්) |
|---|---|---|---|---|
| 1. | නිෂ්පාදන ක්ෂේත්‍රය | 04 | 874,146.50 | 66.5% |
| 2. | ලෝහ සහ ලුහු ඉංජිනේරු ක්ෂේත්‍රය | 01 | 345,200.00 | 26.3% |
| 3. | රෙදිපිළි සහ ඇගළුම් ක්ෂේත්‍රය | 01 | 94,930.00 | 7.2% |
| එකතුව | | 06 | 1,314,276.50 | 100% |

ඉහත වගු අංක 5:2 අනුව, 2015 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ආවරණය වන පරිදි මූල්‍යාධාර ලබා දී ඇති අතර, එසේ ලබාදුන් මූල්‍යාධාර වලින් 66.5%ක් ලබාදී ඇත්තේ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාලව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සඳහාය.

එමෙන්ම, 2015 වර්ෂය තුළදී ලෝහ සහ ලුහු ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා 26.3% ක් හා රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තය සඳහා 7.2% ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානයකර ඇත. ඒ පිළිබඳ විශ්ලේෂණය ප්‍රස්ථාර අංක 5:2 මගින් දැක්වේ.

ප්‍රස්ථාරය 5:2     කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම



රාජ්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන එක් එක් ආයතන සඳහා 2015 වර්ෂයේදී ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් වෙන වෙනම වගු අංක 5:3 මගින් දැක්වේ.

වගුව 5:3 රාජ්‍ය අංශය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2015

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 1. | බල්ලපාන බහු තාක්ෂණ ආයතනය<br>බල්ලපාන<br>ගලිගමුව | රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය | අධිවේගී මැහුම් යන්ත්‍ර ශිල්පී (කර්මාන්ත)<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 94,930.00 |
| 2. | ලුහු ඉංජිනේරු පුහුණු ආයතනය<br>අතලහේන, හෙට්ටිමුල්ල,<br>කෑගල්ල | ලෝහ සහ ලුහු ඉංජිනේරු | පෑස්සුම් ශිල්පී<br>ජා.වෘ.සු. 3 වන මට්ටම | 345,200.00 |
| 3. | රජයේ යාන්ත්‍රික වඩු පාසල<br>කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව<br>නැගෙනහිර පළාත<br>කල්ලඩි | නිෂ්පාදන ක්ෂේත්‍රය | වඩුකාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ)<br>ජා.වෘ.සු. 3 වන මට්ටම | 393,646.50 |
| 4. | වඩු කාර්මික පුහුණු ආයතනය<br>කිවිලෙයාය<br>දොඹගහවෙල<br>සියඹලාන්ඩුව | නිෂ්පාදන ක්ෂේත්‍රය | වඩුකාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ)<br>ජා.වෘ.සු. 3 වන මට්ටම | 234,900.00 |
| 5. | මානව සම්පත් සංවර්ධන ආයතනය<br>වඩු කාර්මික පුහුණු ආයතනය<br>බඩල්කුඹුර | නිෂ්පාදන ක්ෂේත්‍රය | වඩුකාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ)<br>ජා.වෘ.සු. 3 වන මට්ටම | 119,100.00 |
| 6. | රජයේ යාන්ත්‍රික වඩු පාසල<br>වැලිපිටිය<br>මිද්දෙණිය | නිෂ්පාදන ක්ෂේත්‍රය | වඩුකාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ)<br>ජා.වෘ.සු. 3 වන මට්ටම | 126,500.00 |
| ප්‍රදානය කරන ලද මුළු මුදල | | | | 1,314,276.50 |

### 5.1.2 පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම

2015 වර්ෂයේදී පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය ඉහළ නැංවීම පිණිස මූල්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 0.84 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව). ඒ අනුව, ලැබුණු අයදුම්පත්‍ර 58 අතුරින් තෝරාගන්නා ලද ආයතනයන් 29 ක් භෞතික ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව ආයතන 06 ක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගන්නා ලදී.

ඒ අනුව, 2015 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 94.6% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. පෞද්ගලික/රාජ්‍ය නොවන සංවිධාන අංශයේ එක් එක් වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් පහත වගු අංක 5.4 මඟින් දක්වා ඇත.

වගුව 5:4 පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීම - 2015

2015 වර්ෂයේදී මූල්‍යාධාර ප්‍රදානය කරනලද ආයතන පිළිබඳ විස්තර

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 1. | රෝයල් පරිගණක ආයතනය<br>එළුවිල්<br>කලවන්චිකුඩි | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී | පරිගණක ජාල කරණ ශිල්පී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 62,599.64 |
| 2. | සකුරා ඩ්‍රෙස් මේකින් ස්කූල්<br>බලගොල්ල<br>කෙන්ගල්ල | රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය | මැහුම් ශිල්පී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 125,283.90 |
| 3. | කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>කතරගම පාර<br>තිස්සමහාරාමය | හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය | සූපවේදී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 68,040.00 |
| 4. | සියත්මා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>අංක 744/10, 15 වන පටුමග<br>රොමියල් පාර<br>පනාගොඩ<br>හෝමාගම | රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය | මැහුම් ශිල්පී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 245,700.00 |
| 5. | නවෝදා පරිගණක අධ්‍යාපන ආයතනය<br>අංක 72, ශ්‍රී දේවානන්ද පාර,<br>නාවින්න<br>මහරගම | මුද්‍රණ ක්ෂේත්‍රය | පරිගණක චිත්‍රක ශිල්පී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 191,100.00 |
| 6. | කුසුම්සිරි ඩ්‍රෙස් ලයින්<br>අංක 210/9A, කොළඹ පාර,<br>මීගමුව | රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය | මැහුම් ශිල්පී<br>ජා.වෘ.සු. 4 වන මට්ටම | 103,249.30 |
| ප්‍රදානය කරන ලද මුළු මුදල | | | | 795,972.84 |

වගුව 5.5: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම (පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධාන)

| කර්මාන්ත ක්ෂේත්‍රය | පාඨමාලා ගණන | ප්‍රදානය කළ මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රය | 03 | 474,233.20 | 59.6% |
| මුද්‍රණ ක්ෂේත්‍රය | 01 | 191,100.00 | 24.0% |
| හෝටල් සහ සංචාරක ක්ෂේත්‍රය | 01 | 68,040.00 | 8.5% |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය | 01 | 62,599.64 | 7.9% |
| එකතුව | 06 | 795,972.84 | 100% |

ප්‍රස්ථාරය 5.3: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ප්‍රදානය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය




### 5.1.3 පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාර ප්‍රදානය

ශ්‍රී ලංකාව තුල සිටින පීඩාවට පත්වූ තරුණ තරුණියන්ගේ නිපුණතාවය ඉහළ නැංවීම පිණිස වෘත්තීය පුහුණුව සපයන ආයතනවලට අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා පාඨමාලා ප්‍රතීතන කොන්දේසියෙන් තොරව මූල්‍යාධාර ලබාදෙනු ලැබේ.

2015 වර්ෂය තුලදී මේ සඳහා රු. මිලියන 0.6 ක් (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව) ලබා දීමට සැලසුම්කර තිබුණි.

ඒ අනුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී වෘත්තීය පුහුණුව සපයන ආයතන 02 ක පාඨමාලා 04 ක් සඳහා රු. මිලියන 0.459 ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානය කරනලදී. එබැවින් මෙම වැඩසටහන සඳහා අනුමත ප්‍රතිපාදන වලින් 76.5% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. මූල්‍යාධාර ප්‍රදානය කරනලද ආයතන පිළිබඳ විස්තර වගු අංක 5.6 හි දැක්වේ.

වගුව 5.6: පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණුව ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2015

| අංකය | පුහුණු ආයතනයේ නම | හිමිකාරත්වය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාවේ නම | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 1. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව අමුණුකුඹුර, වතුරුගම | රාජ්‍ය | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) | 129,919.00 |
| 2. | තෘතීයික හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නවසෙන්පුර වැලිකන්ද | පෞද්ගලික | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය | දැව කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 157,241.00 |
| | | | ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික් | විදුලි කාර්මික ශිල්පී | 97,200.00 |
| | | | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය | ජලනල ශිල්පී | 75,300.00 |
| ප්‍රදානය කරන ලද මුළු මුදල | | | | | 459,660.00 |

### 5.1.4 මූල්‍යාධාර විමර්ශනය කිරීමේ වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතනවලට ලබාදෙන මූල්‍යාධාර නිසිපරිදි භාවිතා කොට ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා වාර්ෂික විමර්ශන වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් මූල්‍යාධාර ලබාදුන් පුහුණු ආයතන වෙත ගොස් විමර්ශනයට ලක්කරන ලද අතර, ඒ යටතේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 14 න් 11 ක් පිලිබඳව විමර්ශනය සිදුකරනු ලැබීය.

මෙම වැඩසටහන තුලින් හඳුනාගත් පරිදි මූල්‍යාධාර ලබාදුන් පෞද්ගලික අංශයේ පාඨමාලා වලින් 80% ක් ප්‍රතිතනය  වී ඇත. අනෙකුත් පාඨමාලාද ප්‍රතිතන ක්‍රියාවලියට ඇතුලත්ව අවශ්‍ය කටයුතු සිදුවෙමින් පැවැති බැව් නිරීක්ෂණය විය. රාජ්‍ය අංශයේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා තුලින් 50% ක් ප්‍රතිතනයවී ඇති බව නිරීක්ෂණය විය. එම අධ්‍යයනයේදී හෙලිවූ සාරාංශයක් වගු අංක 5:7 මගින් දැක්වේ. එමෙන්ම පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතනවල පාඨමාලා 100% ක් ප්‍රතිතන මට්ටමට ලඟාවී ඇත.

වගු අංක 5:7 - මූල්‍යාධාර විමර්ශනය තුලින් ලද තොරතුරු - 2014 වර්ෂය

| අංශය | මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | 2014 පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව | 2015 පුහුණුව ලබන සිසුන් සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද මූල්‍යාධාර ප්‍රමාණය |
|---|---|---|---|---|
| රාජ්‍ය | 05 | 46 | 25 | 1,304,809.00 |
| පෞද්ගලික | 05 | 80 | 90 | 1,307,432.62 |
| පීඩාවට පත්වූ | 01 | 17 | 25 | 639,873.00 |
| එකතුව | 11 | 143 | 140 | 3,252,114.62 |

## 5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

සැලසුම් හා පර්යේෂණ අංශය වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තිය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. මෙම වැඩසටහන යටතේ නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම මෙන්ම දැනට සකස්කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම සිදුවේ. 2015 වර්ෂය අවසන් වනවිට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් 19 ක් සකස්කර ඇති අතර සැලසුම් 14 ක් යාවත්කාලීන කර ඇත.

### 5.2.1 නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම

- පරිසර ආරක්ෂණ ක්ෂේත්‍රය

පරිසර ආරක්ෂණ ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම මත මෙම ක්ෂේත්‍රය සඳහා නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස් කිරීමට ඒ සඳහා පත්කල කමිටුව මගින් නිර්දේශ කරනලදී. මේ අනුව නව සැලැස්ම සකස් කිරීම 2014 නොවැම්බර් මස ආරම්භකරන ලදී. මේ සඳහා උපදේශක දායකත්වය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන සංවර්ධන සහ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලබයි. මෙම සැලැස්මෙහි මූලික කෙටුම්පත මේවන විට අවසන් කර ඇති අතර, රු. 1,145,902.00 ක මුදලක් 2015 වර්ෂයේදී වැයකරන ලදී.

### 5.2.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම

● තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රය සඳහා සැලස්ම යාවත්කාලීන කිරීම 2015 වර්ෂයේ අවසාන කාර්තුවේදී, ඒ සඳහා තෝරාගත් උපදේශකයින්වන ඉන්ෆෝර්ටෙක් පුද්ගලික ආයතනය වෙත භාරදෙන ලදී. උපදේශන ගාස්තු වශයෙන් රු. 479,360.00 ක මුදලක් 2015 වර්ෂයේදී වැයකරන ලදී.

### 5.2.3 ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පැවරී ඇති කාර්යභාරය ඉටුකරමින් ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

2015 වර්ෂය අවසන් වනවිට සබරගමුව, දකුණ, වයඹ, නැගෙනහිර, උතුර, ඌව සහ මධ්‍යම පළාත් සඳහා පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කර අවසන්කර ඇත. කාලීන අවශ්‍යතාවයක්ව තිබූ මෙම වෘත්තීය පුහුණු සැලැසුම් සකස්කිරීම කොමිෂන් සභාව ඉටුකල මහඟු කර්තව්‍යයක් වනු ඇත.

2015 වර්ෂය තුල අවසන් කරනලද මධ්‍යම පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම සංවර්ධනය කිරීම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්වත් මණ්ඩලයක් මගින් සිදුකරන ලදී. මධ්‍යම පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම සඳහා උපදේශක ගාස්තුවල අවසන් ගෙවීම වශයෙන් රු. 199,000.00 ක මුදලක් හා ඌව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම එම පළාතෙහි පාර්ශවකරුවන් අතර බෙදා හැරීමේ තැපැල් ගාස්තු වශයෙන් රු. 7,150.00 ක මුදලක් 2015 වර්ෂයේදී වැයකර ඇත.

උතුරු මැද පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම සකස්කිරීම 2015 වර්ෂයේදී අවසන්කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමුකර ඇත. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා උපදේශක දායකත්වය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විද්වත් මණ්ඩලයක් විසින් සිදුකරන ලදී. ඒ සඳහා 2015 වර්ෂය තුල රු. 432,787.50 ක මුදලක් වැයකරන ලදී.






## 5.3 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම

සැලසුම් හා පර්යේෂණ අංශය මගින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ (රාශියක්) එළි දැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ අපගේ වෙබ් අඩවිය තුල ඇතුලත්කර ඇත. 2015 වර්ෂයේදී පර්යේෂණ කවය පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

### 5.3.1 නව පර්යේෂණ අධ්‍යයන

2015 වර්ෂය තුලදී, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුලින් පර්යේෂණ යෝජනා කැඳවන ලදී. එම කාර්යය මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා පර්යේෂණ මෙහෙයුම් කමිටු නියෝජිතයන්ට භාරදෙන ලදී.

ඒ අනුව, විවිධ ආයතන නියෝජනය කරමින් පර්යේෂණ යෝජනා 10 ක් පර්යේෂණ කවය වෙත ලැබුණි. එම යෝජනා පර්යේෂණ කමිටු හරහා ඇගයීමෙන් පසුව ක්ෂේත්‍රයට අයත් උචිත, කාලීන පර්යේෂණ අධ්‍යයන 06 සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. ඒ සඳහා රු. මිලියන 0.468 ක් වැයකිරීමට බලාපොරොත්තු විය. එක් එක් පර්යේෂණ අධ්‍යයනය සඳහා වෙන්කරන ලද වියදම් පහත වගු අංක 5.8 මඟින් දැක්වේ.

වගුව 5.8 : පර්යේෂණ අධ්‍යයන - 2015

| අංකය | පර්යේෂණ මාතෘකාව | පර්යේෂණ කණ්ඩායම | අනුමත කරන ලද මුදල (රු.) | 2015 වර්ෂයේදී වැයවූ මැදල (රු.) | 2016 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1. | ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නූතන විද්‍යුත් තාක්ෂණික (E- Learning) ක්‍රමවේදයන් යොදාගත හැකි ද යන්න හඳුනාගැනීම හා කාර්මික හා අධ්‍යාපන පුහුණු දෙපාර්තමේන්තු ආයතන වෙත ක්‍රියාකාරී සැලසුමක් යෝජනා කිරීම | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 86,000.00 | - | 86,000.00 |
| 2. | තාක්ෂණ විද්‍යාල තුල ප්‍රජා පුහුණුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 52,000.00 | 26,000.00 | 26,000.00 |
| 3. | ජාතික වෘත්තීය පුහුණු ආයතනය මඟින් 2015 වර්ෂයේදී පවත්වන ලද පුහුණු පාඨමාලාවල ඵලදායීතාව සෙවීම පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 100,000.00 | 50,000.00 | 50,000.00 |
| 4. | ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පී පාඨමාලාවේ අදාල කර්මාන්තගත පුහුණුවෙහි ඵලදායීතාවය සෙවීමේ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 92,000.00 | - | 92,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5. | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ සේවකයන්ගේ සේවය හැරයාම පිළිබඳ කරනු ලබන විශ්ලේෂණාත්මක අධ්‍යයනය | වෘත්තීය පුහුණු අධිකාරිය | 55,500.00 | - | 55,500.00 |
| 6. | කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු පාඨමාලා හැදෑරූ ශිල්පීන් සඳහා විදේශ රැකියා වෙළෙඳපොළෙහි ඇති ශ්‍රම ඉල්ලුම සෙවීම පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 82,500.00 | - | 82,500.00 |
| එකතුව | | | 468,000.00 | 76,000.00 | 392,000.00 |

2015 වර්ෂයේදී ආරම්භකල පර්යේෂණ අධ්‍යයන සඳහා රු.මිලියන 0.076 ක මුදලක් වැයවිය. ඒ අනුව, 2015 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 13.5% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. ඉතිරි මුදල පර්යේෂණ අධ්‍යයන නිම කිරීමෙන් අනතුරුව 2016 වර්ෂයේදී ගෙවීම සඳහා උපචිත කරන ලදී.

### 5.3.2 පර්යේෂණ මෙහෙයුම් කමිටු

2005 වර්ෂයේදී ආරම්භකරන ලද පර්යේෂණ කවය 2015 වර්ෂයේදී ක්‍රියාකාරීව තම සේවාව ඉටුකරන ලදී. ඒ අනුව, 2015 වර්ෂය තුල පර්යේෂණ කමිටු රැස්වීම් 03 ක් පවත්වන ලදී.

## 5.4 ව්‍යාපෘති වැඩසටහන්

### 5.4.1 මූලික දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය - Baseline Survey

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ ග්‍රීන්ටෙක් මානව සම්පත් සංවර්ධන ආයතනය මඟින් මූලික දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේ දී අවසන් කරනලදී. ඒ සඳහා රු. 3,866,467.50 ක මුදලක් 2015 වර්ෂයේදී වැයකරන ලදී.

### 5.4.2 කර්මාන්ත ඉල්ලුම් පරතරය සෙවීමේව්‍යාපෘතිය - Survey on Industrial Demand Gap

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ ග්‍රීන්ටෙක් මානව සම්පත් සංවර්ධන ආයතනය මඟින් කර්මාන්ත ඉල්ලුම් පරතරය සෙවීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ දී පහත සඳහන් ක්ෂේත්‍ර 04 ක් ආවරණය වන පරිදි ආරම්භ කරන ලදී.

- ඉදිකිරීම් ක්ෂේත්‍රය
- විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය
- සත්කාරක සේවා ක්ෂේත්‍රය

මෙහි මූලික කෙටුම්පත අවසන්කර ඇති අතර, 1,745,500.00 ක මුදලක් 2015 වර්ෂයේදී වැයකර ඇත.

# 6.0 පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත සහ අංක 887/8 දරණ 1995 සැප්තැම්බර් මස 07 වන දින රජයේ ගැසට් පත්‍ර (අතිවිශේෂ)හි සඳහන් සංවර්ධන සැලැස්ම අනුව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු ආයතනයන්හි තත්ත්ව ආරක්ෂණය ඇති කිරීම සහ පවත්වාගෙන යාම අරමුණු කර ගෙන පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

1. පුහුණු ආයතන ලියාපදිංචි කිරීම
2. පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම
3. ජාතික නිපුණතා සම්මත හා ආශ්‍රිත ලේඛණ සංවර්ධනය හා යාවත්කාලීන කිරීම

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයෙහි නිලධාරීන් දහහතර දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් සිටින අතර එය අධ්‍යක්ෂකවරයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක්, සහකාර අධ්‍යක්ෂකවරු සිව්දෙනෙක්, සංවර්ධන නිලධාරීන් සිව්දෙනෙක්, කළමනාකරණ සහකාර තිදෙනෙක් හා කාර්යාල කාර්ය සහායකවරයෙකුගෙන් සමන්විත විය. ඉහත දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය මගින් 2015 වසර තුලදී ඉටු කරන ලද කාර්යභාරය පහත පරිදි වෙයි.

### 6.1 වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සපයන ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම නීතිමය අවශ්‍යතාවයකි. 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතින් ආයතන ලියාපදිංචි කිරීම සඳහා විධි විධාන සපයා ඇති අතර 1995 සැප්තැම්බර් මස 07 වන දින අංක 887/8 දරන රජයේ ගැසට් පත්‍රයෙන් ආයතන ලියාපදිංචියට අදාළ නිර්ණායක දක්වා ඇත. දිවයිනේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයන්හි තත්වය හා අදාලත්වය තහවුරු කිරීමේ අරමුණින් මෙම විධිවිධාන සහ නිර්ණායක වලට අනුව ආයතන ලියාපදිංචිය කරනු ලබයි.

ආයතන සතු යටිතල පහසුකම්, පුහුණු උපකරණ, උපදේශකවරුන්ගේ සුදුසුකම්, පුහුණුව සැපයීම සහ ඇගයීම, විෂය නිර්දේශයන්ගේ ප්‍රමාණාත්මක බව, ශිෂ්‍ය සුභසාධනය හා පුහුණුවේ අදාළත්වය යන නිර්ණායක ආයතන ලියාපදිංචි කිරීමේදී ඇගයීමට ලක් කෙරෙයි.

2015 වසරෙහි කොමිෂන් සභාවෙහි වාර්ෂික සැලසුමට අනුව අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ආයතන 350 ක් ඇගයීමට සැලසුම් කර තිබූ අතර මෙම වසර තුලදී ආයතන 297 ක් ඇගයීම් කරන ලදී.
ඒ පිළිබඳ විස්තර වගු අංක 6.1 හි දැක්වේ.

වගුව 6.1 අළුතින් ලියාපදිංචිය සඳහා පුහුණු ආයතන ඇගයීම

| | ආයතන සංඛ්‍යාව |
|---|---|
| ඉලක්කය | 350 |
| ප්‍රගතිය | 297 |

ඉහත සඳහන් අළුතින් ලියාපදිංචිය සඳහා ඇගයීම් කරන ලද ආයතන 297 න් ආයතන 152 ක් ලියාපදිංචි නිර්ණායක සපුරා තිබීම නිසා 2015 වසර තුළ අළුතින් ලියාපදිංචි කරන ලදී. අදාල ලියාපදිංචි නිර්ණායක සපුරා නොතිබීම නිසා අනෙකුත් ආයතන ලියාපදිංචිය සඳහා නිර්දේශ නොකරන ලදී.

එම අළුතින් ලියාපදිංචි ආයතනයන්හි හිමිකාරත්වය අනුව විශ්ලේෂණය පහත දැක්වේ.

| | |
|---|---|
| 1. රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතන | 35 |
| 2. ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා යටතට අයත් පුහුණු ආයතන | 18 |
| 3. රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක පුහුණු ආයතන | 04 |
| 4. පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතන | 95 |
| එකතුව | 152 |

නිම්කාරත්වය අනුව ආයතන ලියාපදිංචිය




## 6.2 පුහුණු මධ්‍යස්ථාන වල ලියාපදිංචිය අළුත් කිරීම.

1995 සැප්තැම්බර් මස 07 වන දින පළ කෙරුණු අංක 887/8, දරණ රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) සඳහන් නිර්ණායක වලට අනුකූලව පුහුණු ආයතන ඇගයීම් කර, අවුරුදු 02 ක කාලයට සීමාවූ නැවත අලුත් කල යුතු ලියාපදිංචියක් ලබා දෙනු ලැබේ. මෙම කාලය අවසන් වීමට පෙර පුහුණු ආයතන විසින් තම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අයදුම් කළ යුතුයි.

2015 වසර තුළදී ආයතන 400 ක් ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබූ අතර ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ආයතන 343 ක් ඇගයීමට ලක්කර ඉන් ආයතන 297 ක් ලියාපදිංචිය අලුත් කරන ලදී.

වගුව 6.2 පුහුණු ආයතන ඇගයීම, ලියාපදිංචිය අළුත් කිරීම

| | ආයතන සංඛ්‍යාව |
|---|---|
| ඉලක්කය | 400 |
| ප්‍රගතිය | 343 |

## 6.3 2015 වසරේදී වෘත්තිය පුහුණු ආයතන ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්

මෙම කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර සමහර පුහුණු ආයතන ව්‍යාජ ප්‍රචාර මගින් සිසුන් නොමඟ යැවීමේ විවිධ ව්‍යාපාර පවත්වාගෙන යනු ලැබේ. එම ප්‍රචාර වලට සිසුන් රැවටීම වැළැක්වීමටත්, පුහුණුවේ ගුණාත්මකභාවය වැඩි කිරීමටත් පුහුණු ආයතන ලියාපදිංචිය හා ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳව මහජනතාව හා පුහුණුව සපයන්නන් දැනුවත් කිරීම පිණිස පහත සඳහන් වැඩසටහන් 2015 වසර තුළ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

1. පුවත් පත් දැන්වීම් මගින් දැනුවත් කිරීම
    - 2015 අගෝස්තු 30 වන දින ලංකාදීප, තිනකරන්, Sunday Observer පුවත්පත් වල,






2. 2015 ජුනි මස රජයේ ගැසට් පත්‍රය මගින් දැනුවත් කිරීමට කටයුතු යොදා ඇත.

## 6.4 පාඨමාලා ප්‍රතීතනය

ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුව 2004 වසරේ දී හඳුන්වා දෙන ලදි. ලියාපදිංචි පුහුණු ආයතන වල පවත්වන පාඨමාලා NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා සකස් කිරීම ප්‍රතීතනය තුලින් අරමුණු කරයි. මෙහිදී ජාතික නිපුණතා සම්මතයන්හි සදහන් කර්මාන්තයට අවශ්‍ය නිපුණතා පුහුණු වන සිසුන්ට ලබා දෙන පරිදි පවත්වනු ලබන පාඨමාලා ඇගයීම සඳහා, ප්‍රතීතන නිර්ණායකයන් සකස් කර ඇත.

එම නිර්ණායක සපුරන්නේ නම් පාඨමාලා ප්‍රතීතනය කර ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය පිරිනැමීම සඳහා අනුමැතිය දෙනු ලැබේ.

ඒ අනුව පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ 2015 වසරේ ඉලක්කයන් හා ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

වගුව 6.3 ප්‍රතීතනය සඳහා පාඨමාලා ඇගයීම් හා ප්‍රතීතනය කිරීමේ ඉලක්ක හා ප්‍රගතිය - 2015

| පුහුණු ආයතන | ඇගයීම් කිරීම | |
|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය |
| රාජ්‍ය අංශය | 425 | 503 |
| පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 75 | 108 |
| | 500 | 611 |

ඒ අනුව රාජ්‍ය අංශයට අයත් පුහුණු පාඨමාලා 503 ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කර ඇති අතර මෙයින් ජාතික නිපුණතා සම්මතයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලබන පාඨමාලා 339ක් ප්‍රතීතනය කර ඇත. 2015 වසර අවසාන වන විට කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කර ප්‍රතීතන තත්වයන් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය අංශයට අයත් මුළු පුහුණු පාඨමාලා සංඛ්‍යාව 1588 ක් වේ.

2015 වසරේ දී පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ක්‍රියාත්මක පුහුණු පාඨමාලා 75 ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කර ඇත. මෙයින් පාඨමාලා 53 ක් ප්‍රතීතනය කරන ලදි. ඒ අනුව 2015 වසර අවසාන වන විට පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ප්‍රතීතනය කර ප්‍රතීතන තත්වයන් පවත්වාගෙන යනු ලබන ලද මුළු පාඨමාලා සංඛ්‍යව 703 කි.

2015 වසර අවසාන වන විට ප්‍රතීතනය කර ඇති මුළු පාඨමාලා සංඛ්‍යාව 2291 කි.

වගුව 6.4 අනුව රාජ්‍ය අංශයේ ප්‍රතීතන ඇගයීම් කිරීම අපේක්ෂිත ඉලක්කයට වඩා 78 කින් සහ පුද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ අපේක්ෂිත ඉලක්කයට වඩා 33 කින් වැඩි වී ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් බඳවා ගැනීමේ පරිපාටියට ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය හඳුන්වා දීමත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් මැද පෙරදිග සේවය සඳහා ගෘහස්ථ ගෘහ පාලන සහයකයින්ට NVQ සහතික අනිවාර්ය කිරීම.

නව නිපුණතා සම්මත හඳුන්වා දීමත්, ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ජනප්‍රිය වීමත් නිසා පාඨමාලා ප්‍රතීතන සඳහා ඉල්ලුම්පත්‍ර වැඩිපුර ලැබීම හේතුවෙන් අදාල ඉලක්කයට වඩා පාඨමාලා 111 ක් ඇගයීම් කර ඇත.

රාජ්‍ය අංශයේ ඇගයීම් කල සංඛ්‍යාව 503 වුවද රාජ්‍ය අංශයේ පාඨමාලා ප්‍රතීතනයවු සංඛ්‍යාව 339කි. පුහුණු උපකරණ ප්‍රමාණවත් නොවීම, සුදුසුකම් ලත් උපදේශකවරු නොමැති වීම, සම්මතයන්ට අනුව පුහුණුව පවත්වාගෙන නොයාම හා අඛණ්ඩ ඇගයීම් නොපැවැත්වීම යන කරුණු නිසා පාඨමාලා ප්‍රතීතනය කිරීමට නොහැකි විය. පාඨමාලා ප්‍රතීතනය නොවීමට බලපෑ හේතු අදාළ ආයතන වලට දන්වා යවා ඇත.

2015 වසර තුළදී ඇගයීම් කළ මුළු පාඨමාලා සංඛ්‍යාව 611 ක් වන අතර ඉන් 392ක් ප්‍රතීතනය කර ඇත.

2015 වසර අවසන් වන විට ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් පහත දැක්වේ.

වගුව 6.4 ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (2015 වසර තුළ) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2014) | 2015 වසර තුළදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා | ප්‍රතීතනය කරනු ලැබූ මුළු පාඨමාලා සංඛ්‍යාව (2015 වසර අවසානයේ දී) |
|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 13 | 27 | 20 | 120 |
| ජාතික තරුණ සේවා සභාව | 36 | 29 | 24 | 92 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 126 | 190 | 94 | 261 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 80 | 224 | 161 | 1006 |
| වෙනත් රාජ්‍ය ආයතන | 79 | 33 | 40 | 109 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 109 | 108 | 53 | 703 |
| එකතුව | 443 | 611 | 392 | 2291 |

*පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත
*දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත

## 6.5 ප්‍රතීතනය අලුත් කිරීම

ප්‍රතීතනය කරන ලද පාඨමාලාවක වලංගු කාලය වසර 03 ක් වන අතර එම වසර 03 අවසානයේ ප්‍රතීතනය අළුත් කල යුතුය. ඒ අනුව 2015 වසර තුල රාජ්‍ය අංශයේ පාඨමාලා 175 ක් සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 50 ක් ප්‍රතීතනය අළුත් කිරීම සඳහා ඇගයීම් කල යුතුව තිබිණි. මෙම වසර තුලදී රාජ්‍ය අංශයේ පාඨමාලා 209 ක් ඇගයීම් කරන ලද අතර පාඨමාලා 139ක් ප්‍රතීතනය අළුත් කරන ලදි. මෙම රාජ්‍ය අංශයේ ඇගයීම් සඳහා පසුගිය වසරේ අයදුම්පත් ලැබූ සහ ඇගයුම් කරන ලද පාඨමාලාද ඇතුළත් වේ.

එමෙන්ම පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 50 ක් ඇගයීම් කරන ලද අතර ඉන් පාඨමාලා 38 ක් ප්‍රතීතනය අලුත් කරන ලදි.

2015 වසර අවසන් වන විට ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් පහත දැක්වේ.

2015 වසර අවසන් වන විට ප්‍රතීතනය අලුත් කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් වගු අංක 6.4 හි දැක්වේ.

වගුව 6.5 - ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (2015 වසර තුළ) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2015)* | 2015 වසර තුළදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා |
|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 9 | 12 | 8 |
| ජාතික තරුණ සේවා සභාව | 6 | 12 | 7 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 32 | 106 | 35 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 138 | 78 | 87 |
| වෙනත් රාජ්‍ය ආයතන | 23 | 1 | 2 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 50 | 50 | 38 |
| එකතුව | 258 | 259 | 177 |

*පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත.
*දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත.

6.6 පාඨමාලා ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන්

විවිධ දිස්ත්‍රික්කයන්හි ලියාපදිංචිය ලත් පුහුණුව සපයන ආයතන වල උපදේශකවරුන්ට පාඨමාලා ප්‍රතීතනය සඳහා පුහුණු සැලසුම් හා ඇගයීම් ක්‍රමවේදයන් සකස් කිරීම පිළිබඳව වැඩමුළු 08ක් පවත්වා උපදේශකවරු 243 ක් පුහුණු කරන ලදී.

6.7 පුහුණු ආයතන වල ලියාපදිංචිය සනාථ කිරීම

වෘත්තීය පුහුණු ආයතන වලින් නිකුත් කරන ලද සහතික විදේශ රැකියා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී ඒවායේ පිළිගැනීම තහවුරු කල යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා සුදුසුකම් ඇගයීමේ මණ්ඩල (Qualification Verification Councils and Authorities) විසින් එම සහතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2015 වසර තුළදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතාව මත විදේශ රැකියා ගත වන්නන්ගේ සහතික තහවුරු කිරීමේ ලිපි 2400 ක් නිකුත් කරන ලදී.

එමෙන්ම, 2015 වසර තුළදී රාජ්‍ය ආයතන වල බඳවාගැනීම්, උසස් කිරීම් සඳහා සහතික තහවුරු කිරීමේ ලිපි 475 ක් නිකුත් කරන ලදී.

6.8 2015 වසර තුලදී පාඨමාලා ප්‍රතීතනය හා පුහුණු සම්මත අංශය මගින් උපයාගනු ලැබූ ආදායම

| | |
|---|---|
| ශිෂ්‍ය ප්‍රගති වාර්ථා අලෙවියෙන් උපයාගත් ආදායම | - රු. 2,683,975.00 |
| ආයතන ලියාපදිංචි ගාස්තු | - රු. 1,798,200.00 |
| පාඨමාලා ප්‍රතීතන ගාස්තු | - රු. 1,672,300.00 |
| 2015 වසරේ දී පාඨමාලා ප්‍රතීතනය සහ පුහුණු සම්මත අංශයේ මුලු ආදායම | - රු. 6,154,475.00 |

## 6.9 ජාතික නිපුණතා සම්මත සහ ආශ්‍රිත ලේඛණ සංවර්ධනය හා යාවත්කාලීන කිරීම

I. 2015 වසරෙදී පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

සංවර්ධනය කරන ලද ජාතික නිපුණතා සම්මතයන්

a) NVQ මට්ටම 1 - 4

- අත් යන්ත්‍ර රෙදි විවීමේ ශිල්පී (Handloom Craftsman)
- බහු කුසලතා ඉදිකිරීම් ශිල්පී (Multi skilled Construction Craftsman)
- සම් භාණ්ඩ නිෂ්පාදන ශිල්පී (Leather Products Craftsman)
- නැව් තටාංග සුපරික්ෂක (Shipyard Supervisor)
- බහු කුසලතා නඩත්තු ශිල්පී (Multi Skilled Maintenance Craftsman)
- ලී කැටයම් ශිල්පී (Wood Carving Artist)
- බතික් ශිල්පී (Batik Artist)
- ආහාර හා පානවර්ග සැපයිම (Food & Beverage Service)
- පේස්ට්‍රි සහ බේකරි ශිල්පී (Pastry & Bakery)
- වෘත්තිය අරක්කැමි (Professional Cookery)
- ස්පා ඇන්ඩ් ලෙෂර් සංචාරක ක්‍රියාත්මක කිරීම් (Spa and Leisure Tourism Operations)
- චාරිකා සහ සංචාරක කටයුතු ක්‍රියාත්මක කිරීම් (Travel & Tour Operations)
- පිඹුරු පත් අලුත් වැඩියා කරන්නා (Survey Plan Repairer)
- බෝට්ටු තැනුම් ශිල්පී (Boat Building Technician)
- බඩු ගබඩා සුපරික්ෂක (Warehouse Supervisor)
- රෝද එකෙලි කිරීමේ කාර්මික ශිල්පී (Wheel Alignment Technician)
- තිර මුද්‍රණකරු (Screen Printer)
- යන්ත්‍ර වැද්දුම්කරු (Millwright Fitter)

b) NVQ මට්ටම් 5 - 6

- ගිණුම්කරණ ක්ෂේත්‍රය (Accounting Sector)

සංවර්ධනය කරන ලද විෂය මාලා

a) NVQ මට්ටම් 1 - 4

- සත්ත්ව ආහාර ඇඹරුම් ක්‍රියාකරු (Animal Feed Mill Operator)
- සත්ත්ව ආහාර නිෂ්පාදන සහකාර (Animal Feed Production Assistant)
- ශරීර යෝග්‍යතා පුහුණුකරු (Physical Fitness Trainer)

b) NVQ මට්ටම් 5 - 6

- සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත තාක්ෂණය (Livestock Production Technology)

ජාතික නිපුණතා සම්මත යාවත්කාලීන කිරීම

පහත සඳහන් ජාතික නිපුණතා සම්මත යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

යාවත්කාලීන කරන ලද ජාතික නිපුණතා සම්මතයන්

a) NVQ මට්ටම් 1 - 4

- කිරි ආශ්‍රිත ගොවිපල සහකාර (Dairy Farming Assistant)
- පරිගණක දෘඩාංග ශිල්ප (Computer Hardware Technician)
- පරිගණක චිත්‍රක ශිල්පී (Computer Graphic Designer)
- උද්‍යාන අලංකරණ ශිල්පී (Landscaping Technician)

- ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී (Offset Litho Machine Operator)
- වඩු කාර්මික ශිල්ප (Wood craftsman (Furniture))
- බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator)
- ජල නල කාර්මික ශිල්පී (Plumber)
- පෙර පාසල් ගුරු (Pre -School Teacher)
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)(Field Assistant (Agriculture))
- ප්‍රමාණ සමීක්ෂණ සහායක (Quantity Surveying Assistant)

යාවත්කාලීන කරන ලද විෂය මාලා

a) NVQ මට්ටම් 1 - 4

- විද්‍යුත් මොටර් ක්‍රියාකරු (Electric Motor Winder)
- බොයිලේරු ක්‍රියාකරු (Boiler Operator)
- කර්මාන්ත ක්ෂේත්‍ර ජල නල කාර්මික ශිල්පී (Industrial Plumber)
- ප්ලාස්ටික් නිෂ්පාදන මැෂින් ක්‍රියාකරු (Plastic Processing Machine Operator)
- ස්වර්ණාභරණ ගල් බැදුම් ශිල්පී (Jewellery Stone Setter)
- ස්වර්ණාභරණ සාදන්නා (Jewellery Maker)
- වායව කාර්මික ශිල්පී (Pneumatic Technician)

i. ඇගයීම් සම්පත් සංවර්ධනය කිරීම

2014/2015 වර්ෂයේ නිමකරන ලද ජාතික නිපුණතා සම්මත සඳහා ඇගයීම් සම්පත් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන මෙම කොමිෂන් සභාව විසින් ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට ලබා දී ඇති අතර 2015 වර්ෂය සඳහා පහත සඳහන් ඇගයීම් සම්පත් ලැබී ඇත.

- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)Field Assistant (Agriculture)
- ලී කැටයම් ශිල්පී (Wood Carving Artist)
- බතික් ශිල්පී (Batik Artist)
- පෙර පාසල් ගුරු (Pre- School Teacher)
- ආරක්ෂණ පද්ධති කාර්මික ශිල්පී (Security and Surveillance System Technician)
- රෝද එකෙලි කිරීමේ කාර්මික ශිල්පී (Wheel Alignment Technician)
- ප්‍රමාණ සමීක්ෂණ සහායක (Quantity Surveying Assistant)
- තිර මුද්‍රණකරු (Screen Printer)
- ගිනි නිවන්නා (Fireman)
- ජංගම දුරකථන අලුත් වැඩියා කිරීමේ කාර්මික ශිල්පී (Mobile Phone Repairing Craftsman)
- මෝටර්රථ විදුලිකාර්මික ශිල්පී (Automobile Electrician)
- පොරොඳු කරු (Upholster)

ii. සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත

2015 වර්ෂයේ ඉලක්ක ගත ජාතික නිපුණතා සම්මත පරිවර්තන ගණන 15ක් සහ ඉලක්ක ගත විෂය මාලා ගණන 10 කි.

a) පහත සඳහන් ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලා සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.

ජාතික නිපුණතා සම්මත

- උවටැන් කරන්නා (Care Giver)
- මුදල් අයකැමි (Cashier)
- අරක්කැමි (Cook)
- පෙර පාසල් ගුරු (Preschool Teacher)
- ක්ෂේත්‍ර නිලධාරි (Field Officer (Rubber))
- ලිපිකරු (Clerk)
- මැනුම් ක්ෂේත්‍ර සහායක (Survey Field Assistant)
- වාහන සේවා කරන්නා සහ ඇතුලත පිරිසිදු කරන්නා (Vehicle Serviceman & Interior cleaner)

විෂය මාලා

- කේෂ්ත්‍ර සහකාර (රබර්) (Field Officer (Rubber)
- ලිපිකරු (Clerk)

ඉ) පහත සඳහන් ජාතික නිපුණතා සම්මත සහ විෂය මාලා දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

ජාතික නිපුණතා සම්මත

- සැලසුම් ශිල්පී (Draughtsperson)
- කේෂ්ත්‍ර නිලධාරි (රබර්) (Field Officer (Rubber))
- සහකාර කේෂ්ත්‍ර නිලධාරි (තේ) (Assistant Field Officer (Tea)
- සහකාර කර්මාන්ත නිලධාරි (තේ)(Assistant Factory Officer (Tea)
- අරක්කැමි (Cook)
- භෝජනාගාර සහායක (Waiter /Steward)
- ලිපිකරු (Clerk )
- මැනුම් කේෂ්ත්‍ර සහායක (Survey Field Assistant)
- බර වාහන ක්‍රියාකරු (Heavy vehicle Operator)

විෂය මාලා

- උද්‍යාන අලංකරණ ශිල්පී (Landscaping Technician)
- පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී (Fruit and vegetable processor)
- සහකාර කර්මාන්ත නිලධාරි (තේ) (Assistant Factory Officer (Tea))
- සහකාර කර්මාන්ත නිලධාරි (රබර්) (Assistant Factory Officer (Rubber))
- තේ කර්මාන්ත කාර්මික ශිල්පී (Tea factory Mechanic)
- ලිපිකරු (Clerk)
- අරක්කැමි (Cook)
- මැනුම් කේෂ්ත්‍ර සහායක (Survey Field Assistant)

## ජාතික නිපුණතා සම්මත සහ අදාල ලේඛණයන්හි මෘදු පිටපත් සැකසීම

සියළුම ජාතික නිපුණතා සම්මත සහ ඒවායේ ලේඛණ ඇතුලත් මෘදු පිටපත් සහිත CD තැටියක් පුස්තකාලය හරහා අලෙවි කිරීම මෙම අංශය මගින් ක්‍රියාත්මක වූ අතර එම CD තැටියක් රු.500 මුදලකට අලෙවිකිරීමෙන් රු.509,000ක මුදලක් කොමිෂන් සභාව උපයා ගන්නා ලදී.

# 7.0 ජාතික වෘත්තිය සුදුසුකම් අංශය

ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික වෘත්තිය සුදුසුකම් අංශය එහි ඉලක්කගත අරමුණු කරා ලඟා වීමේදි නව වැදෑරුම් ක්‍රියාකාරකම් මාලාවක් 2015 වර්ෂය තුලදි ක්‍රියාවට නංවන ලදි.

01. ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්.
02. කොමිෂන් සභාව තුල ලියාපදිංචි වී ඇති පුහුණු ආයතන සඳහා තත්ත්ව කළමනාකරන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වු ක්‍රියාවලි දාමය ක්‍රියාත්මක කිරීම.
03. ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) මට්ටම් 5 හා 6 හි සමාංසික විභාග පැවැත්වීම සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම ප්‍රමිතිකරණය කිරීමට අදාල වූ ක්‍රියාදාමය සඳහා අධීක්ෂණ ක්‍රියාවලිය.
04. උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා NVQ සහතිකයක් ලබා දීමට සැකසු (GNVQ) නිපුණතා සම්මතයට අදාල ඇගයීම් ලේඛන සැකසීම.
05. කොමිෂන් සභාව තුල තත්ත්ව කළමනාකරන පද්ධතිය (ISO 9001: 2008) ස්ථාපනය කිරීම සඳහා වු සහතිකකරණය යාවත්කාලින කිරීමේ ක්‍රියාකාරකම්.
06. අඛණ්ඩ වෘත්තිමය සංවර්ධනය (Continuous Professional Development Programme) උදෙසා වු වැඩමුළු පැවැත්වීම.
07. ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) ක්‍රමය විදේශ රටවල ප්‍රවර්ධනය කිරීමට අවශ්‍යය වැඩපිළිවෙල සැකසීම.
08. NVQ නොවන පාඨමාලාවන් හි (Non NVQ Qualification) සහතික ලාභින්හට NVQ සමාන මට්ටමක්
නිර්ණය කිරීමේ ක්‍රියාවලිය තුලින් සහතික ලබාදීම හා ඒ සඳහා පොදු සම්කරණයක් සැකසීම.
09. 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට පරිභාහිරව පැවැත්වු වෙනත් ක්‍රියාකාරකම්.

ඉහත සඳහන් කල නව වැදෑරුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වූ අයුරු සවිස්තරාත්මකව පහත දක්වා ඇත.

## 7.1. ජාතික වෘත්තිය සුදුසුකම් ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්.

### 7.1.1. NVQ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

a. 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව NVQ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් යෝජිත විය. ඒ අනුව Load Star හි සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් 86 දෙනෙකු (Fitter and Machinist Sector) ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

b. මීට අමතරව කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කුඩා ව්‍යාපාර අංශය විසින් කළුතර දිස්ත්‍රික්කය තුල විවිධ අංශ ආවරණය වන පරිදි NVQ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වු අතර ඒ සඳහා 150 දෙනෙකු සහභාගි විය.

c. අනුකුලතා තක්සේරු පිළිබද ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් ඔවුන්ගේ 10 වන සැමරුම වෙනුවෙන් BMICH හි පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා සහභාගි විය.

7.1.2. NVQ මට්ටම 01 නොහොත් 'වැඩ ලොව සඳහා වු නිපුණතාවය' සඳහා Training ofTrainers UNIVOTEC හිදි වෘත්තිය පුහුණු ආයතනවල උපදේශකවරුන් 25 ක් සඳහා පුහුණු කිරීමේ දෙදින වැඩමුළුවක් පවත්වන ලදි.

7.2. කොමිෂන් සභාව තුල ලියාපදිංචි වී ඇති පුහුණු ආයතන සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වූ ක්‍රියාවලි දාමය ක්‍රියාත්මක කිරීම.

7.2.1. 2015 වර්ෂය තුලදී කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන විගණනයන් මගින් අදියර දෙකක දී තත්ත්ව විගණනය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පහත සඳහන් පුහුණු ආයතන 46ක් සහතිකකරණය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. මෙම සහතිකකරණය, සහතිකකරණ දිනයේ සිට වසර 03ක් සඳහා වලංගු වේ.

එම ආයතන නම්,

| පුහුණු ආයතනයේ නම | අනුමැතිය ලැබූ දිනය | අවලංගු වන දිනය |
|---|---|---|
| Charmway - නුගේගොඩ | 2014-12-22 | 2017-12-21 |
| තාක්ෂණ විද්‍යාලය - නුවර | 2015-07-09 | 2018-07-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - මාතර | 2015-07-09 | 2018-07-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - හොරණ | 2015-07-09 | 2018-07-08 |
| තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල | 2015-07-09 | 2018-07-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - නුවරඑළිය | 2015-07-09 | 2018-07-08 |
| කාර්මික විදුහල - රත්මලාන | 2015-08-07 | 2018-08-06 |
| කාර්මික විදුහල- හෝමාගම | 2015-08-07 | 2018-08-06 |
| කාර්මික විදුහල - ගම්පහ | 2015-08-07 | 2018-08-06 |
| කාර්මික විදුහල - කුලියාපිටිය | 2015-08-07 | 2018-08-06 |
| තාක්ෂණ විද්‍යාලය - බදුල්ල | 2015-09-09 | 2018-09-08 |
| කාර්මික විදුහල - බණ්ඩාරවෙල | 2015-10-14 | 2018-10-13 |
| කාර්මික විදුහල - මාතර | 2015-10-14 | 2018-10-13 |
| කාර්මික විදුහල - කැගල්ල | 2015-10-14 | 2018-10-13 |
| ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - නියාගම | 2015-07-09 | 2018-07-08 |
| ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - කෑගල්ල | 2015-07-09 | 2018-07-08 |
| ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - ගම්පහ | 2015-07-09 | 2018-07-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - කුරුණෑගල | 2018-08-07 | 2018-08-06 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - අම්පාර | 2015-09-09 | 2018-09-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - අනුරාධපුර | 2015-09-09 | 2018-09-08 |
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - මඩකලපුව | 2015-09-09 | 2018-09-08 |

| | | |
|---|---|---|
| වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය - බදුල්ල | 2015-10-14 | 2018-10-13 |
| ජාතික ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය - කටුබැද්ද | 2015-08-07 | 2018-08-06 |
| කෘෂිකර්ම විදුහල - දඹුල්ල | 2015-07-09 | 2018-07-08 |
| කෘෂිකර්ම විදුහල - කරපිංච - රත්නපුර | 2015-07-09 | 2018-07-08 |
| කෘෂිකර්ම විදුහල - වවුනියාව | 2015-08-07 | 2018-08-06 |
| කෘෂිකාර්මික විදුහල - කුණ්ඩසාල | 2015-08-07 | 2018-08-06 |
| කෘෂිකාර්මික විදුහල - අඟුණකොළපැලැස්ස | 2015-08-07 | 2018-08-06 |
| කොත්මලේ වාරිමාර්ග පුහුණු ආයතනය | 2015-10-14 | 2018-10-13 |
| ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ තාක්ෂණ විද්‍යායතනය- බත්තරමුල්ල | 2015-08-07 | 2018-08-06 |
| සැලසුම්කරණ තාක්ෂණ ආයතනය - බොරලැස්ගමුව | 2015-08-07 | 2018-08-06 |
| සුරාදෝ කැම්පස් - කොට්ටාව | 2015-08-07 | 2018-08-06 |
| Technique International - කොළඹ 05 | 2015-08-07 | 2018-08-06 |
| ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනය - කොට්ටේ | 2015-08-07 | 2018-08-06 |
| Juliston Lanka (Pvt) Ltd - පානදුර | 2015-09-09 | 2018-09-08 |
| සියාසි ඇකඩමි පුද්ගලික සමාගම - කුලියාපිටිය | 2015-10-14 | 2018-10-13 |
| Little Buds Teacher Training School - රත්මලාන | 2015-08-07 | 2018-08-06 |
| සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරන ආයතනය - කොළඹ - 07 | 2015-08-07 | 2018-08-06 |
| කාර්මික විදුහල - ඇඹිලිපිටිය | 2015-12-23 | 2018-12-22 |
| ජාතික වෘත්තිය පුහුණු මධ්‍යාස්ථානය - රත්මලාන | 2015-12-23 | 2018-12-22 |
| Eye Care Institute - කොළඹ 08 | 2015-12-23 | 2018-12-22 |
| විශ්ව විද්‍යාල විද්‍යායතනය - මඩකලපුව | 2015-12-23 | 2018-12-22 |
| තාක්ෂණ විද්‍යාලය - අම්පාර | 2015-07-09 | 2018-07-08 |
| ජාතික වෘත්තිය පුහුණු මධ්‍යාස්ථානය - බද්දේගම | 2015-07-09 | 2018-07-08 |
| කාර්මික විදුහල - දඹුල්ල | 2015-12-23 | 2018-12-22 |
| දොන් බොස්කෝ - මිටියාගනේ | 2015-07-09 | 2018-07-08 |

7.2.2. 2015 වසරේදි කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන වෙනුවෙන් තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළු 13ක් හා මහරගම ජාතික තරුණ සේවා සභාවේදි ඔවුන්ගේ පුහුණු ආයතන වෙනුවෙන්ද එක්දින වැඩමුළුවක් පවත්වා සංශෝධිත තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කෙරිනි. මේ තුලින් 2015 වසරේ 350 ක පිරිසක් දැනුවත් කර ඇත.



මූලාශ්‍රය ( SLIDA) ආයතනයේ පවත්වනු ලැබු සංශෝධිත තත්ත්ව කළමනාකරණ පිළිබඳ 13 වන වැඩමුළුව සඳහා විශේෂ අමුත්තෙකු ලෙස සහභාගි වු මහාචාර්ය මාකස් මහතා විසින් ඉහත වැඩසටහන සඳහා සහභාගි වු උපදේශකවරුන් (Management Representatives) දැනුවත් කිරීමේ ඡායා රූපයක් ඉහතින් දැක්වේ.

7.2.3. තවද තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිහිටුවීම සඳහා සහතික කරන ලද පුහුණු ආයතනයන්හි අභ්‍යන්තර විගණන (Internal Audits) කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම සඳහා දෙදින වැඩමුළු 03 ක් පවත්වන ලදි. මේ සඳහා 2015 වසරේදි 75 දෙනෙකු පමණ සහභාගි වී ඇත.



මූලාශ්‍රය: ඉහත වැඩසටහන් සඳහා පුහුණු ආයතනයන් නියෝජනය කරමින් සහභාගි වු උපදේශකවරයෙකු (Management Representatives) තම කණ්ඩායම වෙනුවෙන් සැකසූ අභ්‍යන්තර විගණන ක්‍රියාදාමයන් අනෙකුත් උපදේශකවරුන් සමග හුවමාරු කර ගැනිමේ ඡායා රූපයක් ඉහතින් දැක්වේ.

7.2.4. 2015 වසරේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා වු බාහිර විගණනයන් සඳහා අවශ්‍ය වෘත්තීයමය විගණකවරුන් (Lead Auditors) 9 දෙනෙකු පත්කර, කොමිෂන් සභාවේ විගණන සංසදය (Auditors Guild) 22 දක්වා ඉහළ නංවා ගැනීමට කටයුතු කරන ලදී.

7.2.5. තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විගණනය කර තත්ව කළමනාකරණය සඳහා සහතිකකරණය කරන ලද පුහුණු ආයතන වෙනුවෙන් සහතික ලබා දිම සඳහා නව සහතික පත්‍රයක් හඳුන්වා දිම.

7.3 ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) මට්ටම් 5 හා 6 හි සමාංසික විභාග පැවැත්වීම සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම ප්‍රමිතිකරණය කිරීමට අදාල වූ ක්‍රියාදාමයන් සහ තාක්ෂණ විද්‍යාල, කාර්මික විද්‍යාල සහ විශ්ව විද්‍යාල විද්‍යායතන අධීක්ෂණ ක්‍රියාවලිය.

a. තාක්ෂණ විද්‍යාල (COT) හා කාර්මික විද්‍යාලයන්හි NVQ මට්ටම් 5 සහ 6 පාඨමාලා සඳහා වූ සමාංසික ප්‍රශ්න පත්‍ර ප්‍රමිතිකරණය කිරීම හා අවසාන ඇගයීම් සඳහා අවශ්‍ය ඇගයුම්කරුවන් පත් කිරීම.

b. NVQ මට්ටම් 5, NVQ මට්ටම් 6 පාඨමාලා ක්‍රියාත්මක වන අනෙකුත් වෘත්තිය පුහුණු ආයතනයන්හි සමාංසික විභාග සම්බන්ධීකරණය හා උපදේශනය සැපයීම.

7.4 උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව සඳහා NVQ සහතිකයක් ලබා දීමට සැකසූ (GNVQ) නිපුණතා සම්මතයට අදාල ඇගයීම් ලේඛන සැකසීම.

2014 වසරේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ වැඩසටහනක් ලෙස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන සිසුන් වෙනුවෙන් GNVQ නමින් සකස් කරන ලද නිපුණතා සම්මතය සඳහා අදාල ඇගයීම් ලේඛන සකසා සම්මතකරණය (Validation) කරගන්නා ලදී. මේ තුලින් උසස් පෙළ හදාරන සිසුන් වෙනුවෙන් NVQ සහතිකයක් ලබා දීමට බලාපොරොත්තු වේ. අදාළ නිපුණතා සම්මතය හා එහි සංක්ෂිප්ත විෂය මාලාවද 2014 දී සකසා ඇත.

7.5 කොමිෂන් සභාව තත්ව කළමනාකරණ පද්ධතිය (ISO 9001: 2008) ස්ථාපනය කිරීම සඳහා වූ සහතිකකරණය යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම්,

a. 2015 වර්ෂය තුල අංශ 4 ක් අභ්‍යන්තර විගණනයට ලක් කර කළමනාකරන සමාලෝචන රැස්වීමක් පැවැත්වීම

b. ලබාගත් ISO ප්‍රමිති සහතිකය 2015 වර්ෂය සඳහා ප්‍රමිති ආයතනය විසින් විගණනය කර යාවත්කාලීන කිරීම සඳහා යොමු වීම සහ එම සහතිකය යාවත්කාලීන කර ගැනීම

7.6 අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන වැඩසටහන් (Continuous Professional Development) උදෙසා වැඩමුළු පැවැත්වීම.

7.6.1 දෙමුහුන් මෝටර් කාර්මික තාක්ෂණය (Hybrid Technology) සහ අධිතාක්ෂණික මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය උදෙසා වැඩමුළුව

ටොයොටා ලංකා සමාගමේ ප්‍රවීණයන් දෙදෙනෙකු වන ජ්‍යෙෂ්ඨ පුහුණු උපදේශක අජිත් ජයකොඩි මහතා හා තාක්ෂණ උපදේශක විල්සන් පෙරේරා මහතා විසින් මෝටර් රථ කාර්මික ශිල්පී තාක්ෂණ උපදේශකවරුන් සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 5 හා 6 දෙමුහුන් තාක්ෂණය හඳුන්වාදීමේ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. මේ සඳහා උපදේශකවරුන් 35 දෙනෙකු සහභාගී වූ අතර එමඟින් මෝටර් රථ කර්මාන්තයේ නවීන තාක්ෂණය පිළිබඳ දැනුම එම උපදේශකවරුන් හට ලබා දීම අරමුණ විය.

7.7 ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) ක්‍රමය විදේශ රටවල ප්‍රවර්ධනය කිරීමට අවශ්‍යය වැඩ පිළිවෙල සැකසීම.

ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව විදෙස් රටවල ප්‍රවර්ධනය කිරීම තුලින් අප රටෙහි පුහුණු ශ්‍රමිකයන්ට විදෙස් රැකියා අවස්ථා ලබාදීම හා NVQ ක්‍රමවේදය සහ එහි සුදුසුකම් අනෙක් රටවල සුදුසුකම් හා සමකිරීම් සඳහා සුවිශේෂී වැඩසටහනක් දියත් කර ඇති අතර ඒ අනුව පහත සඳහන් රටවල ශ්‍රී ලංකා තනාපති කාර්යාලයන්හි උසස් නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් කරන ලද මූලික මට්ටමේ සාකච්ඡා සාර්ථක වී ඇත.

7.3 ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) මට්ටම් 5 හා 6 හි සමාංසික විභාග පැවැත්වීම සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම ප්‍රමිතිකරණය කිරීමට අදාල වු ක්‍රියාදාමයන් සහ තාක්ෂණ විද්‍යාල, කාර්මික විද්‍යාල සහ විශ්ව විද්‍යාල විද්‍යායතන අධීක්ෂණ ක්‍රියාවලිය.

a. තාක්ෂණ විද්‍යාල (COT) හා කාර්මික විද්‍යාලයන්හි NVQ මට්ටම් 5 සහ 6 පාඨමාලා සඳහා වු සමාංසික ප්‍රශ්න පත්‍ර ප්‍රමිතිකරණය කිරීම හා අවසාන ඇගයීම් සඳහා අවශ්‍ය ඇගයුම්කරුවන් පත් කිරීම.

b. NVQ මට්ටම් 5, NVQ මට්ටම් 6 පාඨමාලා ක්‍රියාත්මක වන අනෙකුත් වෘත්තිය පුහුණු ආයතනයන්හි සමාංසික විභාග සම්බන්ධීකරණය හා උපදේශනය සැපයීම.

7.4උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව සඳහා NVQ සහතිකයක් ලබා දීමට සැකසූ (GNVQ) නිපුණතා සම්මතයට අදාල ඇගයීම් ලේඛන සැකසීම.

2014 වසරේ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ වැඩසටහනක් ලෙස උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන සිසුන් වෙනුවෙන් GNVQ නමින් සකස් කරන ලද නිපුණතා සම්මතය සඳහා අදාල ඇගයීම් ලේඛන සකසා සම්මතකරණය (Validation) කරගන්නා ලදී. මේ තුලින් උසස් පෙළ හදාරණ සිසුන් වෙනුවෙන් NVQ සහතිකයක් ලබා දීමට බලාපොරොත්තු වේ. අදාළ නිපුණතා සම්මතය හා එහි සංක්ෂිප්ත විෂය මාලාවද 2014 දි සකසා ඇත.

7.5 කොමිෂන් සභාව තත්ව කළමනාකරණ පද්ධතිය (ISO 9001: 2008) ස්ථාපනය කිරීම සඳහා වු සහතිකකරණය යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම්,

a. 2015 වර්ෂය තුල අංශ 4 ක් අභ්‍යන්තර විගණනයට ලක් කර කළමනාකරණ සමාලෝචන රැස්වීමක් පැවැත්වීම

b. ලබාගත් ISO ප්‍රමිති සහතිකය 2015 වර්ෂය සඳහා ප්‍රමිති ආයතනය විසින් විගණනය කර යාවත්කාලින කිරීම සඳහා යොමු වීම සහ එම සහතිකය යාවත්කාලීන කර ගැනීම

7.6 අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන වැඩසටහන් (Continuous Professional Development) උදෙසා වැඩමුළු පැවැත්වීම.

7.6.1 දෙමුහුන් මෝටර් කාර්මික තාක්ෂණය (Hybrid Technology) සහ අධිතාක්ෂණික මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය උදෙසා වැඩමුළුව

ටොයොටා ලංකා සමාගමේ ප්‍රවිණයන් දෙදෙනෙකු වන ජ්‍යෙෂ්ඨ පුහුණු උපදේශක අජිත් ජයකොඩි මහතා හා තාක්ෂණ උපදේශක විල්සන් පෙරේරා මහතා විසින් මෝටර් රථ කාර්මික ශිල්පි තාක්ෂණ උපදේශකවරුන් සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 5 හා 6 දෙමුහුන් තාක්ෂණය හඳුන්වාදිමේ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදි. මේ සඳහා උපදේශකවරුන් 35 දෙනෙකු සහභාගී වූ අතර එමඟින් මෝටර් රථ කර්මාන්තයේ නවීන තාක්ෂණය පිළිබඳ දැනුම එම උපදේශකවරුන් හට ලබා දිම අරමුණ විය.

7.7 ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) ක්‍රමය විදේශ රටවල ප්‍රවර්ධනය කිරීමට අවශ්‍යය වැඩ පිළිවෙල සැකසීම.

ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව විදෙස් රටවල ප්‍රවර්ධනය කිරීම තුලින් අප රටෙහි පුහුණු ශ්‍රමිකයන්ට විදෙස් රැකියා අවස්ථා ලබාදිම හා NVQ ක්‍රමවේදය සහ එහි සුදුසුකම් අනෙක් රටවල සුදුසුකම් හා සමකිරීම් සඳහා සුවිශේෂි වැඩසටහනක් දියත් කර ඇති අතර ඒ අනුව පහත සඳහන් රටවල ශ්‍රී ලංකා තනාපති කාර්යාලයන්හි උසස් නිළධාරීන්ගේ සහාගිත්වයෙන් කරන ලද මූලික මට්ටමේ සාකච්ඡා සාර්ථක වී ඇත.

01. මාලදිවයින
02. ඉතාලිය
03. කොරියාව
04. සිංගප්පූරුව
05. දෝහා
06. ඉරාකය
07. ඕමානය
08. ජෝර්දානය
09. බහරේන්
10. කැනඩාව
11. ඊශ්‍රායලය

7.8.NVQ නොවන පාඨමාලාවන් (Non NVQ Qualification) හදාරනු ලැබූ සහතික ලාභීන්හට (NVQ) සමාන මට්ටමක් නිර්ණය කිරීමේ ක්‍රියාවලිය තුලින් සහතික ලබාදීම හා ඒ සඳහා පොදු සමීකරණයක් සැකසීම.

7.8.1. NVQ නොවන පාඨමාලාවන් හදාරන ලද අයඳුම්කරුවන් හට NVQ සමාන මට්ටමක් නිර්ණය කිරීමේ ක්‍රමවේදය තුලින් සහතික ලබා දීම.

මේ සඳහා පැවැත්වූ Professional Review හිදී සමත් වූවන් සඳහා NVQ සම කිරීම් සහතික පහත සඳහන් අයුරින් ලබා දෙන ලදි.

| a. | පාඨමාලාව | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|---|
| I. | කර්මාන්ත තාක්ෂණය සඳහා වූ ජාතික සහතිකය (සිවිල්)- (NCIT) | 17 |
| II. | ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) - (NCT) | 06 |
| III. | ජාතික තාක්ෂණ සහතිකය (විදුලි හා ඉලෙක්ට්‍රොනික්) - (NCT) | 06 |
| IV. | ජාතික තාක්ෂණ සහතිකය (යාන්ත්‍රික) - (NCT) | 05 |
| V. | ඉංජිනේරු විද්‍යාවන් පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (විදුලි) - (NDES) | 03 |
| VI. | ඉංජිනේරු විද්‍යාවන් පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) - (NDES) | 07 |
| VII. | වෘත්තිය හා තාක්ෂණ අධ්‍යාපන ජාතික ඩිප්ලෝමාව - (NDTVE) | 29 |
| VIII. | ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාව (සිවිල්) - (NDET) | 01 |

7.8.2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි සඳහන්ව ඇති චක්‍රලේඛනය යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් සමඟ ගැලපීමක් සිදුකර නොමැති NVQ නොවන අනෙකුත් පාඨමාලා NVQ සමඟ ගැලපීම සඳහා පොදු ක්‍රමවේදයක් සැකසීමේ අවශ්‍යතාවය මත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් ඊට අදාල සමීකරණයක් සැකසෙමින් පවතී. ඒ තුලින් ඉදිරියේදී NVQ නොවන පාඨමාලා සඳහා NVQ මට්ටමක් නිර්ණය කිරීමට හැකි වනු ඇත.

7.8.3. NVQ නොවන පාඨමාලාවන් හදාරන ලද අයඳුම්කරුවන් හට NVQ සමාන මට්ටමක් නිර්ණය කිරීමේ ක්‍රමවේදය තුලින් සහතික ලබා ඇති අයඳුම්කරුවන් හෝ තොරතුරු ගබඩා කිරීම සඳහා විධිමත් දත්ත ගබඩාවක් (Data Base) සැකසීම.

7.9. 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට පරිබාහිරව පැවැත්වූ වෙනත් ක්‍රියාකාරකම්

a. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 50 වන සංවත්සරය සඳහා පර්යේෂණයක් ලෙස යාවත්කාලීන වූ QMS පිළිබඳ ලිපිය සඳහා ඇගයීමක් ලෙස සහතිකයක් NVQ අංශයට ප්‍රධානය කිරීම.

b. ලෝක කම්කරු ආයතනයේ මූලිකත්වයෙන් NAITA ආයතනයේ OJT අධීක්ෂණ නිළධාරීන් 50ක් සඳහා කම්කරු නීතිය පිළිබඳ පුහුණුවක් ලබාදීම හා ඒ ආශ්‍රිත පොත් පිංචක් මුද්‍රණය කිරීම. (ILO Booklet)

c. බාහිර තත්ත්ව කළමනාකරණ පුහුණු ආයතනයන්හි විගණනය තුලින් තොරතුරු දත්ත ගබඩාව (QMS Data Base) සකස් කර එය ක්‍රියාත්මක කිරීම.

d. Steering, කමිටු රැස්වීම්

2015 ඔක්තෝම්බර් මස Steering කමිටුරැස්වීමක් පවත්වා NVQ ප්‍රවර්ධනය සඳහා (Implementation) ක්‍රියාමාර්ග (Activities) අදාල පාර්ශවයන් වෙත ලබා දුන් අතර මීලඟ රැස්වීම 2016 පෙබරවාරි පැවැත්වීමට තීරණය විය.

## ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්

1. හැඳින්වීම.

අප ඇගයීම් ඒකකය විසින් කරනු ලබන කාර්යයන් පහත දැක්වෙන අභිමතාර්ථයන් අනුව කොටස් කර දැක්විය හැක.

- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම
- ඇගයීම් නිලධාරි සංචිතය පවත්වා ගෙන යාම
- ඇගයීම් පැවැත්වීම පිළිබඳ පසු විපරම් කිරීම
- නිපුණතා පාදක ඇගයීම් වල සංඝතභාවය තහවුරු කරලීම
- ඇගයීම් පැවැත්වීම හා රූපලාවන්‍ය හා හිසකෙස් මෝස්තර ක්ෂේත්‍රයන්හි ලිඛිත විභාගයන් පැවැත්වීම

### 1.1 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම.

1.1.1 අන්තර් ආයතනික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.
ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීමේදී පැන නැගෙන ගැටළු හඳුනා ගැනීම හා එම හඳුනාගන්නා ලද ගැටළුවලට විසඳුම් සෙවීමේ එක් වාහකයෙකු ලෙස වසර 2004 දී මෙම අන්තර් ආයතනික මෙහෙයුම් කමිටුව ස්ථාපනය කරන ලදි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් මෙම කමිටුවේ සභාපතීත්වය දරන අතර, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශයට අයත් අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් මෙහි සමාජිකයින් වෙති. අප කොමිෂන් සභාවේ තීරණයකට අනුව, මෙම රැස්වීම පැවැත්වීමේ වගකීම ජාතික වෘත්තීය සුදුසුකම් අංශයට 2015 වසරේ ඔක්තෝබර් මස පවරා දෙන තෙක් ගත වී තිබූ කාලය තුළ එවැනි රැස්වීම් 05ක් සංවිධානය කරන ලද අතර, වාර්ෂික ඉලක්කය වූයේ එවැනි රැස්වීම් වාර 06කි.

### 1.2 ඇගයීම් නිළධාරී සංචිතය පවත්වා ගෙන යාම.

1.2.1 අවශ්‍ය වන ඇගයීම් නිළධාරි ප්‍රමාණය පුරෝකථනය කිරීම.
සකසා ඇති ජාතික නිපුණතා සංඛ්‍යාවන් හා 2014 වර්ෂයේ අවසන් වන විටදී සංචිතයේ ලියාපදිංචි වී සිටි ඇගයීම් නිළධාරී/ නිලධාරිනියන් සංඛ්‍යාවත්, එම නිළධාරීන්ගේ භූගෝලීය පැතිරීමත්, යන කරුණු සැලකිල්ලට ගෙන අවශ්‍ය වන ප්‍රමාණයන් පිළිබඳ පුරෝකථන වාර්තාව සකස් කරන ලදි.

1.2.2 නිපුණතා පාදක ඇගයීම් නිලධාරි/නිලධාරිනියන් ලෙස පුහුණු කිරීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.
නිපුණතා පාදක ඇගයීම් නිලධාරි/නිලධාරිනියන් ලෙස පත්වීම සඳහා පෞද්ගලික වශයෙන් ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා විශේෂයෙන් සකස් කළ ඉල්ලුම් පතක් භාවිත කරනු ලබයි. මෙහිදී අයදුම්පත් කැඳවීම සඳහා නිශ්චිත කාල වකවානුවක් නොමැති අතර, ලැබෙන ඉල්ලුම්පත් අතරින් සුදුස්සන් තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයන් මඟින් සිදු වේ.

අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කරන අතර, එවැනි සම්මුඛ පරීක්ෂණ දින 16ක් 2015 වසර තුළ පැවැත්වීමට සැලසුම් කර සිටි නමුදු ඉල්ලුම හා අවශ්‍යතාවයන්ට අනුව එවැනි දින 23ක් ගත වූ වසර තුළ පවත්වා ඇත.

1.2.3 ඇගයීම් නිලධාරි පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා එයට පහසුකම් සැපයීම.

අදාල පුහුණු කිරීමේ වැඩසටහන් 07ක් පහත සඳහන් ලෙස පවත්වන ලදි.

| | සහභාගි වූ සංඛ්‍යාව | පැවති වකවානුව |
|---|---|---|
| • 70 වනකණ්ඩායම | 25 | 18.05.2015 - 22.05.2015 |
| • 71 වන කණ්ඩායම | 37 | 22.06.2015 - 26.06.2015 |
| • 72 වන කණ්ඩායම | 33 | 20.07.2015 - 24.07.2015 |
| • 73 වන කණ්ඩායම | 36 | 31.08.2015 - 04.09.2015 |
| • 74 වන කණ්ඩායම | 38 | 12.10.2015 - 16.10.2015 |
| • 75 වන කණ්ඩායම | 17 | 16.11.2015 - 20.11.2015 |
| • 76 වන කණ්ඩායම | 38 | 14.12.2015 - 18.12.2015 |
| ඇගයීම් සංචිතයට ඇතුළත් වූ සංඛ්‍යාව | 224 | |

1.2.4 ඇගයීම්කරුවන් වෙත බලපත්‍ර ලබා දීම

අදාල ලිඛිත විභාගයකින් අනතුරුව එම විභාගය සමත්වන්නන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට පමුණවනු ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයට අනුව අදාල ඇගයීම් නිලධාරි/නිළධාරිනියන්ට බලපත්‍ර ලබා දීමට කටයුතු කෙරේ. අදාල ලිඛිත විභාගය 2015 ඔක්තෝබර් මස 03 වන දින පැවැත්වූ අතර, ඊට සුදුසුකම් ලැබූ ඇගයීම් නිළධාරි/නිළධාරිනියන් 261 දෙනෙකු මේ සඳහා ඉල්ලුම් කර තිබූ අතර සම්මුඛ පරිකෂණය ඉදිරියේදි පැවැත්වීමට කටයුතු කරනු ඇත.

1.3 නිපුණතා පාදක ඇගයීම් කටයුතු පසු විපරම් කිරීම.

මෙය යටතේ කාර්යයන් 03ක් පහත සඳහන් පරිදි සිදු කෙරේ.

- පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

1.3.1 පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල/ මධ්‍යස්ථානවල ප්‍රතීතනය කරනු ලැබ ඇති පාඨමාලාවන් අවසානයේ එම පාඨමාලා හදාරනු ලැබ තිබූ ආධුනික/ ආධුනිකාවන් ඇගයීමට ලක්කොට නිපුණතාවය ලැබ ඇති ආධුනික/ ආධුනිකාවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමේ.
එහිදී අදාල නිර්ණායකයන් පරීක්ෂා කොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම් කරුවන් පත්කොට ඔවුන් ලවා ඇගයීම් කටයුතු සංවිධානය කල යුතුය. මෙවැනි විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2015 වසර තුළ ඇගයීම් සඳහා කෙරුණ ඉල්ලීම් ප්‍රමාණය 480කි. 2015 වසරේ ඉලක්කය ඉක්ම වූ මෙම ඉල්ලීම් ප්‍රමාණයට හේතුව වූයේ පෞද්ගලික අංශය තුළ මෙම ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය බෙහෙවින් ජනප්‍රිය තත්වයකට පත්ව තිබීම යැයි අනුමාන කල හැක.

1.3.2 රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල/ ආයතනවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.

1.3.1 හි සඳහන් කර ඇති පරිද්දෙන් පෞද්ගලික අංශයෙන් බැහැරව රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතනවල/ මධ්‍යස්ථානවල ඇගයීම් කටයුතු සඳහාද ඇගයීම් පැවැත්වීම සඳහාද අනුමැතිය ලබා දීමේ කාර්යය කොමිෂන් සභාවේ ඇගයීම් ඒකකය විසින් ඉටු කරන ලදි.

එවැනි අනුමත ලබා දීම් ගත වූ වසර තුළ 2708 ක් ඉටු කරන ලද අතර, එම ඉල්ලීම් ඉදිරිපත් වූයේ යෞවන කටයුතු හා නිපුණතා අමාත්‍යංශයට අයත් මෙන්ම ඊට පරිබාහිරව පිහිටන ලද රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථාන/ ආයතනවලින් වේ. එම ආයතනයන් පහත සඳහන් පරිදි දැක්විය හැක.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශයට අයත් ආයතන/ පුහුණු මධ්‍යස්ථානයන්.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා යොවුන් බලකාය
- සාගර විශ්ව විද්‍යාලය
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශයට අයත් නොවන රාජ්‍ය ආයතයන්
- ජාතික තරුණ සේවා සභාව
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ඉහතින් සඳහන් කරනු ලැබූ නිපුණතා පාදක පුහුණු පාඨමාලා තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කරනවාට අතිරේකව තවත් එක් ක්‍රමයකට එම සුදුසුකම් ලබා දේ. එම ක්‍රමය මගින් කර්මාන්තය තුළ වෘත්තීන්හි නියැලී අත්දැකීම් ඇති පුද්ගලයන්ට මෙම සුදුසුකම සඳහා ඉල්ලුම් කළ හැකි අතර, එම ක්‍රමය පෙර දැනුම හැඳිනීමේ ක්‍රමය ලෙස හැඳින්වේ.

එම ක්‍රමය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා දීමට පහත සඳහන් රාජ්‍ය ආයතන 2 කට බලය පවරා ඇත
එම ආයතන 02 වන්නේ,

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

කෙසේ වෙතත් රාජ්‍ය ආයතන/ පුහුණු මධ්‍යස්ථාන තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමීම සඳහා වන ඇගයීම් සඳහා ගත වූ වසර තුළ දැඩි ඉල්ලුමක් පැවති බවක් දක්නට ඇති අතර, එය ඉලක්ක කළ ප්‍රමාණයට වඩා බෙහෙවින් ඉහළ යාමක් වේ. මෙවැනි අනුමත කිරීම් 1345ක් ගත වූ වසරේ ඉලක්කය වූ අතර, සත්‍ය ලෙසම එවැනි ඉල්ලීම් 2708ක් ගත වූ වසර තුළ ලබා දී ඇත.
මෙසේ වීමට පහත සඳහන් කරුණු හේතුවන්නට ඇතැයි අනුමාන කළ හැක.

- විදේශ රැකියා සඳහා පිටත්වන්නන් හට ජාතික වෘත්තීය සුදුසුකම අනිවාර්ය කරලීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු ආයතන සඳහා පුද්ගලයින් බඳවා ගැනීමේදී හා උසස් වීම් ලබා දීමේ දී ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය භාවිත කරන ලෙස අදාල ආයතනයන් වෙත රාජ්‍ය පරිපාලන අංශය මගින් දැනුම් දීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් සමාජය තුළ ප්‍රචලිත වීම.

### 1.3.3 පෙර දැනුම් ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම.

මෙම කාරණය යටතේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 02ක් සැලසුම් කර නමුදු එවැනි රැස්වීම් 03ක් ගත වූ වසර තුළ පවත්වා ඇත. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ පෙර දැනුම හැඳින්වීම ක්‍රමය පිළිබඳ ගැටළු හා අභියෝග පිළිබඳව එම අධිකාරියේ නිළධාරීන් සමඟ රැස්වීමක් පැවති අතර, ඊට අතිරේකව විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිළධාරී/නිළධාරිනියන් සමඟ රැස්වීම් වාර 02ක් පවත්වන ලදි එම කාර්යංශය තුළින් ගෘහස්ථ ගෘහ පාලිකා, තනතුර සඳහා විදේශ ගතවන්නන් හට විශේෂ පුහුණු පාඨමාලා දිවයින පුරා පිහිටි එම කාර්යංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වේ. එම පාඨමාලාවන් අවසානයේ ඇගයීම් පවත්වා ඔවුන් හට ජාතික වෘත්තීය සුදුසුකම් ලබා දේ. මෙම කාර්යංශය සමඟ මෙම වැඩසටහන ආරම්භ කර එතරම් කාලයක් තවම ගත වී නැති අතර, එසේම මෙම පුහුණු වැඩසටහනට සම්බන්ධ වන කාර්යංශයේ නිළධාරී/ නිළධාරිනියන් මේ ගැන එතරම් දැනුවත් නොවීම නිසා මතුව තිබූ සමහරක් ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීම සඳහා කාර්යංශය සමඟ රැස්වීම් වාර 02ක් පවත්වන ලදි.

## 1.4 නිපුණතා පාදක ඇගයීම් වල සංඝතභාවය තහවුරු කරලීම.

### 1.4.1 සංඝතභාවය තහවුරු කරලීමේ හා ඇගයීම් නිලධාරි/ නිළධාරිනියන්ගේ අදාල දැනුම යාවත්කාලින කරලීමේ වැඩමුළු පැවැත්විම.

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරා ගැනිමේ අරමුණින් වැඩ මුළු 6 ක් වසර තුල පැවැත්වීමට සැලසුම් කරන ලදි. ඒ අතරම මෙම නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2005 වසරේ දී වන අතර ඒ පළිබඳව ඇගයීම්කරුවන් පුහුණු කිරීම අරඹා ඇත්තේද එම වසරේ දීම වේ. මේ අනුව සමහර ඇගයීම් නිළධාරී/ නිලධාරිනියන්ගේ දැනුම නැවත යාවත්කරලීමේ අවශ්‍යතාවයක් මතුවී තිබිනි. එලෙසම සමහර ඇගයීම් නිළධාරී/ නිලධාරිනියන් විසින් ඇගයීම් කිරීමේ දී මතුවන ගැටළු සාකච්ඡා කරලීමේ අවශ්‍යතාවයක් ඇති හෙයින් ඔවුන් එක් රැස් කර වැඩමුළු පැවැත්විමේ අවශ්‍යතාවය ලිඛිතව ඇගයීම් නිළධාරී කිහිප දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලදි මෙම කරුණු සැලකිල්ලට ගෙන පහත සඳහන් පරිදි වැඩමුළු සංවිධානය කරන ලදි. මේ අනුව වෘත්තීන් වශයෙන් එක් වැඩ මුළුවක් හා භුගෝලීය වශයෙන් ඇගයීම්කරුවන්ගේ වැඩමුළු 7ක් පරිද්දෙන් වැඩමුළු 8 ක් 2015 වසර තුල පවත්වන ලදි.

| | | |
|---|---|---|
| ● 2015.09.18 | - | සැලසුම් ශිල්පය යන වෘත්තියට .අදාලව වූ වැඩමුළුව කොමිෂන් සභා සම්මන්ත්‍රණ ශාලාවේ දී |
| ● 2015.11.11 : උදය වරුව* | - | බස්නාහිර පලාතේ 1 වන කණ්ඩායමේ වැඩමුළුව අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී |
| ● 2015.11.11 : හවස් වරුව* | - | බස්නාහිර පලාතේ 2 වන කණ්ඩායමේ වැඩමුළුව අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී |
| ● 2015.11.12 : උදය වරුව* | - | බස්නාහිර පලාතේ 3 වන කණ්ඩායමේ වැඩමුළුව අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී |
| ● 2015.11.12 : හවස වරුව* | - | බස්නාහිර පලාතේ 4 වන කණ්ඩායමේ වැඩමුළුව අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී |
| ● 2015.11.17 | - | වයඹ පලාත් කණ්ඩායමේ වැඩමුළුව කුරුණෑගල තාකෂණ විද්‍යාලයේ දී |
| ● 2015.11.23 : උදය වරුව* | - | මධ්‍යම පලාතේ 1 වන කණ්ඩායමේ වැඩමුළුව මහනුවර අරුප්පල තාක්ෂණ විදුහල් ශාලාවේ දී |
| ● 2015.11.23 : හවස් වරුව* | - | මධ්‍යම පලාතේ 2 වන කණ්ඩායමේ වැඩමුළුව මහනුවර අරුප්පල තාකෂණ විදුහල් ශාලාවේ දී |

### 1.4.2 රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතු විගනණය කරලීම.

ගත වූ වසර තුල රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පහත සඳහන් අයුරින් පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් කටයුතු අප අංශය විසින් විගනණය කරන ලදි.

- රමණී අර්කුලරත්න ජාත්‍යන්තර ඇකඩමිය
  47/1. ගාලුපාර, බම්බලපිටිය.
  2015.05.22 හා 2015.06.10
- කර්මාන්ත ඉංජිනේරු පුහුණු අභ්‍යාස ආයතනය.
  කටුබැද්ද, මොරටුව.
  2015.12.22
- මහනුවර පුහුණු මධ්‍යස්ථානය
  ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
  කිරිබත්කුඹුර, මහනුවර.
  2015.12.22
- පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යංශය
  වැහැර, කුරුණෑගල.
  2015.12.29
- නිල්වලා පුහුණු මධ්‍යස්ථානය
  ගොකැරැල්ල.
  2015.12.29

1.4.3 පැමිණිලි විභාග කිරීම

ගතවූ වසර තුල ඇගයීම් පිළිබඳ ලිඛිත පැමිණිලි නොලැබූ බැවින් විභාග කිරීමක් සිදුවූයේ නැත.

## 1.5. ඇගයීම් පැවැත්වීම හා රූපලාවන්‍ය හා හිසකෙස් මෝස්තර ක්ෂේත්‍රයන්හි ලිඛිත විභාගයන් පැවැත්වීම

### 1.5.1 ඇගයීම් නිලධාරීන් වෙත ගෙවීම

අප අමාත්‍යාංශය යටතේ එන පහත සඳහන් ආයතනයන්හි පවත්වන ලද ඇගයීම් සඳහා සහභාගි වූ ඇගයීම් නිලධාරී/ නිලධාරිනියන්ගේ දීමනා හා ගමන් ගාස්තු අප කොමිෂන් සභාවේ ඇගයීම් ඒකකය විසින් ගෙවීම සඳහා කටයුතු කරන ලදි.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය (නිපුණතා පාදක පාඨමාලා සඳහා)*
3. ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (නිපුණතා පාදක පාඨමාලා සඳහා)*
4. ජාතික තරුණ සේවා සභාව

මෙම ශිර්ෂය යටතේ ඇගයීම් නිලධාරීන් 1894 දෙනෙකුගේ දීමනා ඇගයීම් ඒකකය විසින් සහතික කොට ගිණුම් අංශයට ඉදිරිපත් කරන ලදී. එම වවුචර් පත් වල මුළු වටිනාකම 18,008,132,04 ක් විය.

### 1.5.2 රූපලාවන්‍ය හා හිසකෙස් මෝස්තර ක්ෂේත්‍රයේ ලිඛිත විභාගයන් පැවැත්වීම

ගත වූ වසර තුල ප්‍රසිද්ධ දැන්වීම් පුවත්පත්වල පල කොට අයදුම්පත් කැඳවා රූපලාවන්‍ය හා හිසකෙස් මෝස්තර කේෂත්‍රයට අයත් පොදු ලිඛිත විභාගය මැයි මස හා දෙසැම්බර් මාසය තුල 2015 වසර තුල දෙවරක් පවත්වන ලදී.

| | ක්ෂේත්‍රය | අයදුම්පත් සංඛ්‍යාව | මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| 2015.05.09 | රූපලාවන්‍ය ශිල්පය | 2023 | |
| | හිසකෙස් මෝස්තර ශිල්පය | 1812 | 27 |
| | එකතුව | 3835 | |
| 2015.12.19 | රූපලාවන්‍ය ශිල්පය | 2699 | |
| | හිසකෙස් මෝස්තර ශිල්පය | 2963 | 26 |
| | එකතුව | 5662 | |

2015 වසරේ මැයි මස පැවති විභාගයෙන් සමත්වීමේ ප්‍රතිශතය රූපලාවන්‍ය ශිල්පය සඳහා 88.93% ක් වන අතර හිස කෙස් මෝස්තර ශිල්පය සඳහා 34.89% විය.

## ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

2015 වසර තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 44,148 ක් නිකුත් කර ඇති අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 7.4 2015 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්ලාභීන් (ආයතන අනුව)

| ආයතනය | සහතිකපත් ලාභීන් | | | සහතිකපත් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | නිපුණතා පාදක ඇගයීම් ප්‍රදාන ලාභීන් | පෙර දැනුම ඇගයීම් ප්‍රදාන ලාභීන් | මුළු සහතික ලාභීන් | නිපුණතා පාදක ඇගයීම් මගින් නිකුත්කල සහතික | පෙර දැනුම ඇගයීම අනුව නිකුත්කල සහතික | මුළු සහතික ප්‍රමාණය |
| කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | 3,615 | - | 3,615 | 4,171 | - | 4,171 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 1,846 | 8,650 | 10,494 | 2,028 | 9,759 | 11,787 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 8,106 | 516 | 8,610 | 9,749 | 735 | 10,484 |
| ජාතික තරුණසේවා සභාව | 1,025 | - | 1,025 | 1,244 | - | 1,244 |
| පෞද්ගලික අංශය | 14,790 | - | 14,790 | 16,462 | - | 16,462 |
| එකතුව | 29,382 | 9,166 | 38,428 | 33,654 | 10,494 | 44,148 |

මූලාශ්‍රය - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිත

2015 වර්ෂයේ නිකුත් කර ඇති සහතිකපත් 44,148 ඒ ඒ ආයතන වලින් පහත පරිදි NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම් වලට නිකුත්කර ඇත.

| ආයතනය | Level 1 | Level 2 | Level 3 | Level 4 | Level 5 | Level 6 | මුළු සහතික ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 186 | 804 | 6,999 | 3,798 | - | - | 11,787 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | - | 320 | 2180 | 1,435 | 227 | 9 | 4,171 |
| ජාතික තරුණසේවා සභාව | - | 193 | 579 | 472 | - | - | 1,244 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 37 | 1,181 | 6,866 | 2,367 | 33 | - | 10,484 |
| පෞද්ගලික අංශය | 5,592 | 1,892 | 7,222 | 1,702 | 54 | - | 16,462 |
| එකතුව | 5,815 | 4,390 | 23,846 | 9,774 | 314 | 9 | 44,148 |

වගුව 7.5 මුද්‍රණය කරනලද සහතිකපත් ප්‍රමාණය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත් වෘත්තීය පුහුණුව සපයන ආයතන - 2015

| පුහුණු ආයතනයේ නම | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| P01/0016 - ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය | 411 |
| P01/0078 - මවුන්ට් ලැවිනියා හෝටලය | 09 |
| P01/0102 - සසිකා ඩ්‍රෙස් ලයින් | 07 |
| P01/0161 - ලංකා ජර්මානු දුම්රිය කාර්මික පුහුණු ආයතනය | 57 |
| P01/0176 - දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය (හෝමාගම) | 34 |
| P01/0213 - ආසියානු ලංකා වෘත්තීය හා ජාත්‍යන්තර පුහුණු ආයතනය | 123 |

| | |
|---|---|
| P01/0221 - ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජිට්ස් ශ්‍රී ලංකා | 15 |
| P01/0222 - රූටිස් කේශාලංකරණ හා රූපලාවන්‍ය පුහුණු පාසල | 23 |
| P01/0223 - ප්‍රීමා සිලෝන් ලිමිටඩ් අනුබද්ධ පුහුණු ආයතනය | 67 |
| P01/0272 - ලිටිල් බඩීස් | 19 |
| P01/0247 - ටෙක්නික් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම | 12 |
| P01/0253 - ඉන්ටර්නැෂනල් ඇකඩමි ඔෆ් බියුටීෂන්ස් (පෞද්ගලික) සමාගම | 25 |
| P01/0257 - වින්-ස්ටෝන් හෝටල් පාසල | 244 |
| P01/0259 - ඩෙසිමල් ගාමන්ට් ඇන්ඩ් ටෙක්නොලොජි | 11 |
| P01/0266 - නවෝදා පරිගණක තාක්ෂණ ආයතනය | 07 |
| P01/0274 - ටෙක්නොලොජි ඇන්ඩ් කොම්පියුටර් ට්‍රේනින් ඉන්ස්ටිටියුට් (පෞද්ගලික) ආයතනය | 26 |
| P01/0290 - සැලොන් බර්නි ඇන්ඩ් ඇකඩමි | 12 |
| P01/0295 - සැලෝන් ලී කොයිෆර් තිලාක් | 18 |
| P01/0308 - ෆ්‍රිල්ස් බේකරි, ඉවුම් පිහුම් හා රසකැවිලි නිශ්පාදන පුහුණු ආයතනය | 26 |
| P01/0311 - ස්කිල්ස් ට්‍රේනින් ඇන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම | 14 |
| P01/0312 - ටෙක්සාස් නැෂනල් මොන්ටෙසෝරි සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය | 06 |
| P01/0314 - ලංකා ටෙක් කොම්පියුටර්ස් | 04 |
| P01/0322 - ඉන්ෆොනෙට් පරිගණක පුහුණු ආයතනය | 14 |
| P01/0326 - රන්මලී ඇසෝසියේට් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) ආයතනය | 45 |
| P01/0345 - ක්‍රියේටිවු ඇකඩමි | 16 |
| P01/0358 - ඇඩ්වාන්ස් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ට්‍රේනින් ඇකඩමි | 29 |
| P01/0391 - රංජනා සැලෝන් ඇන්ඩ් ඇකඩමි | 76 |
| P01/0406 - රමණී ෆර්නෑන්ඩො ට්‍රේනින් (පෞද්ගලික) සමාගම | 15 |
| P01/0426 - ඔෂන් යුනිවර්සිටි ඔෆ් ශ්‍රී ලංකා | 28 |
| P01/0430 - AMATT- ඇකඩමි ඔෆ් මේකප් ආර්ට් ඇන්ඩ් ටෙක්නොලොජි ට්‍රේනින් | 17 |
| P01/0461 - ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ෆිට්නස් ඇන්ඩ් නියුට්‍රිෂන් | 27 |
| P01/0488 - අයි කෙයාර් ඉන්ස්ටිටියුට් | 18 |
| P01/0513 - තිරාණි පීරිස් ඉන්ටර්නැෂනල් ඇකඩමි ඔෆ් බියුටි (පෞද්ගලික) සමාගම | 22 |
| P01/0524 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 284 |
| P01/0525 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 86 |
| P01/0530 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 38 |
| P01/0531 - රපුන්සෙල් (පෞද්ගලික) සමාගම | 22 |
| P01/0535 - ෆියුචර් ලින්ක්ස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 08 |
| P01/0541 - කාර්යය කරවන පුහුණු ආයතනය | 08 |
| P01/0594 - ඉන්ටර්නැෂනල් හෙල්ත් කෙයාර් ඇකඩමි (පෞද්ගලික) සමාගම | 65 |
| P01/0618 - සෝනල් ICT අධ්‍යාපන ආයතනය | 05 |
| P01/0630 - යුනිවර්සිටි කොලේජ් ඔෆ් කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි | 41 |
| P01/0692 - මාගා ඉංජිනියරින් (පෞද්ගලික) සමාගම | 86 |
| P02/0021 - ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් සීමාසහිත පොදු සමාගම | 68 |
| P02/0045 - දොන් බොස්කෝ තාක්ෂණ ආයතනය | 303 |
| P02/0073 - දියගල බෝයිස් ටවුන් | 60 |
| P02/0077 - දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය (වල්පිට) | 61 |
| P02/0078 - දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය (අඹේපුස්ස) | 08 |
| P02/0084 - එම්.ඩී.පී. පරිගණක පුහුණු ආයතනය | 72 |
| P02/0097 - බීටාකොම් මල්ටිමීඩියා සහ පරිගණක අධ්‍යාපන ආයතනය | 54 |

| | |
|---|---|
| P02/0104 - ටෙක්නොලොජි ඇන්ඩ් කම්පියුටර් අධ්‍යාපන ආයතනය | 48 |
| P02/0123 - එසී එම් අයි වෘත්තීය හෙද පුහුණු ආයතනය | 51 |
| P02/0152 - රන්ලිය ආයතනය | 24 |
| P02/0156 - රියල්වේ ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි | 3 |
| P02/0159 - ගුඩ් ෂෙෆර්ඩ් සිස්ටර්ස් | 71 |
| P02/0170 - යුනිෂෙයා පරිගණක පාසල | 12 |
| P02/0171 - ඇසෝසියේටඩ් මෝටර් වේස් ප්‍රයිවට් ලිමිටඩ් | 10 |
| P02/0182 - ජයනි හෙයාර් බියුටි ඇන්ඩ් බ්‍රයිඩල් ඩ්‍රෙසින් ට්වින් ඇකඩමි | 27 |
| P02/0193 - බුද්ධි විශේෂ අධ්‍යාපන සංවර්ධන පදනම | 20 |
| P02/0202 - බීටාකොම් මල්ටිමීඩියා සහ පරිගණක අධ්‍යාපන ආයතනය | 52 |
| P02/0204 - ජාතික යොවුන් සේනාංකය | 368 |
| P02/0205 - ජාතික යොවුන් සේනාංකය | 174 |
| P02/0206 - ජාතික යොවුන් සේනාංකය | 37 |
| P02/0215 - ජාතික යොවුන් සේනාංකය | 299 |
| P02/0216 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 21 |
| P02/0217 - මෙට්‍රොපොලිටන් ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් ඇන්ඩ් කොම්පියුටින් | 35 |
| P02/0236 - ජයනි කේශාලංකරණ හා රූපලාවන්‍ය පුහුණු ආයතනය | 39 |
| P02/0238 - ලලනි සචිත්‍රා සේවා පුහුණු ආයතනය | 20 |
| P02/0240 - තිරාණි පීරිස් ඉන්ටර්නැෂනල් ඇකඩමි ඔෆ් බියුටි (පෞද්ගලික)සමාගම | 12 |
| P02/0250 - ප්‍රිටි බ්‍රයිඩ්ස් ඇන්ඩ් සැලෝන් | 36 |
| P02/0262 - සැලෝන් ශ්‍රියා රත්නායක හෙයාර් ඇන්ඩ් බියුටි ඇකඩමි | 28 |
| P02/0271 - අල් සමීර් ලංකා පුහුණු ආයතනය | 63 |
| P02/0273 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 285 |
| P02/0286 - ඉන්ෆිනිටි පරිගණක අධ්‍යාපන ආයතනය | 9 |
| P02/0297 - කැලණිය සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 25 |
| P03/0019 - ඉක්රා තාක්ෂණ පුහුණු ආයතන | 199 |
| P03/0040 - දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය | 25 |
| P03/0046 - ශාන්ත වින්සන්ට් කාර්මික පාසල | 07 |
| P03/0048 - ජුලිස්ටන් ලංකා ඉන්ටර්නැෂනල් පුද්ගලික ආයතනය | 103 |
| P03/0067 - ඇගියෝ සිරිලක් සහන සේවා වෘත්තීය පුහුණු ආයතනය | 91 |
| P03/0076 - ශ්‍රී ලක් පරිගණක පුහුණු ආයතනය | 24 |
| P03/0085 - නේචර් වොලන්ටියර්ස් ආයතනය | 23 |
| P03/0087 - ආනෝ නාකෝ අධ්‍යාපන පදනම | 78 |
| P03/0091 - ජාතික යොවුන් සේනාංකය | 206 |
| P03/0099 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 144 |
| P03/0105 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය - කළුතර | 24 |
| P04/0007 - ජේසුයිට් ඇකඩමි | 04 |
| P04/0011 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 69 |
| P04/0071 - එන්. කේ. අයි. පරිගණක පුහුණු ආයතනය | 30 |
| P04/0090 - කොම් පරිගණක ආයතනය | 14 |
| P04/0094 - වන් වර්ල්ඩ් පදනම | 132 |
| P04/0105 - ලිඩක වේරි අධ්‍යාපන ආයතනය | 48 |
| P04/0129 - ජාතික යොවුන් සේනාංකය | 183 |
| P04/0131 - ජාතික යොවුන් සේනාංකය | 154 |

| | |
|---|---|
| P04/0134 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 156 |
| P04/0136 - ISF හෝටල් පාසල | 29 |
| P05/0100 - ජාතික යොවුන් සේනාංකය | 92 |
| P05/0106 - ජාතික යොවුන් සේනාංකය | 117 |
| P06/0040 - ශ්‍රී කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 121 |
| P06/0064 - ආසිරි I.C.T.A. මධ්‍යස්ථානය | 52 |
| P06/0072 - ජාතික යොවුන් සේනාංකය | 120 |
| P06/0073 - ජාතික යොවුන් සේනාංකය | 108 |
| P06/0075 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 32 |
| P06/0085 - DIMO නා සෙවන ටෙක්නිකල් ආයතනය | 05 |
| P07/0043 - ඉන්ස්ටිටියුට් ඔෆ් ප්‍රොප්‍රෙෂනල් කම්පියුටර් ස්ටඩීස් | 97 |
| P07/0065 - නැණසල නිව් ලංකා ටෙක් | 38 |
| P07/0075 - බලංගොඩ තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය | 13 |
| P07/0087 - ජාතික යොවුන් සේනාංකය | 190 |
| P07/0089 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 381 |
| P07/0093 - JNN ඇකඩමි | 13 |
| P07/0098 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය - බලංගොඩ | 15 |
| P08/0053 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව (SG.PC) | 13 |
| P08/0065 - ජාතික යොවුන් සේනාංකය | 150 |
| P08/0067 - ජාතික යොවුන් සේනාංකය | 98 |
| P08/0076 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 13 |
| P08/0080 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය - මාවනැල්ල | 15 |
| P09/0016 - චෝලන්කන්ද තරුණ පුහුණු මධ්‍යස්ථානය | 70 |
| P09/0055 - නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් කෝපරේටිව් ඩිවලොප්මන්ට් | 12 |
| P09/0080 - ක්‍රීඩා, යෞවන කටයුතු, කාන්තා හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය | 16 |
| P09/0091 - සුනේත්‍රා කේශලාවන්‍ය, රූපලාවන්‍ය හා මනාලියන් හැඩගැන්වීමේ පුහුණු ආයතනය | 73 |
| P09/0107 - ඉන්රූමා ඇකඩමි ඔෆ් හෙයා ඇන්ඩ් බියුටි (පෞද්ගලික) ආයතනය | 24 |
| P09/0120 - ටෙක් විෂන් ඉන්ටර්නැෂනල් පුහුණු පාසල (පුද්ගලික) සමාගම | 5 |
| P09/0155 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 321 |
| P09/0156 - ජාතික යොවුන් සේනාංකය | 111 |
| P09/0158 - ජාතික යොවුන් සේනාංකය | 260 |
| P09/0161 - මග නැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගම | 84 |
| P09/0165 - EWIS කැරියර් ට්‍රේනින් ප්‍රයිවට් ලිමිටඩ් | 08 |
| P09/0167 - ඩෙන්ටල් කෙයා ඉන්ටර්නැෂනල් | 12 |
| P09/0173 - ජාතික යොවුන් සේනාංකය | 162 |
| P09/0185 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත) | 18 |
| P10/0056 - ජාතික යොවුන් සේනාංකය | 92 |
| P10/0058 - ජාතික යොවුන් සේනාංකය | 155 |
| P10/0062 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත) | 32 |
| P11/0027 - ගාමිණී දිසානායක පදනම | 75 |
| P11/0043 - ජාතික යොවුන් සේනාංකය | 134 |
| P11/0044 - ජාතික යොවුන් සේනාංකය | 139 |
| P11/0045 - ජාතික යොවුන් සේනාංකය | 274 |

| | |
|---|---|
| P11/0049 - ක්‍රීඩා, යෞවන කටයුතු, කාන්තා හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය | 4 |
| P11/0052 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත) | 30 |
| P12/0076 - මයික්‍රොකොම් තාක්ෂණ විද්‍යායතනය | 68 |
| P12/0079 - ඇතුගල්පුර ගම නැගුම ආයතනය | 55 |
| P12/0092 - වයඹ කාර්මික විද්‍යාලය (පෞද්ගලික) | 536 |
| P12/0104 - සියාසි විද්‍යායතනය | 18 |
| P12/0113 - හයිටෙක් ලංකා ඉන්ටනැෂනල් | 363 |
| P12/0119 - ජාත්‍යන්තර පරිගණක පාසල | 45 |
| P12/0122 - සෙත් සෙවණ හෙදි පුහුණු ආයතනය | 122 |
| P12/0126 - සැලෝන් කුසුම් හෙයා, බියුටි ඇන්ඩ් බ්‍රයිඩල් ඇකඩමි | 57 |
| P12/0133 - නිව් ඉන්ස්ටිටියුට් ඔෆ් නර්සින් එඩියුකේෂන් | 21 |
| P12/0145 - දොන් බොස්කෝ වෘත්තීය පුහුණු ආයතනය, මහනුවර | 34 |
| P12/0151 - ජාතික යොවුන් සේනාංකය | 190 |
| P12/0152 - සණස තොරතුරු තාක්ෂණ ආයතනය | 28 |
| P12/0154 - ජාතික යොවුන් සේනාංකය | 148 |
| P12/0156 - ජාතික යොවුන් සේනාංකය | 280 |
| P12/0158 - ජාතික යොවුන් සේනාංකය | 59 |
| P12/0159 - ජාතික යොවුන් සේනාංකය | 136 |
| P12/0161 - ග්‍රීන් වේ විදේශ සේවා පුහුණු මධ්‍යස්ථානය | 43 |
| P12/0185 - ලංකා නර්සින් පාසල | 12 |
| P13/0030 - ටෙක්විතානිකා | 145 |
| P13/0039 - මර්සි අධ්‍යාපන ආයතනය | 104 |
| P13/0051 - ජාතික යොවුන් සේනාංකය | 167 |
| P13/0054 - දෙවන ජෝන් පාවුලු උසස් අධ්‍යාපන ආයතනය | 116 |
| P14/0038 - බිෂොප් ලියෝ තාක්ෂණ ආයතනය | 3 |
| P14/0056 - අනාගතය අපේ අතේ සංවර්ධන පදනම | 1 |
| P14/0069 - එස්.ඕ.එස්. ශ්‍රී ලංකා ළමා ගම්මාන | 13 |
| P14/0073 - ජාතික යොවුන් සේනාංකය | 268 |
| P14/0074 - ජාතික යොවුන් සේනාංකය | 138 |
| P14/0077 - හෝර්ටිකල්චර් ක්‍රොප්ස් ට්‍රේනින් ඇන්ඩ් ඩිවලොප්මන්ට් ඉන්ස්ටිටියුට් - බිබිල | 13 |
| P14/0082 - ශ්‍රී ලංකා මිනුම් දෙපාර්තමේන්තුව | 991 |
| P15/0006 - ශ්‍රී සෝභිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 48 |
| P15/0021 - වෙල්ෆෙයාර් සංවර්ධන මධ්‍යස්ථානය | 15 |
| P15/0025 - ශාන්ත අන්තෝනි තාක්ෂණ ආයතනය | 83 |
| P15/0028 - එස්.ඕ.එස්. ළමා ගම්මානය | 95 |
| P15/0039 - වෙල්ලස්ස සංවර්ධන සමාජය | 96 |
| P15/0053 - ඌව පළාත් ICT අධ්‍යාපන ආයතනය | 44 |
| P15/0055 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 15 |
| P16/0060 - දොන් බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 211 |
| P16/0076 - නැණස පරිගණක ආයතනය | 85 |
| P16/0086 - ජාතික යොවුන් සේනාංකය | 69 |
| P16/0087 - ජාතික යොවුන් සේනාංකය | 131 |
| P16/0088 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 41 |

| | |
|---|---|
| P16/0089 - ජාතික යොවුන් සේනාංකය | 164 |
| P16/0098 - දිස්ත්‍රික් කෝපරේටිව් බෝඩ් | 15 |
| P17/0054 - ජාතික යොවුන් සේනාංකය | 106 |
| P18/0011 - උසස් අධ්‍යාපන ආයතනය | 62 |
| P18/0025 - චර්ප්ලින්ක් පරිගණක පුහුණු සහ ව්‍යාපාර කළමණාකරන ආයතනය | 31 |
| P18/0054 - ශ්‍රී ලංකා විදේශ සේවා පුහුණු ආයතනය | 75 |
| P19/0019 - කින්නියා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ඩස්ට්‍රියල් ටෙක්නොලොජිස් | 38 |
| P19/0038 - නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් ෆිෂරීස් ඇන්ඩ් නෝටිකල් ඉන්ජිනියර්ස් | 01 |
| P19/0040 - ජාතික යොවුන් සේනාංකය | 113 |
| P19/0041 - ඉන්ෆොගේට් ආයතනය | 87 |
| P19/0051 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 44 |
| P19/0052 - පරිගණක සම්පත් මධ්‍යස්ථානය - ත්‍රිකුණාමලය | 39 |
| P19/0053 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 108 |
| P20/0026 - සෙන් ජෝන් VTC | 5 |
| P20/0035 - රෝයල් පරිගණක ආයතනය | 126 |
| P20/0036 - මියානි තාක්ෂණ ආයතනය | 77 |
| P20/0057 - සෝනල් පරිගණක සම්පත් මධ්‍යස්ථානය | 32 |
| P20/0063 - විවේකානන්ද තාක්ෂණ ආයතනය | 47 |
| P20/0066 - ගයිඩ් නෝෂන් උසස් කාර්මික අධ්‍යාපන ආයතනය | 10 |
| P20/0072 - පරිගණක සම්පත් මධ්‍යස්ථානය - මඩකලපුව | 18 |
| P22/0008 - වයි ග්‍රො (පුද්ගලික) ආයතනය | 17 |
| P24/0013 - දොන් බොස්කෝ කාර්මික පුහුණු ආයතනය | 63 |
| P25/0066 - සෝනල් අධ්‍යාපන කාර්යාලය | 25 |
| එකතුව | 16,462 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

මීට අමතරව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2015 වසර සඳහා සහතිකපත් 985 නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර වගු අංක 7.6 දැක්වේ.

වගුව 7.6 නැවත මුද්‍රණය කරන ලද සහතික පත්‍ර පිළිබඳ විස්තර - 2015

| සහතික වර්ගය | සහතික පත්‍ර ප්‍රමාණය |
|---|---|
| මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර | 984 |
| අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය | 1 |
| එකතුව | 985 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

මුද්‍රණයකරන ලද සහතිකපත් ප්‍රමාණය වෘත්තීන් අනුව පහත වගු අංක 7.7 හි දැක්වේ.

වගුව 7.7 මුද්‍රණය කරන ලද සහතික පත්‍රප්‍රමාණය - වෘත්තීන් අනුව

| කේතය | විෂය මාලාව | කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය | වෘත්තීය පුහුණු අධිකාරිය | ජාතික තරුණ සේවා සභාව | පෞද්ගලික අංශය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| A01S001 | පැළ තවාන් සංවර්ධන සහකාර | - | - | - | 23 | 21 | 44 |
| A01S002 | ක්ෂේත්‍ර නිලධාරී (රබර්) | - | - | - | - | - | - |
| A01S003 | ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම) | - | 29 | - | 46 | 188 | 263 |
| A01S004 | සහකාර කම්හල් නිලධාරී (රබර්) | - | - | - | - | - | - |
| A01S005 | සහකාර කම්හල් නිලධාරී (තේ) | - | - | - | - | - | - |
| A01S006 | සහකාර ක්ෂේත්‍ර නිලධාරී (තේ) | - | - | - | - | - | - |
| A01S007 | සත්ත්ව ආහාර නිෂ්පාදන සහකාර (ක්ෂේත්‍ර මෙහෙයුම්) | - | - | - | - | - | - |
| A01S008 | සත්ත්ව ආහාර කම්හල් ක්‍රියාකරු | - | - | - | - | - | - |
| A01S009 | කුරුළු ක්ෂේත්‍ර ක්‍රියාකරු | - | - | - | - | - | - |
| A01S010 | කුරුළු කම්හල් ක්‍රියාකරු | - | - | - | - | - | - |
| A01S011 | කණ්ඩායම් සුපරීක්ෂක (කංකානි) | - | - | - | - | - | - |
| A01S013 | කෘෂිරසායන අලෙවි කිරීමේ කාර්මික සහකාර | - | - | - | - | - | - |
| A01T001 | ගොවිපල උපකරණ තාක්ෂණය | 9 | - | - | - | - | 9 |
| A01T002 | මල්වගාව හා භූමි අලංකරණ තාක්ෂණය | - | - | - | - | - | - |
| A01T003 | කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය | - | - | - | - | - | - |
| A01T004 | තේ තාක්ෂණය | - | - | - | - | - | - |
| A01T005 | පසු අස්වනු තාක්ෂණය | - | - | - | - | - | - |
| A01T006 | වැවිලි වගා තාක්ෂණය | - | - | - | - | - | - |
| A02S001 | ක්ෂේත්‍ර සහකාර (වන) | - | - | - | - | - | - |
| A02T001 | වන ක්ෂේත්‍රය | - | - | - | - | - | - |
| B05S001 | ධීවර අස්වනු කාර්මික | - | - | - | - | - | - |
| B05S002 | ධීවර බෝට්ටු ක්‍රියාකරු | - | - | - | - | - | - |
| B05S003 | ස්කුබා ඩ්‍රයිවර් | - | - | - | - | - | - |
| B05S004 | මාළුවගා තාක්ෂණික ශිල්පී | - | - | - | - | - | - |
| B05T001 | ධීවර තාක්ෂණය | - | - | - | - | - | - |
| B05T002 | ජල ජීවී හා ජලජ සම්පත් තාක්ෂණය | - | - | - | - | - | - |
| BCS01 | වැඩලොව නිපුණතා | - | 167 | - | - | 5592 | 5759 |
| D15S001 | පලතුරු හා එළවළු සැකසුම් ශිල්පී | 31 | 4 | - | - | - | 35 |
| D15S002 | බේකරි ශිල්පී | - | 101 | 491 | 17 | 496 | 1105 |
| D15S003 | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහකාර | - | - | - | - | - | - |
| D15S004 | කිරි ගොවිපොල සහකාර | - | - | - | - | - | - |
| D15S005 | කිරි දෙවීමේ යන්ත්‍ර ක්‍රියාකරු | - | - | - | - | - | - |
| D15S006 | මැෂින් ක්‍රියාකරු(බීම කර්මාන්තය) | - | - | - | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| D22S005 | මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියා කරන්නා | - | - | - | - | - | - |
| D22T001 | ඩිජිටල් ඡායාකරණය හා මුද්‍රණ තාක්ෂණය | - | - | - | - | - | - |
| D22T002 | දෘශ්‍ය සන්නිවේදනය | - | - | - | - | - | - |
| D22T003 | පුවත්පත් කලාවේදය | - | - | - | - | - | - |
| D24T001 | රසායන හා ක්‍රියාවලි තාක්ෂණය | - | - | - | - | - | - |
| D25S001 | ප්ලාස්ටික් ක්‍රියාවලි යන්ත්‍ර ක්‍රියාකරු | - | - | - | - | - | - |
| D25S002 | රබර් ක්‍රියාවලි යන්ත්‍ර ක්‍රියාකරු | - | 1 | - | - | - | 1 |
| D25T001 | පොලිමර් තාක්ෂණය | - | - | - | - | - | - |
| D26S001 | මැණික්ගල් ඔප දමන්නා | - | 2 | - | - | - | 2 |
| D26S002 | පයිබර්ග්ලාස් වැඩ ශිල්පී | - | - | - | - | - | - |
| D28S001 | පිරිසැකසුම් ශිල්පී (යකඩ) | - | 134 | 19 | - | - | 143 |
| D28S002 | පෑස්සුම් ශිල්පී | 294 | 575 | 479 | - | 280 | 1628 |
| D28S003 | මෙවලම් හා අච්චු සාදන්නා | - | - | - | - | 8 | 8 |
| D28S004 | වෑද්දුම් ශිල්පී | - | 243 | - | - | - | 243 |
| D28S005 | ප්ලාස්ටි පින්තාරු ශිල්පී | - | - | - | - | - | - |
| D28T001 | පෑස්සුම් තාක්ෂණය | 3 | - | - | - | - | 3 |
| D29S001 | යන්ත්‍ර ශිල්පී | 161 | 149 | 77 | - | 133 | 520 |
| D29S002 | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී | 253 | 146 | 371 | - | 273 | 1043 |
| D29S003 | තේ කම්හල් යාන්ත්‍රික ශිල්පී | - | - | - | - | - | - |
| D29S004 | මහන යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ශිල්පී | - | 10 | 58 | - | - | 68 |
| D29S005 | ශීතකරණ හා වායුසමීකරණ යන්ත්‍ර සේවාකරු | - | - | - | - | - | - |
| D29S006 | බහුකාර්ය නඩත්තු ශිල්පී | - | - | - | - | - | - |
| D29T001 | නිෂ්පාදන තාක්ෂණය | 4 | - | - | - | - | 4 |
| D32S001 | ගුවන් විදුලි, රූපවාහිනී හා ආශ්‍රිත උපකරණ කාර්මික | 101 | 56 | 121 | 8 | 8 | 294 |
| D32S002 | ඉලෙක්ට්‍රොනික් උපකරණ කාර්මික | - | - | - | - | - | - |
| D32T001 | ඉලෙක්ට්‍රොනික තාක්ෂණය | - | - | - | - | - | - |
| D32T002 | රූපවාහිනී පසු නිෂ්පාදන තාක්ෂණය | - | - | - | - | - | - |
| D32T003 | රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණය | - | - | - | - | - | - |
| D33S001 | කාර්මික මෙකාට්‍රොනික් ශිල්පී | - | - | - | - | - | - |
| D33T001 | මෙකාට්‍රොනික් තාක්ෂණය | 19 | - | - | - | - | 19 |
| D35S001 | බෝට්ටු නිෂ්පාදන ශිල්පී | - | - | - | - | - | - |
| D35S002 | නැව්තටාක අධීක්ෂණ | - | - | - | - | - | - |
| D36S001 | දැව ශිල්පී (ගෘහ භාණ්ඩ) | 48 | 167 | 333 | - | 36 | 584 |
| D36S002 | රන් ආභරණ ගල් බඳින්නා | - | - | 30 | - | - | 30 |
| D36S003 | රන් ආභරණ සාදන්නා | 17 | 27 | 18 | - | - | 62 |
| D36S004 | දැව කැටයම් නිර්මාණකරු | - | - | - | - | - | - |
| D36T001 | රන් ආභරණ මෝස්තරකරණය හා නිෂ්පාදන තාක්ෂණය | - | - | - | - | - | - |
| E40S001 | විදුලි කාර්මික | 293 | 1289 | 1242 | 15 | 447 | 3286 |
| E40S002 | ගෘහාශ්‍රිත විදුලි උපකරණ කාර්මික | 12 | 16 | 41 | - | - | 69 |
| E40S003 | විදුලි මෝටර් ඔතන්නා | - | 17 | 226 | - | 13 | 256 |
| | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| E40S004 | ජල පීඩන තාක්ෂණ ශිල්පී | - | - | - | - | - | - |
| E40S005 | බොයිලේරු ක්‍රියාකරු | - | 1 | - | - | - | 1 |
| E40S006 | විදුලි කම්බි ඇදීමේ ශිල්පී | - | - | - | - | - | - |
| E40T001 | විදුලි තාක්ෂණය | - | - | - | - | - | - |
| E41S001 | ජලනල ශිල්පී | 87 | 349 | 198 | - | 58 | 692 |
| E41S002 | කර්මාන්ත ජලනල ශිල්පී | - | - | - | - | - | - |
| E41T001 | වාරිමාර්ග තාක්ෂණය | - | - | - | - | - | - |
| F45S001 | කම්බි නැවුම්කරු | - | 72 | - | - | - | 72 |
| F45S002 | ගොඩනැගිලි පින්තාරු ශිල්පී | - | 87 | - | - | - | 87 |
| F45S003 | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී | 151 | 28 | 329 | - | 5 | 513 |
| F45S004 | දැව ශිල්පී (ගොඩනැගිලි) | 9 | 179 | 28 | - | - | 216 |
| F45S005 | ඉදිකිරීමේ ශිල්පී (මේසන්) | 77 | 1164 | 270 | - | 86 | 1597 |
| F45S006 | ඉදිකිරීමේ බිම් පරීක්ෂක | 186 | 106 | - | 2 | 48 | 342 |
| F45S007 | සහකාර මිනුම් ශිල්පී | - | 25 | - | - | 29 | 54 |
| F45S008 | ඉදිකිරීමේ උපකරණ ක්‍රියාකරු | - | 177 | 76 | - | 457 | 710 |
| F45S009 | සැලසුම් ශිල්පී | 117 | 44 | 2 | - | 87 | 250 |
| F45S010 | මහාමාර්ග ඉදිකිරීමේ ශිල්පී | - | - | - | - | - | - |
| F45S011 | රසායනාගාර සහකාර (ඉදිකිරීම්) | - | - | - | - | - | - |
| F45S012 | මහාමාර්ග ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු | - | - | - | - | - | - |
| F45S013 | අභ්‍යන්තර අලෙවිකරණ ශිල්පී | - | - | - | - | - | - |
| F45S014 | සෝපාන කාර්මික | - | - | - | - | - | - |
| F45S015 | ගොඩනැගිලි සේවක තාක්ෂණය | - | - | - | - | - | - |
| F45S016 | ඉනිමං ශිල්පී | - | - | - | - | - | - |
| F45S017 | පිඟන් ගඩොල් අතුරන්නා | - | 2 | - | - | - | 2 |
| F45S018 | බහුකාර්ය ඉදිකිරීම් ශිල්පී | - | - | - | - | - | - |
| F45T001 | ඉදිකිරීමේ තාක්ෂණය | 18 | - | - | - | - | 18 |
| F45T002 | ප්‍රමාණ සමීක්ෂණය | - | - | 33 | - | - | 33 |
| F45T003 | සැලසුම් තාක්ෂණය | - | - | - | - | 13 | 13 |
| F45T004 | ගොඩනැගිලි සේවා තාක්ෂණය | - | - | - | - | - | - |
| F45T005 | අභ්‍යන්තර මෝස්තර තාක්ෂණය | - | - | - | - | - | - |
| F45T006 | ඉදිකිරීම් උපකරණ නඩත්තු තක්ෂණය | - | - | - | - | - | - |
| G50S001 | මෝටර් වාහන වායුසමීකරණ කාර්මික | - | 51 | 33 | - | 02 | 86 |
| G50S002 | මෝටර් වාහන විදුලි ශිල්පී | - | 149 | 104 | - | 27 | 280 |
| G50S003 | මෝටර් වාහන කාර්මික | 393 | 683 | 252 | 40 | 477 | 1849 |
| G50S004 | මෝටර් වාහන පින්තාරු ශිල්පී | 16 | 108 | 39 | - | - | 163 |
| G50S005 | මෝටර් වාහන තහඩු ශිල්පී | 03 | 68 | 59 | - | - | 130 |
| G50S006 | යතුරුපැදි කාර්මික | 18 | 54 | 522 | 04 | 20 | 618 |
| G50S007 | ත්‍රිරෝද රථ කාර්මික | 29 | 09 | 101 | - | - | 139 |
| G50S008 | කෘෂිකාර්මික උපකරණ කාර්මික | - | 10 | - | 22 | - | 32 |
| G50S009 | පිටත බෝට්ටු මෝටර් කාර්මික | - | - | 07 | - | 01 | 08 |
| G50S010 | ඉදිකිරීම් උපකරණ කාර්මික | - | 1 | - | - | - | 1 |
| G50S011 | ධීවර බෝට්ටු කාර්මික | - | - | - | - | - | - |
| G50S013 | ඩීසල් පොම්ප ක්‍රියාකරු | - | 1 | - | - | - | 1 |
| G50T001 | මෝටර්රථ තාක්ෂණය | 16 | - | - | - | 33 | 49 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| G50T002 | බරවාහන නඩත්තු තාක්ෂණය | - | - | - | - | - | - |
| G52S001 | අලෙවි නියෝජිත | - | - | - | - | - | - |
| G52S002 | සුපිරි වෙළඳසැල් සේවා සහකාර | - | - | - | - | - | - |
| G52T001 | ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය | 19 | - | - | - | - | 19 |
| G52T002 | ගිණුම් ක්ෂේත්‍රය | - | - | - | - | - | - |
| H55S001 | වේටර් | - | 52 | 3 | - | 281 | 336 |
| H55S002 | කාමර සහකාර | - | 28 | 11 | - | 50 | 89 |
| H55S003 | අරක්කැමි | - | 121 | 313 | - | 99 | 533 |
| H55S004 | බිම්හල් පාලක | - | - | - | - | - | - |
| H55S006 | අමුත්තන් පිළිගැනීමේ නිලධාරී | - | - | - | - | - | - |
| H55S007 | ගෘහ පාලක සුපරීක්ෂක | - | - | - | - | - | - |
| H55T001 | සංචාරක කළමනාකරණ | - | - | - | - | - | - |
| H55T002 | ඉසව් කළමනාකරණ | - | - | - | - | - | - |
| H55T003 | සත්කාරක සේවා කළමනාකරණ | - | - | - | - | - | - |
| I63S001 | ගබඩා පාලක | - | 83 | - | - | - | 83 |
| I63S002 | බරවාහන ක්‍රියාකරු | - | 84 | - | - | - | 84 |
| I63S003 | නැව්භාණ්ඩ ලිපිකරු | - | - | - | - | - | - |
| I63S004 | වාහන සේවාකරු හා අභ්‍යන්තර සේවා ශිල්පී | - | 70 | - | - | - | 70 |
| I63S005 | සංචාරක මගපෙන්වන්නා | - | - | - | - | - | - |
| I63S007 | ප්‍රජා මූලික සංචාරක ක්‍රියාකරු | - | - | - | - | - | - |
| I63S008 | රබර් කාර්මික | - | 10 | - | - | - | 10 |
| I63S009 | ක්‍රේන් ක්‍රියාකරු | - | - | - | - | - | - |
| I63T001 | මුහුදු ප්‍රවාහනය හා ගබඩාකරණ කළමනාකරණය | - | - | - | - | - | - |
| I64S001 | විදුලිසංදේශ කාර්මික | 05 | 22 | - | - | - | 27 |
| I64T001 | විදුලිසංදේශ තාක්ෂණය | - | - | - | - | - | - |
| J65S001 | වෙළඳ සහකරු | - | - | - | - | - | - |
| K72S001 | පරිගණක දෘඩාංග කාර්මික | 87 | 104 | 526 | 45 | 42 | 804 |
| K72S002 | පරිගණක ජාල කාර්මික | 156 | 33 | - | 41 | 16 | 246 |
| K72S003 | පරිගණක යෙදවුම් සහකාර | 892 | 922 | 1399 | 498 | 2596 | 6307 |
| K72S004 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කාර්මික | 474 | 656 | 492 | 03 | 43 | 1668 |
| K72S904 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | - | - | - | - | - | - |
| K72T001 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 137 | - | - | - | 08 | 145 |
| K74S001 | ලේකම් (ලේකම් පරිචය) | 4 | 10 | 1 | 4 | - | 19 |
| K74S002 | පිළිගැනීමේ නිලධාරී | - | 1 | - | - | 4 | 5 |
| K74S003 | මුදල් අයකැමි (සුපිරි වෙළඳසැල්/ සාමාන්‍ය) | - | - | - | - | - | - |
| K74S004 | ලේකම් (සාමාන්‍ය) | - | 381 | - | - | 23 | 404 |
| K74S005 | ඡායාරූප ශිල්පී | - | 10 | - | - | - | 10 |
| K74S006 | මැහුම් ක්ෂේත්‍ර සහකාර | - | 210 | - | - | 991 | 1201 |
| L75S001 | ජීවිතාරක්ෂක | - | - | - | - | - | - |
| M80S001 | පෙර පාසල් ගුරු | - | 58 | - | 26 | 107 | 191 |
| M80T001 | වෘත්තීය හා කාර්මික පුහුණුව සැපයීම | - | - | - | - | - | - |
| N85S001 | ජීව-වෛද්‍ය කාර්මික | - | - | - | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| N85S002 | හෙද සහකාර | - | 40 | - | - | 329 | 369 |
| N85S003 | අක්ෂි කාර්මික | - | 26 | - | - | 18 | 44 |
| N85S004 | දන්ත හෙද සහකාර | - | - | - | - | 12 | 12 |
| N85S005 | ප්‍රථමාධාර ශිල්පී | - | 33 | - | - | - | 33 |
| N85S007 | රසායනාගාර සහාකාර | - | - | - | - | - | - |
| N85S009 | වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය නිලධාරී (වැවිලි) | - | - | - | - | - | - |
| N85S010 | උවටැන් කරන්නා | - | - | - | - | 65 | 65 |
| N85S011 | වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂණ නිළධාරී | - | - | - | - | - | - |
| N85T001 | ජීව-වෛද්‍ය උපකරණ තාක්ෂණය | - | - | - | - | - | - |
| O90S001 | කෘමි පාලක | - | - | - | - | - | - |
| O90S002 | නාගරික ඝණ ද්‍රව්‍ය මෙහෙයුම් සහකාර | - | 83 | - | - | - | 83 |
| O90S003 | නාගරික ඝණ අපද්‍රව්‍ය මෙහෙයුම් සුපරීක්ෂක | - | - | - | - | - | - |
| O92S001 | භූමි අලංකරණ කාර්මික | - | 12 | - | - | 94 | 106 |
| O92S002 | වේෂ නිරූපණ ශිල්පී | - | - | - | - | 17 | 17 |
| O92S003 | සිනමා හා රූපවාහිනී විදුලි අලෙවිකරණ ශිල්පී | - | 2 | - | - | - | 2 |
| O92S004 | වීඩියෝ සංස්කාරක | - | 3 | - | - | - | 3 |
| O92S005 | අවමංගල්‍ය අධ්‍යක්ෂක | - | - | - | - | - | - |
| O92S006 | මාංශ පේශී පුහුණු කරන්නා | - | 13 | - | - | 27 | 40 |
| O92S007 | ඉසව් මෙහෙයවීම | - | - | - | - | - | - |
| O93S001 | රූපලාවන්‍ය ශිල්පී | - | 1509 | 833 | 269 | 292 | 2903 |
| O93S002 | කේෂාලංකරණ ශිල්පී | - | 152 | 366 | 146 | 328 | 992 |
| O93S003 | ඇඳුම් සේදීමේ කාර්මික | - | - | - | - | - | - |
| O93T001 | රූපලාවන්‍ය තාක්ෂණය | - | - | - | - | - | - |
| O95S001 | ගෘහපාලන සහකාර | - | 19 | - | - | 1990 | 2009 |
| එකතුව | | 4171 | 11787 | 10484 | 1244 | 16462 | 44148 |

මූලාශ්‍රය - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2015 වර්ෂයේදී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) වගුව 7.8 හි දැක්වේ.

වගුව 7.8 2015 වර්ෂය සඳහා නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍ර ප්‍රමාණය (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)

| ආයතනය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | 2,293 | 1,322 | 3,615 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය | 7,233 | 3,261 | 10,494 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 5,801 | 2,809 | 8,610 |
| ජාතික තරුණ සේවා සභාව | 349 | 676 | 1,025 |
| පෞද්ගලික අංශය | 7,895 | 6,895 | 14,790 |
| එකතුව | 23,571 | 14,963 | 38,534 |

මූලාශ්‍රය - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

පහත වගු අංක 7.9 මගින් 2015 වර්ෂයේ නිකුත්කල NVQ සහතික පෙර වර්ෂය සමඟ සැසඳීමක් දැක්වේ.

වගුව 7.9 2014 හා 2015 වර්ෂ වලදී නිකුත් කල ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය අතර සංසන්දනයක් (පෙර දැනුම ඇගයුම හා නිපුණතා පාදක ඇගයීම මගින්)

| සහතික වර්ගය | 2014 | 2015 | වර්ධනය (සහතිකපත් ප්‍රමාණය) | වර්ධනය ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය | 23,726 | 33,654 | 9,928 | 41.84439 |
| පෙර දැනුම ඇගයීම් ක්‍රමය | 4,820 | 10,494 | 5,674 | 117.7178 |
| එකතුව | 28,546 | 44,148 | 15,602 | 54.65564 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2006 වර්ෂයේ සිට මුද්‍රණය කරනලද සහතික පිළිබඳ විස්තර වගු අංක 7.10 හි දැක්වේ.

වගුව 7.10 2006 සිට 2015 දක්වා මුද්‍රණය කරනලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සහතිකපත්‍ර සංඛ්‍යාව | 259 | 1,629 | 8,915 | 11,249 | 13,256 | 16,572 | 18,111 | 22,855 | 28,546 | 44,148 | 165,540 |

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය




තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2015 වර්ෂය අවසාන වන විට සහතිකපත් 165,540 ක් නිකුත්කර ඇත.

# 8. තොරතුරු පද්ධති අංශය

ආයතනයක සංවර්ධනය සඳහා උපායමාර්ගික තීරණ ගැනීමේදී ඉතා වැදගත් සාධකයක් වන්නේ තොරතුරු සම්පතය. මෙම තොරතුරු සම්පත් එක් එක් පුද්ගලයන්ට හා ආයතනවලට අවශ්‍ය පරිදි ලබාදීම හා ලබාගැනීම සංවර්ධනය සඳහා ඉතා වැදගත් සාධකයක් වේ. නවීනතම තාක්ෂණය උපයෝගී කරගෙන ලබාදෙන තොරතුරු සේවාව පැතුරුණු හා සංකීර්ණ කාර්යයක් වන අතර එම තොරතුරු ලබාගැනීම තාක්ෂණය උපයෝගී කරගෙන පහසුවෙන් කළ හැකිය. කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීමේ කාර්යය ඉටු කරනු ලැබේ. මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගන්නා අතර, එමගින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගීතාවයක් ඇති වේ. තොරතුරු සාමූහිකව පරිහරණය කිරීම තුලින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබාදීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගි කරගෙන එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි වන අයුරු උපාය මාර්ග හා විධිවිධාන සැලසීම මගින් දිනපතා සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු සමුදාය හරහා සිදුවේ.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම ද සිදුවේ. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ, ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක, සංඛ්‍යාලේඛණඥ, පුස්තකාලයාධිපති, සහකාර අධ්‍යක්‍ෂක, තොරතුරු තාක්ෂණ නිලධාරි, සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු, පරිගණක චිත්‍රක ශිල්පී, පරිගණක දෘඩාංග ශිල්පී හා කාර්යාල කාර්යය සහයක ඇතුළු සහකාර කාර්යය මණ්ඩලයකින් 2015 වසරේදී සමන්විත විය. තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ.

- ඉල්ලුම අනුව ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මග (TVET Guide) ප්‍රකාශයට පත්කිරීම හා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- UNEVOC ප්‍රදේශීය මධ්‍යස්ථානය පවත්වගෙනයාම සහ එහි කාර්යයන් සහ වැඩසටහන් දිගටම ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය හා වෙබ් පිටුව සංවර්ධනය කර පවත්වාගෙන යාම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම.
- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන්ගේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධති නිර්මාණය කිරීම සහ පවත්වාගෙම යෑම.
- කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියා පදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග සකස් කිරීම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම.
- අප ආයතනය යටතේ ක්‍රියාත්මක වන සේවාවන් පිළිබඳව තොරතුරු මහජනතාව සඳහා ලබා දීමට අවශ්‍ය වන වෙබ් අඩවි නිර්මාණය කිරීම, පවත්වාගෙන යෑම සහ එම වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා අනෙකුත් ලියාපදිංචි පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දීම හා එම දත්ත කළමනාකරණය.
- SSDP වැඩසටහන යටතේ නිර්මාණය වන කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා සම්බන්ධවී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සෑම අංශයකටම අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීමේදී ඇති වන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් ලබා දීම. හා අවශ්‍ය තාක්‍ෂණික උපදෙස් ලබාදීම.
- ආයතනය තුල පරිගණක ජාලගත කිරීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල පහසුකම් ලබා දීම, මේ සඳහා අවශ්‍ය Servers නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම හා ඒවයේ දෘඩාංග හා මෘදුකාංග යාවත්කාලීන කිරීම.
- කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම.

- අවශ්‍ය වූ විට අදාල පරිදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම, යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ.

මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ පද්ධතිය, සැලසුම් සහ පර්යේෂණ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතීතනය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි 2015 වර්ෂය තුලදී මෙම අංශය මගින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටුකිරීමට සමත් වී ඇත.

## 8.1 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මගින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන, පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මගින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC website:www.tvec.gov.lk/lmi) මගින් ලබාගත හැක.

## 8.2 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙල කිරීම හා ප්‍රකාශ කිරීම

2015 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකිවිය. මෙම ප්‍රකාශන මගින් 2014 වසරේ අග භාගයේදී සහ 2015 වර්ෂයේ මුල් භාගය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ. ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය පහත සඳහන් පරිදි කොටස් 5 කින් යුක්ත වේ.

1. රැකියා සඳහා ඇති ඉල්ලුම
2. සේවානියුක්තිය
3. සේවාවියුක්තිය
4. ශ්‍රම වෙළෙඳපොළ සැපයීම හෙවත් විවිධ රැකියාවලට ඇති ශ්‍රම සැපයුම
5. ශ්‍රම වෙළෙඳපොළ සඳහා ඇති ඉල්ලුම සහ පර්යේෂණ තොරතුරු

2015 වසර තුල දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති අංශය ක්‍රියාකර ඇත.
ඒ අනුව, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු, ශ්‍රම වෙළෙඳපොළ ගමන්මග පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වන ආකාරයට මෙම ප්‍රකාශනය තුලින් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන් හී ඇති රැකියා අවස්ථා, රැකියාගත වීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.

2006 සිට 2015 වර්ෂය පළමු භාගය දක්වා එක් එක් වර්ෂයන්හි සිළුමිණ හා “Sunday Observer” පුවත්පත් සහ රජයේ Gazette මගින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 8.1 වගුවේ දැක්වේ.

| උත්සව අත්තිකාරම් | 11,550 | 63,800 | 56,300 |
| විශේෂ අත්තිකාරම් | 7,522 | 7,900 | 5,000 |
| | 7,171,506 | 7,163,067 | 6,723,370 |
| 17.1 කාර්ය මණ්ඩල හා අනිකුත් අත්තිකාරම් | | | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් | 481,287 | 520,180 | 293,808 |
| අනිකුත් අත්තිකාරම් | - | - | - |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරමේ ආයතනය | - | - | 1,000,000 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | - | - | 1,000,000 |
| ජාතික තරුණ සේවා සභාව | - | - | 1,000,000 |
| | 481,287 | 520,180 | 3,293,808 |

| | | | |
|---|---|---|---|
| 17.2 පිටස්තර පාර්ශවයන්ගෙන් අයවිය යුතු | | | |
| අනිකුත් | - | 5,041 | 4,995 |
| යෞවන කටයුතු අමාත්‍යංශය | 1,156,104 | 1,123,118 | - |
| නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය | 1,524,665 | 723,744 | - |
| | 2,680,769 | 1,851,903 | 4,995 |
| 17.3 කලින් ගෙවීම් | | | |
| කලින් ගෙවීම් - මාර්ගස්ථ මුදල් රක්ෂණය | 11,169 | 11,232 | 11,230 |
| සේවා ගිවිසුම් | - | 34,986 | - |
| | 11,169 | 46,218 | 11,230 |
| 17.4 ලැබිය යුතු ජාතික වෘත්තීය සුදුසුකම් සහතික මුද්‍රණ ගාස්තු | | | |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 210,983 | 210,983 | 214,187 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 38,180 | 38,180 | 19,840 |
| ජාතික තරුණ සේවා සභාව | 16,800 | 16,800 | 16,800 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 159,639 | 159,639 | 135,055 |
| ජර්මානු කාර්මික අධ්‍යාපන ආයතනය | 74,750 | 74,750 | 74,750 |
| | 500,352 | 500,352 | 460,632 |
| 22.1 මෙහෙයුම් ණය හිමියෝ | | | |
| මෙහෙයුම් ණය හිමියෝ | 1,683,702 | 2,798,721 | 4,814,041 |
| සේවක | - | 241,925 | 151,603 |
| අනිකුත් | - | 34,149 | 629,166 |
| | 1,683,702 | 3,074,795 | 5,594,810 |
| 23.1 මහා භාණ්ඩාගාරයට නැවත ගෙවීම් | | | |
| රාජ්‍ය භාග ගෙවීම් | 151,566 | 167,366 | 43,345 |
| වැටුප් රහිත අයකරගැනීම් | - | - | 12,546 |
| | 151,566 | 167,366 | 55,891 |
| 23.2 ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීම් | | | |
| රඳවා ගැනීම් බදු | 50,900 | 14,100 | 1,300 |
| මුද්දර බදු | 9,000 | 8,310 | 5,545 |
| වැටුප් මත බදු | 69,351 | - | - |
| | 129,251 | 22,410 | 6,845 |
| 23.3 ගෙවිය යුතු ව්‍යාපෘති ප්‍රදාන | | | |
| රුහුණු ආර්ථික සංවර්ධන අධිකාරිය | 48,923 | 48,923 | 48,923 |
| ජාත්‍යන්තර කම්කරු සංවිධානය | 3,103,402 | 3,266,202 | 3,196,076 |
| කෙටිකාලීන වැඩසටහන් | 471,531 | 438,015 | 520,813 |
| කාර්මික අධ්‍යාපන පුහුණු ව්‍යාපෘතිය | 3,492 | 3,492 | 3,492 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | - | - | 14,550 |
| යෞවන කටයුතු අමාත්‍යංශය | 42,107 | - | 2,536,625 |
| | 3,669,455 | 3,756,632 | 6,320,479 |
| ගෙවිය යුතු පුද්ගලික පඩිනඩි | | | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 7,229 | - | - |
| සේවක භාරකාර අරමුදල | - | - | 129,100 |
| සේවක අර්ථසාධක අරමුදල | - | - | 335,881 |
| | - | - | 464,981 |

| වැය විෂය | ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම | | | | |
| ලීබඩු හා සවිකිරීම් | 117 | 196 | 110 | 56 |
| පිරියත හා උපකරණ | 3,053 | 934 | 839 | 90 |
| පුස්තකාල පොත් | 50 | 50 | 50 | 100 |
| | 350 | - | - | - |
| | 3,570 | 1,180 | 999 | - |
| පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | | | | |
| ගොඩනැගිලි පුනරුත්තාපන වියදම් | - | 302 | 303 | 100 |
| යන්ත්‍ර පුනරුත්තාපන වියදම් | 1,400 | 386 | 385 | 100 |
| වාහන පුනරුත්තාපන වියදම් | 800 | 556 | 556 | 100 |
| | 2,200 | 1,244 | 1,244 | - |
| ප්‍රාග්ධන වියදම් - සංවර්ධන | | | | |
| රාජ්‍ය අංශය සඳහා මූල්‍ය ප්‍රදාන | 1,305 | 1,324 | 1,510 | 1,510 |
| ජාතික වෘත්තීය සුදුසුකම් | 1,000 | 1,367 | 1,358 | 99 |
| පුද්ගලික අංශය සඳහා මූල්‍ය ප්‍රදාන | 2,000 | 840 | 796 | 95 |
| පර්යේෂණ වියදම් | 1,200 | 500 | 493 | 99 |
| පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන | 395 | 600 | 1,171 | 195 |
| පලාත් වෘත්තීය අධ. පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම | 2,850 | 295 | 290 | 98 |
| ක්ෂේත්‍ර වෘත්තීය අධ. පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම | 1,480 | 2,650 | 2,051 | 77 |
| | 10,230 | 7,576 | 7,669 | - |
| මුලු ප්‍රාග්ධන වියදම් | 16,000 | 10,000 | 9,912 | 99 |
| පුනරාවර්තන වියදම් | | | | |
| පුද්ගලික පාරිශ්‍රමික | | | | |
| වැටුප් හා වේතන | 30,152 | 40,027 | 39,245 | - |
| සේවක අර්ථසාධක අරමුදල | 3,600 | 4,859 | 4,849 | - |
| සේවක භාරකාර අරමුදල | 900 | 1,216 | 1,212 | - |
| සභාපති දීමනා | 200 | 450 | 428 | 100 |
| පුහුණු දීමනා | 1,750 | 1,764 | 1,753 | 99 |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 800 | 947 | 893 | 94 |
| | 37,402 | 49,263 | 48,380 | 98 |
| ගමන් වියදම් | | | | |
| දේශීය | 350 | 358 | 321 | 90 |
| විදේශීය | 717 | 1,142 | 1,368 | 120 |
| | 1,067 | 1,500 | 1,689 | 113 |
| සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,921 | 3,897 | 3,530 | 91 |
| ඉන්ධන | 3,060 | 1,803 | 1,720 | 95 |
| ප්‍රවාහන වියදම් | 6 | 13 | 12 | 92 |
| නිළ ඇඳුම් | 88 | 90 | 90 | 100 |
| පුවත්පත් | 150 | 92 | 94 | 102 |
| අනිකුත් සේවා ගාස්තු | 220 | 300 | 287 | 96 |

| | | | | |
|---|---|---|---|---|
| සංග්‍රහ වියදම් | 200 | 244 | 262 | 107 |
| | 7,645 | 6,439 | 5,995 | |
| නඩත්තු වියදම් | | | | |
| වාහන නඩත්තු වියදම් | 3,050 | 3,150 | 3,218 | 102 |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම් | 200 | 160 | 180 | 113 |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 510 | 230 | 175 | 76 |
| පරිගණක සේවා | 300 | 173 | 106 | 61 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | 50 | 320 | 284 | 89 |
| නඩත්තු වියදම් | 220 | 70 | 51 | 73 |
| | 4,330 | 4,103 | 4,014 | 98 |
| 12. ගිවිසුම් ගත සේවා | | | | |
| දුරකථන ගාස්තු | 1,800 | 1,850 | 1,891 | 102 |
| තැපැල් වියදම් | 189 | 350 | 356 | 102 |
| විදුලි වියදම් | 3,368 | 3,000 | 2,816 | 94 |
| ජල ගාස්තු | 206 | 181 | 182 | 101 |
| වරිපනම් | 131 | 131 | 131 | 100 |
| ආරක්ෂක සේවා | 1,196 | 1,236 | 1,232 | 100 |
| පවිත්‍රතා සේවා | 1,130 | 1,330 | 1,329 | 100 |
| විගණන ගාස්තු | 225 | 250 | 250 | 100 |
| නීති ගාස්තු | 50 | 75 | 75 | 100 |
| වාර සඟරා හා සාමාජික ගාස්තු | 100 | 45 | 45 | 100 |
| කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 900 | 1,074 | 937 | 87 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 9,295 | 17 | 14 | 82 |
| සේවා ගිවිසුම් | | 709 | 718 | 101 |
| සේවක සුභ සාධනය | | 130 | 115 | 88 |
| | | 10,378 | 10,091 | |

| වැය විෂය | ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම් | | | | |
| | 791 | | | |
| ඇගයම් හා ලියාපදිංචිය | 1,413 | 862 | 863 | 100 |
| ප්‍රතීතන වැඩසටහන | 2,856 | 1,655 | 1,655 | 99 |
| ජාතික වෘත්තීය සුදුසුකම | 30 | 15,451 | 15,266 | 99 |
| ශ්‍රම වෙළඳපොල ප්‍රකාශය මුද්‍රණය | 496 | 1,600 | 1,351 | 84 |
| මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම | | 200 | 134 | 67 |
| පරිවර්ථන ගාස්තු | | 352 | 158 | 45 |
| පාලක මණ්ඩල හා කළමණාකරන කමිටු දීමනා | | 800 | 548 | 69 |
| ශිෂ්‍ය වාර්ථා පොත් විකිණීම | | 1,397 | 1,378 | 99 |
| | | 22,317 | 21,353 | |
| මුලු පුනරාවර්තන වියදම | | 94,000 | 91,522 | |

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම - 2015

## පුනරාවර්තන වියදම්

| | |
|---|---|
| පෞද්ගලික පඩි නඩි | 48,378,802 |
| ගමන් වියදම් | 1,689,008 |
| සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | 6,111,189 |
| නඩත්තු වියදම් | 4,013,015 |
| ගිවිසුම් ගත සේවා | 9,975,448 |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා | 547,500 |
| මෙහෙයුම් වියදම් | 19,429,242 |
| පොත් මුද්‍රණ වියදම් | 1,378,669 |
| එකතුව (රු.) | 91,522,873 |




## ප්‍රාග්ධන වියදම්

| | |
|---|---|
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 999,690 |
| පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය හා පර්යේෂණ | 2,833,530 |
| පුනරුත්තාපන වියදම් | 1,243,542 |
| රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ප්‍රදාන සහ ජාතික වෘත්තීය සුදුසුකම් වියදම | 4,835,664 |
| එකතුව (රු.) | 9,912,426 |



## තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
## මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම - 2015

### රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන(ප්‍රාග්ධන) | 16,988,909 | 1,446,652 | 2,252,249 | 1,663,240 | 1,509,929 |
| පෞද්ගලික ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන (ප්‍රාග්ධන) | 4,886,224 | 2,196,298 | 2,701,650 | 1,521,044 | 795,973 |
| පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන | 1,990,345 | 798,515 | 661,995 | 1,152,875 | 1,171,655 |
| එකතුව (රු.) | 23,865,478 | 4,441,465 | 5,615,894 | 4,337,159 | 3,477,557 |




### අයවැය ඇස්තමේන්තු මහා භාණ්ඩාගාර ප්‍රදාන

| | 2012 | | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය |
| පුනරාවර්තන ප්‍රදාන | 55,073,712 | 54,761,014 | 60,957,000 | 59,621,381 | 80,437,000 | 77,891,733 | 94,000,000 | 91,522,873 |
| ප්‍රග්ධන ප්‍රදාන | 12,239,500 | 10,819,565 | 15,000,000 | 13,715,516 | 16,000,000 | 15,114,748 | 10,000,000 | 9,912,426 |
| මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම් | | 224,617 | | 401,908 | | 47,325 | | |
| එකතුව | 67,313,212 | 65,805,196 | 75,957,000 | 73,738,805 | 96,437,000 | 93,053,806 | 104,000,000 | 101,435,299 |






විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊටීවයි/ඊ/ටීවීඊසී/1/15/52 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதි / Date } 2016 නොවැම්බර් 15 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

පිටපත් : 1. ලේකම් - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

145

මගේ අංකය / எனது இல. / My No. } විවිඑයි/ඊ/ටීවීඊසී/1/15/52 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 15 දින

අධ්‍යක්ෂ ජනරාල්

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ) (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2 මූල්‍ය ප්‍රකාශන

----------------

2.1. මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා

මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ස්ථාවර වත්කම් ක්ෂය රු. 94,921 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පුහුණු සැලැස්මක් සකස් කිරීම සඳහා වූ රු. 793,000 ක ගිවිසුම්ගත බැඳීමක් ශේෂපත්‍ර දිනෙන් පසුව අවලංගු වී තිබුණද ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජාතික නිපුණතා සම්මත ඇතුළත් සංයුක්ත තැටි 1877 ක් සහ කාර්යාලීය ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගත යුතු රු. 1,123,118 ක් 2016 මැයි 05 දින දක්වාම ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) 2006 හා 2010 වර්ෂවලදී සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයන් තුන්දෙනෙකුගෙන් අයවිය යුතු රු. 165,183 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,947,804 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දී රු. 2,250,877 ක අතිරික්තයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,198,681 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු. 6,112,401 කින් වැඩි වී තිබුණ ද, වර්ෂයේ සේවක පිරිවැය රු. 9,937,250 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂ 5 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2015 වර්ෂවල දී ඌනතාවයක් වූ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ඉතිරි වර්ෂවල අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. 30,198,474 ක් හා රු. 41,989,597 ක් විය. එය 2013 වර්ෂයේදී රු. 39,198,869 ක් දක්වා අඩු වුවද නැවත 2014 වර්ෂයේ දී රු. 51,064,746 ක් හා සමාලෝචිත වර්ෂය වන විට රු. 58,555,774 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

---------------

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය, ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම හා පුහුණු සම්මතයන් පවත්වාගෙන යාම ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) (i) රාජ්‍ය හා පෞද්ගලික ආයතන 500 ක් අලුතින් ලියාපදිංචි කිරීම සඳහා හා ආයතන 400 ක් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඇගයීමට ඉලක්ක කලද, පිළිවෙලින් ආයතන 297 ක් හා ආයතන 343 ක් පමණක් ඇගයීමට ලක්කර තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 24 ක අඩුවීමකි.

(ii) රාජ්‍ය අංශයේ පාඨමාලා 503 ක් හා පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල පාඨමාලා 108 ක් ජාතික පුහුණු මට්ටම් සඳහා ප්‍රතීතනයට ඇගයීමට ලක් කර තිබුණද, පිළිවෙලින් පාඨමාලා 339 ක් හා 53 ක් පමණක් ප්‍රතීතනය කර තිබූ අතර එම සංවිධානවල පාඨමාලා 259 ක් ප්‍රතීතනය අළුත් කිරීම සඳහා ඇගයීම් කර තිබුණ ද පාඨමාලා 177 ක් පමණක් අළුත් කර තිබුණි.

(ආ) ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව වෘත්තීය පුහුණුව සම්බන්ධ පාඨමාලා 9522 ක් පැවැත්වෙන බවත් එයින් සමාලෝචිත වර්ෂයේදී ජාතික පුහුණු මට්ටම සඳහා ප්‍රතීතනය වී තිබූ පාඨමාලා සංඛ්‍යාව 2323 ක් එනම් සියයට 24 ක් බවත් හෙළිදරව් කරගෙන තිබුණි. පනත අනුව සියලු පාඨමාලා ජාතික වෘත්තීය මට්ටම් යටතේ පවත්වාගෙන යාම ආයතනයේ වගකීම වුවද ඉහත පාඨමාලා ලියාපදිංචි කර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙළක් ආයතනය සතුව නොතිබුණි.

(ඇ) ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටම සඳහා සහතිකපත් 60 ක් නිකුත් කිරීමට ඉලක්ක කළද සහතික 09 ක් පමණක් නිකුත් කර තිබූ අතර ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම සඳහා නිකුත් කර තිබුනේ සහතික 1471 ක් පමණ අඩු සංඛ්‍යාවකි. මේ අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටමවල සුදුස්සන් බිහිවීම අඩු මට්ටමක පවත්නා බව නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශවල වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර සැපයීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබූ නමුත් ඒ සඳහා ආයතන තෝරා ගැනීම සඳහා පිළිගත හැකි නිර්ණායක තීරණය කර නොතිබුණි. තවද වර්ෂය තුළ දී මුල්‍යාධාර ලෙස රු. 2,569,912 ක් ප්‍රදානය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාඨමාලා 13 ක් ප්‍රතීතනය කරගෙන නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර, මුල් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ වෘත්තීය පුහුණු සැලැස්ම යාවත්කාලීන කිරීම, වාර්ෂික සමීක්ෂණ 6 ක් සිදුකර කෙටුම්පත් වාර්තා ලබා ගැනීම, පරිගණක මෘදුකාංග මිලදී ගැනීම, භූගෝලීය තොරතුරු පද්ධතිය පුළුල් කිරීම යන කාර්යයන් ඉටුනොකර ඊළඟ වර්ෂයට කල්දමා තිබුණද ඒ සඳහා වූ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

140

(ඊ) වර්ෂය තුළ දී පර්යේෂණ 06 ක් සම්පූර්ණ කිරීම සඳහා රු. 500,000 ප්‍රතිපාදනය කර තිබුණද එක් පර්යේෂණයක් හෝ සම්පූර්ණ කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28.51 ක් වෙන් කර දී තිබූ අතර වර්ෂය තුළදී රු. මිලියන 27.5 ක් වැයකර තිබුණද ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වූ පහත කාර්යයන් ඉටුකර නොතිබුණ බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලාංකිකයන් රැකියාගත කර ඇති විදේශ ආයතන 10 ක බලධාරීන් සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ජාත්‍යන්තර තත්ත්වය හා සමාන බව තහවුරු කර ගැනීම, වෘත්තීය ආයතනවලින් පිටවන උපාධිධාරීන් සඳහා විදේශ රැකියා ගිවිසුම්වලට එළඹීම, ඇගයීම් ක්‍රියාවලියට අදාල ප්‍රමිත සමාලෝචනය හා එම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ ප්‍රමිතින් උසස් කිරීම සඳහා පාසල් ගුරුවරුන් පුහුණු කර ලියාපදිංචි කර ගැනීම හා ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 මට්ටමේ ඇගයීම්කරුවන් බඳවා ගැනීම.

(ii) කොමිෂන් සභාව විසින් හඳුනාගත් නව ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා සිසුන් 10,000 ක් බඳවා ගත හැකි පරිදි පාඨමාලා ආකෘති වැඩිදියුණු කිරීම, සිසුන් සඳහා කාර්යසාධනය පදනම් කරගත් ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දීම, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5,6 සහ 7 සඳහා රජයේ බඳවා ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව ප්‍රතිපත්ති හා මූල්‍යන වැඩපිළිවෙළක් සකස් කිරීම, වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා ලිංග ප්‍රතිපත්තියක් (Gender policy) සකස් කිරීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා වෘත්තීයමය ප්‍රවර්ධන වැඩපිළිවෙලක් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කිරීමට කැළණිය විශ්වවිද්‍යාලයට රු.199,000 ක් 2013 වර්ෂයේදී ගෙවා තිබුණි. ගිවිසුම අනුව එම සැලැස්ම 2014 මැයි 05 දින අවසන් කළ යුතු වුවත්, එසේ සිදු නොකිරීම නිසා 2016 ජනවාරි 13 දින කොමිෂන් සභාව විසින් ගිවිසුම අවසන් කර තිබුණු අතර

විශ්වවිද්‍යාලය විසින් අවසන් නොකළ වාර්තාවක් ආයතනයට ලබා දී තිබුණි. පුහුණු සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි ක්‍රියාමාර්ග 2016 මැයි 05 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය පිණිස නිපුණතා පාදක ඇගයීම් කටයුතු සඳහා ඇගයීම්කරුවන් පත්කිරීම 2013 වර්ෂයේ සිට මෙම ආයතනය වෙත පැවරී තිබූ නමුත් 2015 වර්ෂය අවසානය දක්වාම ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රමාණවත් පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා බඳවාගෙන තිබූ මුළු ඇගයීම්කරුවන් සංඛ්‍යාව 1945 ක් වූවද, එම ඇගයීම්කරුවන් ක්‍රියාකාරී සේවයේ යෙදෙන බවට තහවුරු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාව විසින් පාඨමාලා 2945 ක් ඇගයීම සඳහා ඇගයීම්කරුවන් පත්කර තිබුණද එය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පාඨමාලා 3188 ක් ඇගයීම් සඳහා ආයතන විසින් තෝරාගත් ඇගයීම්කරුවන්ට සභාවේ අනුමැතිය ලබා දී තිබුණි. මේ නිසා එම ඇගයීම්වල ස්වාධීනතාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(iii) ඇගයීම්කරුවන් පත් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුළත ඇගයීම සිදු කළ යුතු වුවද ඒ සඳහා මාස 03 සිට 08 දක්වා කාලයක් ද, ඇගයීම් කිරීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා මාස 05 සිට මාස 20 දක්වා කාලයක් ද ගතකර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂ කිහිපයක පර්යේෂණ ප්‍රතිඵල ආයතනයේ සංවර්ධනය සඳහා යොදාගැනීම අඩු මට්ටමක පැවති අතර ඒ පිළිබඳ පසු විපරම් කර නොතිබුණි. 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු. 546,930 ක් හා රු. 493,000 ක් වැයකර සකස් කර තිබූ පර්යේෂණ වාර්තා 09 ක කරුණු විගණිත දිනය වූ 2016 අප්‍රේල් 25 දින දක්වාම එළි දක්වා නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.3.1 හා 4.4 වගන්ති අනුව සම්පූර්ණ කළ යුතු අනිවාර්ය සේවා කාලය වයස අවුරුදු 55 එළැඹීමට ප්‍රථම වසර 10 ක් සම්පූර්ණ විය යුතු වුවත් එයට පටහැනිව අවුරුදු 48 ක් වූ නිලධාරියෙකු චීනයේ වුහාන් විශ්ව විද්‍යාලයේ වර්ෂ 3 ක ප්‍රතිපත්ති විශ්ලේෂණ පාඨමාලාවක් සඳහා තෝරාගෙන සම්පූර්ණ පඩි සහිත අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. එම පාඨමාලාවේ මුළු පිරිවැය රු.8,048,160 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පාඨමාලා ගාස්තු වෙනුවෙන් රු. 2,038,826 ක් වැයකර තිබුණු අතර අයදුම්කරු විසින්ම තෝරාගෙන තිබූ මෙම පාඨමාලාවේ අදාලත්වය හා පිරිවැයට ප්‍රමාණවත් වූ ප්‍රතිලාභ ආයතනයට හා රටට ලැබේදැයි යන්න පිළිබඳව පිළිගත හැකි, සාධාරණ ඇගයීමක් සිදුකර නොතිබුණි.

## 4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

කර්මාන්ත 04 ක් සඳහා ඉල්ලුම හා සැපයුම සම්බන්ධයෙන් පවතින පරතරය පිළිබඳව සමීක්ෂණය (Survey on Industries Demand Gap) 2014 නොවැම්බර් 08 දින නිමකළ යුතු වුවද විගණිත දිනය වූ 2016 මැයි 05 දින දක්වාම නිමකර නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 26 ක් වූ අතර ඉන් 21 ක් විධායක ශ්‍රේණියේ විය. සේවයේ නියුතු විධායක ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙක් ශිෂ්‍යත්ව මත අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී තිබුණි. මෙම පුරප්පාඩු නොපිරවීම නිසා ඇගයීම්කරුවන් පත්කිරීම, ආයතන සහ

පාඨමාලා ජාතික වෘත්තීය පුහුණු මට්ටම (NVQ) සඳහා ලියාපදිංචි කිරීම හා ප්‍රතීතනය කිරීමට ඇගයීම් කිරීම ආදී ආයතනික කාර්යයන්හි කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අධ්‍යක්ෂ තනතුර සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා වර්ෂ 06 කට අධික කාලයක් වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි. තවද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ද්විතීක පදනම මත නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය වෙත මුදාහැර තිබූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ද වැඩ බැලීමේ පත්වීමක් සිදුකර තිබුණි. වැඩ බැලීමේ පත්වීම් මාස 03 කට අධික කාලයකට සිදුකළ නොහැකි වුවද ඊට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 5 දෙනෙකුගෙන් යුතු වූ නමුත් එයින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 03ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. තවද නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති වියදම් විගණනය කර නොතිබුණි.

## 5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 43 සිට සියයට 100 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2016.11.28 TVEC/E2/AUDIT QUERY

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඔබගේ අංක VTY/E/TVEC/1/15/52 සහ 2015.05.17 දිනැති උක්ත විගණන වාර්තාව සඳහා පිළිතුරු හා පැහැදිලි කිරීම් මේ සමග ඉදිරිපත් කරන අතර එම කරුණු සලකාබලා ප්‍රසිද්ධ කරන විගණන වාර්තාවෙන් ඉවත්කර අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි

මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) ස්ථාවර වත්කම් අඩුවෙන් ක්ෂය වීම නිවැරදි කිරීමට පියවර ගනිමි.

(ආ) මෙය පර්යේෂණයක් සඳහා නොව බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම සෑදීම සඳහා කැළණිය විශ්ව විද්‍යාලය වෙත ගෙවිය යුතුව තිබූ මුදල වේ. මෙම ගිවිසුම අවසන් කිරීමෙන් පසු කැළණිය විශ්ව විද්‍යාලය විසින් එක්රැස් කළ දත්ත උපයෝගී කරගෙන වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා වැ.බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය ලබා ගෙන තිබුණි.

ඒ අනුව අප ආයතනයේ කාර්යමණ්ඩලය විසින් සෙසු වාර්තාව සම්පූර්ණ කිරීමට නියමිත බැවින් එම මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනිමි.

(ඇ) ජාතික නිපුණතා සම්මත, ලිපි ද්‍රව්‍ය හා ජාතික නිපුණතා සහතික වල පිරිවැය ඉදිරි වර්ෂයේ සිට ගිණුම්වලට ඇතුළත් කිරීමට පියවර ගනිමි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මේ පිළිබඳ රේඛීය අමාත්‍යාංශය මඟින් වාර්තාවක් ඉල්ලුම් කර ඇත. අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුදල අය කර ගත හැකිය.

(ආ) අදාළ සේවකයින් විටින් විට කොටස් වශයෙන් මුදල් තැන්පත් කරන අතර තනතුරෙන් පහකරන ලද සේවකයාගේ අයවිය යුතු මුදල ඔහුගේ නඩු කටයුතු අවසන් වී ඇති බැවින් ඉදිරියේදී ඔහුගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. කෙසේ වෙතත් අනිකුත් ණයකරුවන්ගේ ණය මුදල් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස මුදල් අංශයට දැනුම් දෙන ලදී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ)

(i) රාජ්‍ය හා පෞද්ගලික ආයතන 500ක් ලියාපදිංචි ඇගයීම් සඳහා ඉලක්ක කළද අයදුම්පත්‍ර ලැබී තිබුනේ 297 ක සංඛ්‍යාවකි.

ඒ අනුව ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබීම ඉලක්ක ගත කරන ලද ඇගයීම් සංඛ්‍යාවක් නොකිරීමට හේතු වී ඇත.

එම අයදුම්පත්‍ර සංඛ්‍යාවෙන් ලියාපදිංචි කිරීමේ නිර්ණායක සපුරා තිබුනේ ආයතන 152කි. ලියාපදිංචි කිරීමේ නිර්ණායක පහත දක්වා ඇත.

1. ප්‍රමාණවත් පුහුණු උපකරණ, පුහුණු කිරීම් සඳහා උචිත පරිසරය, සෞඛ්‍ය ආරක්ෂිත බව ආරක්ෂාව යනාදිය
2. විෂය මාලාවේ පිළිගත හැකි බව
3. පාඨමාලා පුහුණු සැලසුම් හා ඇගයීමේ ක්‍රමවේදයන්
4. උපදේශක වෘත්තීය සුදුසුකම්

රාජ්‍ය හා පෞද්ගලික ආයතන ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ආයතන 400ක් ඉලක්ක කල අතර ඒ සඳහා අයදුම්පත්‍ර 343ක් ලැබී තිබිණ. ඇගයීම් කරන ලද 343 සංඛ්‍යාවෙන් ලියාපදිංචිය අළුත් කිරීමේදී අදාළ ඉහත නිර්ණායක අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණේ ආයතන 297කි.

(ii) පාඨමාලා ප්‍රතීතනය අළුත් කිරීම සඳහා කරන ලද ඇගයීම් වලදී ප්‍රතීතන තත්වයන් පවත්වාගෙන නොයන ලද පාඨමාලාවන් හි ප්‍රතීතනය අළුත් නොකරන ලදී.

(ආ) පාඨමාලා ප්‍රතීතන අයදුම්පත්‍ර අනුව ප්‍රතීතන ඇගයීම් ඉටුකරනු ලබන නමුත් ඇගයීමේදී පුහුණු සම්මතයන් අනුව පාඨමාලා ප්‍රතීතන කිරීම සඳහා ප්‍රමාණවත් උපකරණ නොමැති වීම, නිපුණතා පාදක ක්‍රමවේදය අනුව පුහුණු පාඨමාලා සැලසුම් කර සහ ශිෂ්‍ය ඇගයීම් සිදු නොවීම යන සාධක මත ඇගයීම් කල සියළු පාඨමාලා ප්‍රතීතනය කල නොහැකි විය. රාජ්‍ය , පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා ක්‍රියාත්මක වුවද ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය මඟින් ප්‍රතීතනය කළ හැකි වනුයේ එහි පුහුණු පාඨමාලාවන්ට අදාළව පුහුණු සම්මතයන් සකස් වී ඇති පාඨමාලා සඳහා පමණි.

එමෙන්ම පාඨමාලා ප්‍රතීතනය සඳහා එකී ආයතනය මගින් අයදුම්පත්‍ර යොමුකළ යුතුව ඇත. අයදුම්පත්‍ර යොමු කළ පාඨමාලා ප්‍රතීතන ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය පියවර අප විසින් ගෙන ඇත.

(ඇ) කොමිෂන් සභාව NVQ මට්ටම් 6 සඳහා වූ වර්ෂාර්ධ සහ අවසාන ඇගයීම් සඳහා වූ අවශ්‍ය මැදිහත්වීම් වේලාවට නොපිරිහෙලා ඉටු කර ඇති අතර, ආරම්භක මට්ටමේ පවතින මෙම NVQ 6 මට්ටම සඳහා අපේක්ෂා කළ තරම් සිසුන් සංඛ්‍යාවක් ඇගයීම් සඳහා සහභාගී නොවීම නිසාත් සිසුන් 9ක් පමණක් සහතික ලබාගන්නා ලදී.

(ඈ) 2015 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන 06ක පාඨමාලා 06ක් සඳහා රුපියල් මිලියන 314ක මූල්‍යාධාර ප්‍රමාණයක් ලබාදී ඇත. නමුත් අප විසින් 2013 හා 2015 යන වර්ෂ දෙකේදී එකම පාඨමාලාව සඳහා මූල්‍යාධාර ලබාදී නොමැත.

විගණනය විසින් විමසුමට ලක් කරන ලද බල්ලපාන බහු තාක්ෂණික ආයතනයේ අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු (Industrial Sewing Machine operator) පාඨමාලාව සඳහා 2013 වර්ෂයේදී රුපියල් 406,640.00 ක මුදලක් මූල්‍යාධාර වශයෙන් ලබාදී ඇති අතර 2015 වර්ෂයේදී එම ආයතනයේම අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී (Industrial Sewing machine Mechanic) පාඨමාලාව සඳහා රුපියල් 94,930.00ක මුදලක් මූල්‍යාධාර වශයෙන් ලබාදී ඇත.

එබැවින් අපවිසින් එකම පාඨමාලාවක් සඳහා වර්ෂ දෙකකදී මූල්‍යාධාර ලබාදී නොමැත.

මේ වන විටත් ප්‍රතීතනය සිදුකරගෙන නොමැති පාඨමාලා ප්‍රතීතනය කිරීමට අවශ්‍ය උපදෙස් අප කොමිෂන් සභාව විසින් මේ වනවිටත් ලබාදී ඇති අතර අදාල නිර්ණායකයන් සම්පූර්ණ කරගැනීමෙන් පසු පාඨමාලා ප්‍රතීතනය සඳහා ඇගයීම් සිදුකිරීමට නියමිතය.

අදාල පාඨමාලා ප්‍රතීතනය කිරීමට අවශ්‍ය නිර්ණායකයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අප කොමිෂන් සභාව මඟින් ලබාදී ඇත. 2016 වර්ෂයේදී නැවත වතාවක් එම පාඨමාලා ප්‍රතීතනය සඳහා ඇගයීම් සිදුකිරීමට නියමිතය.

2015 වර්ෂයේදී පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතන 02කට රුපියල් 459,660.00ක මුදලක් මූල්‍යාධාර වශයෙන් ලබාදී ඇත.

රාජ්‍ය අංශයේ හා පීඩාවට පත්වූ තරුණ තරුණියන් වෙනුවෙන් පවත්වාගෙන යන පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර දෙන අවස්ථාවේදී එය අත්තිකාරමක් වශයෙන් සටහන් තබන අතර ඔවුන් විසින් අදාල උපකරණ මිලදීගෙන බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය වියදම් ගිණුමට මාරුකෙරේ.මේ අනුව 2014දී දෙනු ලැබූ අත්තිකාරම් පියවා ඇත්තේ 2015 වර්ෂය තුලදී බැවින් එය එම වසරේදී පියවීම් කටයුතු කිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගතවී ඇත.

2015/05/22 දින මෙම ආයතනය ප්‍රතීතනය සඳහා ඇගයීමට ලක්කරන ලදී නමුත් ප්‍රතීතන මට්ටම පැමිනීමට ප්‍රමාණවත් පුහුණු සැලසුම්, පාඩම් සැලසුම් සකස්කර නොතිබුණු බැවින් ඒවා සම්පූර්ණකිරීමට අවශ්‍ය උපදෙස් අපවිසින් ලබාදෙන ලදී. ඉදිරියේදී නැවත වතාවක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කිරීමට නියමිතය.

මෙම ආයතන වලට එරෙහිව ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2015 වසර තුලදි එක් වතාවක් සංශෝධනය කරන ලදී.එක් එක් අංශයන් විසින් අදාල අංශවල ක්‍රියාකාරකම් සහ ඊට අදාල වැය ශිර්ෂයන් අංශභාර අධ්‍යක්ෂවරුන්ගේ එකඟතාවය පරිදි වෙනස් කරන ලදී. එක් එක් අංශයට අදාල ක්‍රියාකාරකම් සහ වැය ශිර්ෂයන් වෙනස් කිරීමට අදාල හේතුන් 2015 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සමග අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගෙන ඇත. තවද මෙම සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම විගණන හා කළමණාකරන කමිටුව වෙතද ඉදිරිපත් කර එම කමිටුවේ අනුමැතියද ලබා ගෙන ඇත

(ඊ) 2015 ජුනි 24 ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 06ක් සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රුපියල් 468,000.00ක් වේ.එම පර්යේෂණ අධ්‍යයන 2016 මාර්තු මස අවසන්වීමට නියමිතව තිබුණි. මේ වන විට පර්යේෂණ අධ්‍යයන වාර්තා 02ක් අප වෙත ලැබී ඇත. ගිවිසුම් ප්‍රකාරව පර්යේෂණ අධ්‍යනයන් සඳහා මුදල් ලබා දෙනුයේ අදියර III යටතේය.

ඒ අනුව 2015 වර්ෂය අවසන් වන විට දත්ත රැස් කිරීම දක්වා පර්යේෂණ නිම කරන ලද පර්යේෂණ කණ්ඩායම් 02ක් සඳහා රුපියල් 76,000.00ක මුදලක් ලබා දී ඇත. අනෙකුත් පර්යේෂණ අධ්‍යනය සඳහා 2015 වර්ෂය තුල මුදල් ප්‍රතිපූරණය කර නොමැත. එබැවින් අප විසින් 2015 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 06ක් සඳහා රුපියල් 493,000.00 ක් ගෙවා නොමැත. නමුත් 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 08ක් සඳහා 2015 වර්ෂය දක්වා උපචිත කරන ලද මුදලින් රුපියල් 389,075.00 ක මුදලක් ගෙවා ඇත

(උ i) මේ සඳහා 2015 වර්ෂයේ රටවල් 11ක එම රටවල් ලෙස (මාලදිවයින,ඉතාලිය,කොරියාව (සියොල් නුවර),සිංගප්පූරුව,දෝහා, ඉරාකය , ඕමානය, ජෝර්දානය, බහරෙනය , කැනඩාව, ඊශ්‍රාලය ) ශ්‍රී ලංකා තානාපතිවරු හෝ එම ආයතනයන්හි ඉහළ නිලධාරීන් සමඟ NVQ සුදුසුකම් එම රටවල හඳුන්වාදීම සඳහා මූලික කටයුතු ඉටු කරමින් ඇත. 2016 වර්ෂයේදී මෙම නිලධාරීන් වෙනස් වීමත් සමඟ එම ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමට නියමිතය.

මෙම වැඩසටහන් නිපුණතා සංවර්ධන ආංශික ව්‍යාපෘතියේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළත් එම කාර්යයන් පිළිබඳව අවශ්‍ය ප්‍රමිතීන් සකස් කරගැනීමට කාලයක් ගතවූ බැවින් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි විය. ව්‍යාපෘතිය මඟින් අදාළ ප්‍රමිතීන් නිර්දේශ කරගත් පසු 2016,2017,2018 යන වර්ෂයන් තුළදී සංශෝධනයක් සහිතව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.එබැවින් මෙම කරුණු ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී සිදු වනු ඇත.

ii) මෙම වැඩසටහන් නිපුණතා සංවර්ධන ආංශික ව්‍යාපෘතියේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළත් එම කාර්යයන් පිළිබඳව අවශ්‍ය ප්‍රමිතීන් සකස් කරගැනීමට කාලයක් ගතවූ බැවින් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි විය. ව්‍යාපෘතිය මඟින් අදාළ ප්‍රමිතීන් නිර්දේශ කරගත් පසු 2016,2017,2018 යන වර්ෂයන් තුළ සංශෝධනයක් සහිතව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. එබැවින් මෙම කරුණු ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී සිදු වනු ඇත.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

බස්නාහිර පළාත සඳහා වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලැස්ම සකස් කිරීමේ ගිවිසුම අවසන් කිරීමෙන් පසු 2015.02.04 දිනැති ලිපියෙන් අප කොමිෂන් සභාව මගින් කැළණි විශ්ව විද්‍යාලය විසින් එක්රැස් කල දත්ත උපයෝගී කරගෙන වාර්ථාව සම්පූර්ණ කිරීම සඳහා වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය ලබා ගන්නා ලදී. මේ සඳහා සංඛ්‍යාඥයකුගේ සහාය අවශ්‍ය වේ. එබැවින් අප ආයතනයේ සංඛ්‍යානය පිළිබඳ දැනුම ඇති සංවර්ධන නිලධාරියකු හට එම දත්ත කාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා ලබාදී ඇත. ඔහු පරීක්ෂාවෙන් පසු වාර්ථාව සම්පූර්ණ කිරීම සඳහා අප ආයතනයේ කණ්ඩායමකට ලබාදීමට කටයුතු කරනු ලැබේ.

### 4.3මෙහෙයුම් ක්‍රියාකාරකම්

4.3 (අ)

i) වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන ඇගයීම්කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කරන අයහට අදාළ ලියාපදිංචි අංක නිකුත් කරන්නේත් ඔවුන්ගේ විස්තර ලබාගන්නෙත් එම අවස්ථාවේදී වේ. නමුත් ඉන් පසු කාලය තුල මෙම ඇගයීම්කරුවන් අතරින් සමහරක් මිය යාමටත් එමෙන්ම විදේශ රටවල පදිංචියට යාමත් සිදු වෙන නමුත් එම විස්තර අදාළ කාලයන් තුළදී අප කොමිෂන් සභාවට ලිඛිතව දන්වා එවීමට සමහර අය පියවර ගන්නේ නැත.

ඒ අනුව මෙම සංඛ්‍යාව නිවැරදි නොවීමට පුළුවන. මෙම තත්වය මගහරවා ගෙන කලින් කලට එම විස්තර යාවත්කාලීන කිරීමට කොමිෂන් සභාව උත්සාහ ගන්නා ලදී. ඒ අනුව 2016.01.06 දිනැති ලිපිය මගින් ඇගයීම්කරුවන් ගොනුකර දත්ත සමුදාය යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. ඒ සම්බන්ධව යවන ලද ලිපිය හා ආපසු ලැබූ ලිපියත් මේ සමග ඉදිරිපත් කරමි.

ii. 2015 වර්ෂයේදී කොමිෂන් සභාවෙන් ඇගයීම්කරුවන් පත්කරන ලෙස අයදුම් කළ සියළු ආයතන වෙත ප්‍රමාදයකින් තොරව ඇගයීම්කරුවන් පත්කරන ලදී. නමුත් වෘත්තීය පුහුණු අධිකාරියේ 2012 හා 2013 වර්ෂවල ප්‍රතීතනය නොවූ ආයතනවල සිටි ශිෂ්‍ය කණ්ඩායම් 2014 හා 2015 වර්ෂවලදී අදාළ ආයතනය හා පාඨමාලා ප්‍රතීතනය කර ගැනීමෙන් අනතුරුව එම ශිෂ්‍ය කණ්ඩායම් වලට ඇගයීම් පැවැත්වීම සඳහා එකවර වෘත්තීය පුහුණු අධිකාරිය මගින් ඉල්ලීම් සිදු කරන ලදී.

තවද යම් යම් හේතූන් නිසා ඇගයීම් සඳහා අයදුම් නොකළ සැලකිය යුතු ශිෂ්‍ය කණ්ඩායම් ප්‍රමාණයක් එකතු වී ඇත. එම එකතු වූ ශිෂ්‍ය කණ්ඩායම් සඳහා එකවර ඇගයීම්කරුවන් පත් කිරීමට නොහැකි වන නිසා එම ඇගයීම් ප්‍රමාද වීම හේතු විය.

මෙම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් වෘත්තීය පුහුණු අධිකාරිය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නිළධාරීන් අතර සිදු කරන ලද සාකච්ඡාවෙන් අනතුරුව අදාළ ඇගයීම් සිදු කිරීමට වෘත්තීය පුහුණු අධිකාරියේම අපගේ ලියාපදිංචි ඇගයීම්කරුවන් පත්කිරීමට ඉඩ දෙන ලදී.ඒ අනුව එම ඇගයීම් ප්‍රමාදය වළක්වා ගැනීමට පියවර ගන්නා ලදී. නැවතත් 2016 වර්ෂයේ සිට වෘත්තීය පුහුණු අධිකාරියේ ඇගයීම්කරුවන් සඳහාද කොමිෂන් සභාව ඇගයීම්කරුවන් සාමාන්‍ය පරිදි පත්කිරීම් සිදු කරනු ඇත.

iii) එහෙත් ඒ සෑම අවස්ථාවකම යථෝක්ත පත්කිරීම කොමිෂම මගින් නැවත අළුත් කරනු ලබයි එහිදී අදාල හේතූන්වල සාධාරණත්වය මත එසේ කරනු ලබයි.

(ආ) අප පර්යේෂණ වාර්තා මගින් ඉදිරිපත් කරනු ලබන නිගමනයන් හා යෝජනා උපයෝගී කරගෙන වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයට අදාල නව සැලසුම් කිරීම්, සම්බන්ධීකරණය හා සංවර්ධනයට අදාල ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. මෙලෙස ගෙන ඇති ඇතැම් ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ග මෙසේය.

NVQ Level5 හා 6 සම්බන්ධයෙන් 2012 වර්ෂයේ සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයන 02ක නිර්දේශයන් මත Level 5 හා 6 යන පාඨමාලා ආරම්භ කිරීමට පෙර සිසුන් හා පාඨමාලාවේ අන්තර්ගතය අතර පවතින හිඩැස පිරවීම (Gap Filling) ගණිත විෂය පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම ඉගැන්වීමට අවශ්‍ය Module සකස් කිරීමට පියවර ගැනීම.

2013 වර්ෂයේදී අප විසින් සිදු කරන ලද 2011 වර්ෂයේ රාජ්‍ය අංශයේ පාඨමාලා තුලින් පුහුණුව ලැබූ පුහුණුලාභීන් රැකියාගතවීමේ පසුවිපරම් අධ්‍යනය පදනම් කරගෙන ආසියානු සංවර්ධන බැංකුව, ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය ඒකාබද්ධ වෙමින් පුහුණුලාභීන් රැකියාගතවීම පිළිබඳ IVR Survey එකක් පැවැත්වීමට 2016 වර්ෂයේ ගිවිසුම් අත්සන් කරන ලදී. ඉදිරියේදී මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය සෑම අවුරුදු 03 ට වරක් තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව තෝරාගෙන ඇත.

එමෙන්ම 2011,2010 වර්ෂවල සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයන 02ක නිර්දේශයන් මත 2016 වර්ෂයේදී වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමග ඒකාබද්ධ වෙමින් වෘත්තිය මාර්ගෝපදේශන වැඩපිළිවෙල ශක්තිමත් කිරීම සඳහා දීපව්‍යාප්ත වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි.

2016 වර්ෂයේදි සංශෝධනය කරමින් පවතින NVQ මෙහෙයුම් අත්පොත අඩංගු එක් එක් අංශ සංශෝධනය සඳහා පර්යේෂණ වාර්තාවල අඩංගු නිර්දේශ හා යෝජනා සැලකිල්ලට ගන්නා ලදී

එමෙන්ම කරන ලද පර්යේෂණ අධ්‍යයන වාර්තා අපගේ වෙබ් අඩවිය තුල අන්තර්ගත වී ඇති නිසා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිය පුහුණු ආයතන නව ප්‍රතිපත්ති හා සැලසුම් ගැනීමට අපගේ පර්යේෂණ අධ්‍යනවල යෝජනා ඉවහල් කරගෙන ඇත.

නමුත් අප විසින් ඒ පිළිබඳ වාර්තාවන් පවත්වා ගැනිමක් මේ දක්වා සිදුනොකල නිසා වෘත්තිය හා කාර්මික පුහුණු ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සකස් කල ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ විස්තර ඔබ වෙත ඉදිරිපත් කල නොහැක. පර්යේෂණ වාර්ථා කිසිදු ආයතනයක් වෙත අපවිසින් ඉදිරිපත් කරනු නොලබන අතර 2013 වර්ෂයේ පර්යේෂණ වාර්ථාව අප විසින් වෙබ් අඩවිය තුල අන්තර්ගතකර ඇත. එමෙන්ම 2014 වර්ෂයේ සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයන වල තොරතුරු පර්යේෂණ මෙහෙයුම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කර ඇත. එම නිසා DTET,VTA,NAITA හා UNIVOTEC ආයතනවල පර්යේෂණ මෙහෙයුම් කමිටු නිලධාරීන් විසින් එහිදී ඉදිරිපත් කරන ලද කරුණු ඔවුන්ගේ ඉහළ කළමණාකාරීත්වයට දන්වා ඇත.

ලබා දිය හැකි මුදල උපරිම වශයෙන් නිර්ණය කරන ලද්දේ තෝරාගන්නා ලද පාඨමාලාවන්හි වටිනාකම කොටසක් නිලධාරීන්ට ගෙවිය නොහැකි බවත් එම පාඨමාලාව අත්‍යවශයෙන්ම හැදෑරීමේ අවශ්‍යතාවය මතය.

## 4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

මෙම නිළධාරීන්ගේ වයස අවුරුදු 60 වන විට වසර 9ක කාලයක් ආවරණය කර ගත හැකි බව ඒ පිළිබඳව ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳවත් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අතර කොමිෂන් සභාව විසින් වසර 9ක කාලය අනුමත කර ඇත. ඒ අනුව ඊට අනුකූලව ගිවිසුම් අත්සන් කරන ලදී.
තෝරා ගැනීමේදී විෂය ක්ෂේත්‍රයට අදාළ විෂයයන් වශයෙන් ලබා දී ඇත. ජේ.ඒ.ඩී.ජේ ජයලත් මහතාට තොරතුරු තාක්ෂණය පිළිබඳවත්, පී.පී.අජිත් කුසුම් මහතාට කාර්මික අධ්‍යාපනය පිළිබඳව ලබාදීම ක්ෂේත්‍රයට අදාළ ලෙස සැළකිය හැකිය.

## 4.5 ප්‍රමාද වූ ව්‍යපෘති

ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව සති දෙකකට පසු මෙම සමීක්ෂණයට අදාල මූලික දත්ත රැස්කිරීමේ ප්‍රශ්නාවලි සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර 04ක් ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නාවලි සකස් කල අතර, අමාත්‍යාංශ ව්‍යාපෘති අංශය මගින් එහි සියළු සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව 2014.11.20 වන දින අනුමැතිය ලබා දෙන ලදී. එහි සිදු වූ ප්‍රමාදය හේතුවෙන් දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද විය.

කෙසේ නමුදු ශ්‍රීන්ටෙක් මානව සම්පත් සංවර්ධන ආයතනය ප්‍රකාශකර සිටියේ පෞද්ගලික ආයතනයන්ගෙන් ප්‍රශ්නාවලියේ සඳහන්කර ඇති දත්ත ලබා දීම ප්‍රතික්ක්ෂේප කරන බවයි. එබැවින් දත්ත ලබා ගැනීම ප්‍රමාද සහ දුෂ්කර කටයුත්තක් බවත් වෙනත් විකල්ප ක්‍රමයක් යොදාගත යුතු බවටත් ඉල්ලීමක්ද කර තිබුණි.

මෙයට අමතරව පසුගිය දිනවල පැවති මැතිවරණ කටයුතු සහ අළුත් අවුරුදු වෙනුවෙන් නිවාඩු දිනයන් යෙදී තිබූ බැවින් විවිධ අපහසුතා මතුවූ බවත් එබැවින් දත්ත රැස්කිරීම ප්‍රමාද වූ බවත් දන්වන ලදී.

කෙසේ නමුදු 2015.02.01 වන දින මෙම සමීක්ෂණයේ කෙටුම්පත් වාර්ථාව (Draft Report) කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇත.

මෙම වාර්ථාවේ දත්ත නිවැරදිතාවය තහවුරුකිරීමේ කාර්යය ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ඇති කර්මාන්ත නිපුණතා මණ්ඩල (Industry Skills Council) වෙත අමාත්‍යාංශ තීරණය අනුව භාර දුන් අතර, මේවන විට ඉදිකිරීම්, තොරතුරු තාක්ෂණ හා විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රවල වාර්ථාවන් ගේ නිවැරදිභාවය තහවුරු කිරීමේ රැස්වීම් පවත්වා අවසන් කර ඇති හෝටල් ක්ෂේත්‍රය සඳහා දත්ත නිවැරදිතාවය තහවුරුකිරීමේ රැස්වීම මෙම වර්ෂයේ ජූනි මස පැවැත්වීමට නියමිතය.

## 4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

අ) මෙම තනතුරු වලින් අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන) සඳහා 2014.11.21 දින පුවත්පත් දැන්වීම් කැඳවා 2015.05.29 සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වූ අතර එහිදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වූයේ පුවත්පත් දැන්වීම් පලකර බඳවා ගන්නා ලෙසයි. ඒ අනුව 2016.01.01 පුවත්පත් දැන්වීම් පළකර 2016.05.24 දින සම්මුඛ පරීක්ෂණවක් පවත්වන ලදී. මේ වන විට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එක් අයදුම්කරුවෙකු නම් කර ඇති අතර ඉදිරියේදී ඇති කොමිෂන් සභා මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම තනතුරට පත් කිරීමට කටයුතු කර ඇති

සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා ඇබෑර්තු 19ක් තිබූ අතර එයින් 04ක් නව තනතුරු සඳහා මේ වන විට යටපත් කර ඉදිරි 15 දෙනා සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අවසන් කර ඇත. මෙම තනතුරු 2015 පැවති ජනාධිපතිවරණය හා මහ මැතිවරණය හේතුවෙන් බඳවා ගැනීමේ ප්‍රමාදයක් පවතී. ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කර ඇත.

පරිවර්තන තනතුර සඳහා අයදුම්පත් කැඳවුවද සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් ඉදිරිපත් නොවීම නිසා ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කර ඇත.

ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල තත්‍ය සංඛ්‍යාව 41 වන අතර දැනට පුරප්පාඩු වී ඇති සංඛ්‍යාව පහත පරිදි වේ.සංවර්ධන නිළධාරී තනතුරු 02ක් ඇති අතර එම තනතුරු 02 මේ වන විට යටපත් කර ඇත.

පරිගණක යෙදවුම් සහායක පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ කර ඇත.

පුස්තකාල සහකාර තනතුර බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන් නොමැති බැවින් එම තනතුර වෙනුවට කළමනාකරණ සහකාර තනතුරක් 2016.02.19 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන මේ වන විට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තෝරා ගෙන ඇති අතර ඉදිරි කොමිෂන් සභාවට ඉදිරිපත් කර බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) පත්කර ඇති අතර ඒ සඳහා ඔවුන්ට කිසිඳු දීමනවක් හෝ පහසුකමක් ලබා දී නොමැත.

## 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලය සඳහා මේ වන විට සංවර්ධන නිලධාරියෙකු හා සහකාර අධ්‍යක්ෂ නිළධාරියෙකු පත්කර ඇත

## 5.2 අයවැය පාලනය

තත්‍ය ආදායම හා අයවැයගත ආදායම ද තත්‍ය වියදම් හා අයවැයගත වියදම්ද අතර පවතින විචලතාවයන් අවම කර ගැනීමට කටයුතු කරමි.

මල්කාන්ති ජයවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්